# වාර්ෂික වාර්තාව

# *2012*

## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**අංක 117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල,**

**නුගේගොඩ.**

# පටුන


- වාර්තාව පිළිබඳව ගරු ලේකම්තුමා වෙත දැන්වීම- ———— 01
- ආයතනයේ දර්ශනය හා මෙහෙවර ප්‍රකාශය- ———— 02
- අධ්‍යක්ෂ මණ්ඩලය- ———— 03
- ආයතනයේ සංවිධාන ව්‍යුහය- ———— 04
- පෙරවදන- ———— 05

**2012 වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය**

- මෙහෙයුම් අංශය- ———— 08
- රක්ෂණ අංශය- ———— 13
  - ❖ කෘෂිකාර්මික රක්ෂණ කටයුතු සහ පශු සම්පත් රක්ෂණ කටයුතු
- ගොවි විශ්‍රාම වැටුප් අංශය- ———— 16
  - ❖ ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හා ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- පරිපාලන හා මානව සම්පත් අංශය- ———— 25
- අභ්‍යන්තර විගණන අංශය- ———— 30

**ගිණුම්**

- මුදල් අංශය ———— 33
- සමස්ත යෝජනා ක්‍රම සඳහා ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන- ———— 38
- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය- ———— 41
- ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- ———— 64
- ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- ———— 79

**විගණකාධිපති වාර්තා**

- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය- ———— 92
- ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- ———— 111
- ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- ———— 122

**විගණකාධිපති වාර්තා සඳහා පිළිතුරු**

- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය- ———— 131
- ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- ———— 145
- ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- ———— 150

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

විදුලි පණිවිඩ / தந்தி / Telegrams — රක්ෂණ / ரக்ஷன / Rakshana
117-සුභද්‍රාරාම පාර,ගංගොඩවිල,නුගේගොඩ
117-Subadrarama road,Gangodawila
Nugegoda

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No. 3/1/13
ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No.
දිනය / திகதி / Date 2014/04/24

ලේකම්,

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,

මහලේකම් කාර්යාලය,

කොළඹ 01.

ලේකම්තුමනි,

## වාර්ෂික වාර්තාව - 2012

2012 වසර තුළ මෙම මණ්ඩලයේ පරිපාලන,මෙහෙයුම් හා මූල්‍ය කටයුතු ක්‍රියාත්මක වූ ආකාරය ඇතුලත් කරුණු සහ වර්ෂය තුල සිදුකරන ලද සියලුම ක්‍රියාකාරකම් ඇතුලත් වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

මෙයට - විශ්වාසී

නීතිඥ ආරියතිලක දහනායක

සභාපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

| | සභාපති / தலைவர் / Chairman | සාමාන්‍යාධිකාරී / பொது முகாமையாளர் / General Manager | ප්‍රධාන කාර්යාලය / தலைமையகம் / Head Office |
|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephones | 448693 / 448694 | 438607 | 448691-2 / 438606 / 430058 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 449316 | 438607 | |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

# දැක්ම

දේශීය කෘෂිකර්මාන්තයේ අග්‍රගන්‍ය රැකවලා වීම තුළින් දකුණු ආසියාවේ පරමාදර්ශී කෘෂි රක්ෂණ ආයතනය වීම

# මෙහෙවර

කෘෂිකාර්මික රක්ෂණය සහ ආරක්ෂණය සැලසීම සඳහා සාමූහික ප්‍රයත්නයන් හා අදාල ආයතන සම්බන්ධීකරණය තුළින් ජාත්‍යන්තරව පිළිගත හැකි විශිෂ්ඨ සේවාවක් සැපයීම

| | | |
|---|---|---|
| 1 | දමිතා රත්නායක මහත්මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව<br>කොළඹ 01<br><br>පී ඒ අබේසේකර මහතා<br>නියෝජ්‍ය ලේකම්<br>මහා භාණ්ඩාගාරය<br>කොළඹ 01 | සභාපති (වැ.බ) 2012.08.09 දක්වා<br><br>සභාපති (2012.08.15 සිට) |
| 2 | ශාන්ත බණ්ඩාර මහතා<br>අතිරේක ලේකම්<br>ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය<br>නව මහ ලේකම් කාර්යාලය<br>මාලිගාවත්ත, කොළඹ 10 | සාමාජික |
| 3 | රවීන්ද්‍ර හේවාවිතාරන මහතා<br>ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව<br>කොළඹ 07<br><br>එම් ඒ එස් වීරසිංහ මහතා<br>ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව<br>කොළඹ 07 | සාමාජික (2012.04.27 දක්වා)<br><br>සාමාජික (2012.08.09 දක්වා) |
| 4 | එම් ඒ එස් පෙරේරා මහතා<br>අධ්‍යක්ෂ(සමාජ හා ආර්ථික සැලසුම්)<br>කෘෂිකර්ම දෙපාර්තමේනුතුව<br>පේරාදෙනිය | සාමාජික |
| 5 | වෛද්‍ය බී සිවයෝගනාදන් මහතා<br>අධ්‍යක්ෂ<br>පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය<br>45,ශාන්ත මයිකල් පාර<br>කොළඹ 03 | සාමාජික |
| 6 | සී පී තේන්නකෝන් මහතා<br>“සීවලී නිවස”<br>කොබෙයිගනේ | සාමාජික |

# කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
## ආයතනික ව්‍යුහය





Back

# පෙරවදන

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට විධිමත් අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් වශයෙන් කෘෂිකාර්මික රක්ෂණය හඳුන්වාදෙමින් 1973 අංක 27 දරණ කෘෂිකර්ම රක්ෂණ පනත මගින් පිහිටවනු ලැබූ කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය, 1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත මඟින් අදාල කර්තව්‍යන් තවදුරටත් පුළුල් කරමින් ඉටු කරනු ලබන සිය මෙහෙවරෙහි 40 වන වසරට පා තබා ඇත.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රක්ෂණ සේවා සපයන දිවයිනේ එකම රාජ්‍ය ආයතනය වශයෙන් දේශීය කෘෂිකර්මාන්තය නංවාලීමේ හා කෘෂිකාර්මිකයාගේ ආර්ථිකය ස්ථායී කිරීමෙහිලා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම උපරිම ආකාරයෙන් ඉටුකිරීම අරමුණුකර ගනිමින් 2012 වර්ෂයේදීද යෝජනාක්‍රම රාශියක් දීපව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය කටයුතු කර ඇත. එමගින් 2012 වර්ෂයේදී මණ්ඩලය උපයා ඇති රක්ෂණ වාරික ආදායම රුපියල් මිලියන 124ක් විය.

**වාරික ආදායම 2006 සිට 2012 දක්වා**

| යෝජනා ක්‍රමය | 2006 (රු.මිලි) | 2007 (රු.මිලි) | 2008 (රු.මිලි) | 2009 (රු.මිලි) | 2010 (රු.මිලි) | 2011 (රු.මිලි) | 2012 (රු.මිලි) |
|---|---|---|---|---|---|---|---|
| වගා රක්ෂණය | 6.23 | 12.08 | 47.41 | 55.35 | 79.69 | 119.07 | 99.9 |
| පශු සම්පත් රක්ෂණය | 5.45 | 8.76 | 14.24 | 14.52 | 12.77 | 18.24 | 15.8 |
| ගබඩා හා කෘෂි උපකරණ රක්ෂණය | 0.21 | - | 0.96 | 1.54 | 3.4 | 5.93 | 6.5 |
| සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණය | 23.4 | 7.41 | 7.88 | 9.01 | 9.62 | 14.23 | 2.5 |
| **එකතුව** | **35.29** | **28.25** | **70.49** | **80.42** | **105.48** | **157.47** | **124.7** |

වර්තමානයේදී ලෝකය පුරා පැන නගිමින් පවතින දේශගුණික හා කාලගුණික විපර්යාසයන් හේතුවෙන් කෘෂිකර්මාන්තය අවදානම් තත්ත්වයක පවතින අතර, පසුගිය වර්ෂවලදී එම තත්ත්වය අඛණ්ඩව ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය කෙරෙහිද ඉතාමත් අහිතකර ලෙස බලපාන ලදී. 2010/2011 මහ කන්නයේදී ගංවතුරින්ද, 2012 යල කන්නයේදී දැඩි නියඟයෙන්ද ශ්‍රී ලංකාවේ ප්‍රධානතම කෘෂිකාර්මික කලාප වල වගාවන්ට විශාල වශයෙන් හානි සිදුවූ අතර 2013 වර්ෂයේදී එම ප්‍රදේශවල 2012/2013 මහ කන්නයේ වගාවන්ට අධික වර්ෂාවෙන් හා ගංවතුරෙන් ද විශාල වශයෙන් හානි සිදු විය.

2008 වර්ෂයේදී මණ්ඩලයේ කටයුතු ප්‍රවර්ධනය කිරීමත් සමගම කෘෂිකාර්මික රක්ෂණ වාරික ආදායම ක්‍රමක්‍රමයෙන් ඉහල නංවාලීමෙන් 2011 මුල් භාගය වන විට රක්ෂණ අරමුදල රුපියල් මිලියන 269 දක්වා වැඩිවිය. එහෙත් දිවයිනේ ප්‍රධානතම වී වගා දිස්ත්‍රික්කයන් වන අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාර, මඩකළපුව, ත්‍රිකුණාමලය සහ මන්නාරම යන ප්‍රදේශවලට ඇතිවූ අධික ගංවතුර තත්ත්වය හේතුවෙන් 2011 වර්ෂයේදී රුපියල් මිලියන 227 ක් රක්ෂණ වන්දි මුදල් වශයෙන් ගෙවීමට සිදුවිය. ඉන් පසුව 2012 වසරේදීද එම ප්‍රදේශවල ඇතිවූ දැඩි නියගයෙන් සිදුවූ වගා හානි වෙනුවෙන් වන්දි ගෙවීම සමගම රක්ෂණ අරමුදල රුපියල් මිලියන 111 දක්වා අඩුවිය. 2013 ජනවාරි සිට පැවති අධික ගංවතුර තත්ත්වයත් නිසා 2012/13 මහ කන්නයේ හානි වූ වගාවන්ට විශාල වන්දි මුදලක් ගෙවීමට සිදු වීමත් සමඟම තවදුරටත් රක්ෂණ අරමුදල හීනවන තත්ත්වයකට පත්ව ඇත.

කෙසේවුවද, හදිසි ආපදා තත්ත්වයන් හමුවේ කෘෂිකර්මාන්තය හා කෘෂිකාර්මිකයා සුරක්ෂිත කිරීමෙහිලා රජය වෙත පැවරී ඇති වගකීම යම් පමණකට හෝ ලිහිල් කිරීම පිණිස කෘෂිකාර්මික අවදානම් කළමනාකරණයට සෘජුවම සම්බන්ධ වන රාජ්‍ය අංශයේ එකම රක්ෂණ ආයතනය වශයෙන් වගා හානි වූ ගොවීන් වෙත මණ්ඩලය විසින් සිදු කරන ලද වන්දි මුදල් ගෙවීම බෙහෙවින් ඉවහල්විය. එමෙන්ම මූල්‍ය ආයතන විසින් ලබාදෙන කෘෂිකාර්මික ණයවල සුරක්ෂිතභාවය තහවුරු කරනු වස් ණය නිකුත් කිරීමේදී අදාළ වගාවන්ට රක්ෂණාවරණය ලබාදීම තුළින් මණ්ඩලය විසින් ඉටුකරනු ලබන කාර්යභාරයද ඉතා වැදගත්වේ.

පසුගිය වසර කිහිපය තුළදීම නව තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කරමින් වගා හානිවූ දිස්ත්‍රික්ක වලදීම වන්දි ගණනය කර කන්නය අවසන් වීමටත් පෙර වන්දි මුදල් ගෙවීම නිසා ගොවි ජනතාවගේ හා බැංකු ක්ෂේත්‍රයේ විශ්වාසය දිනාගැනීමට මණ්ඩලයට හැකියාව ලැබී ඇත.

විශේෂයෙන්ම යුද්ධයේ බලපෑම ඉවත්වීමත් සමග උතුරු නැගෙනහිර පලාත්වල රජයේ සංවර්ධන ක්‍රියාවලියට සහය වෙමින් එම පලාත්වල වී වගාවට අමතරව බඩඉරිඟු, මිරිස්, ලූණු, එළවළු ඇතුළු අනිකුත් වගාවන් සඳහාද රක්ෂණාවරණය ලබාදීමට මණ්ඩලය කටයුතු කර ඇත. මෙම ප්‍රදේශවල අලුතින් අස්වද්දන ඉඩම්වල වගාවන්ට යම් හානියක් සිදුවුවහොත් රක්ෂණාවරණය තුළින් ඒ සඳහා වන්දි මුදල් ලබාගැනීමට හැකිවීම නිසා එම ගොවිජනතාව තුළ ගොඩනැගී ඇති විශ්වාසයද එම ප්‍රදේශවල කෘෂිකාර්මික සංවර්ධනයට බෙහෙවින් ඉවහල් විය.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළව ක්‍රියාත්මක කරනු ලබන පශු සම්පත් රක්ෂණය, ගබඩා රක්ෂණය, ට්‍රැක්ටර් හා කෘෂි උපකරණ රක්ෂණය ඇතුළු රක්ෂණ යෝජනා ක්‍රම සහ කෘෂිකාර්මිකයාගේ සුභසාධනය ඉලක්ක කරගනිමින් සුවසෙත සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය හා හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමයද මණ්ඩලය විසින් 2012 වර්ෂයේදීද දීපව්‍යාප්තව ක්‍රියාත්මක කරන ලදී.

ජාතික ප්‍රශ්නයක් බවට පත්ව ඇති, වන අලින්ගෙන් සිදුවන ජීවිත හා කෘෂිකාර්මික හානි වෙනුවෙන් රක්ෂණාවරණය සැපයීමේ යෝජනා ක්‍රමයක්ද මණ්ඩලය විසින් පිළියෙල කර, අනුමැතිය ලබාගෙන ඇති අතර, ඒ සඳහා අරමුදල් ලැබීමෙන් පසු ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

පොහොර සහනාධාරය යටතේ වගා රක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම පිළිබඳ යෝජනා ක්‍රමයක් 2011 වර්ෂයේදී මණ්ඩලය විසින් පිළියෙලකර තිබූ අතර 2012 අයවැය වාර්තාව මගින්ද ඒ පිළිබඳව ඉදිරිපත්වූ යෝජනාව පරිදි අදාළ රක්ෂණ කටයුතුද ක්‍රියාත්මක කිරීමෙහිලා මණ්ඩලය සතු පලපුරුද්ද හා හැකියාව සමග යෝජනාවලිය පිළිබඳව ශක්‍යතා වාර්තාවක් අමාත්‍යාංශයේ අවධානය සඳහා යොමුකර ඇත.

මණ්ඩලයේ නාමය පසුගිය කාලය තුළදී ජනතාව අතර වඩාත් ප්‍රචලිත වීමට හේතු වූ මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන ලද ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අරමුදල ශූන්‍ය වීම නිසා 2012 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම අත්හිටු වීමට සිදු වීමෙන් ජනතාවගේ මෙන්ම බාහිර ආයතන වල නිළධාරීන්ගේද මණ්ඩලය කෙරෙහි තිබූ විශ්වාසය බිඳී යාමද 2012 වර්ෂයේදී මණ්ඩලීය යෝජනා ක්‍රම ව්‍යාප්ත කිරීමේදී මෙන්ම මූල්‍ය ඉලක්කයන් සපුරා ගැනීමේදීද අහිතකර අන්දමින් බලපාන ලදී.

2012 වර්ෂයේදී මණ්ඩලයට නිලධාරීන් බඳවා ගැනීමක් සිදුකර නොමැති අතර පවතින කාර්ය මණ්ඩලය මගින් අදාළ රාජකාරි කටයුතු ඉටුකරවා ගෙන ඇත. නියමිත සැළැස්මට අනුව අනුමත කාර්ය මණ්ඩලය 421ක් වුවද මේ වනවිට කාර්ය මණ්ඩලයේ සේවක පිරිස 306 ක් පමණි. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 115කි.

මෙවන් පසුබිමක් තුළ වුවද කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සිය වගකීම ඉටු කරමින් 2012 වර්ෂයේදී සිදු කළ ක්‍රියාකාරකම්හි කාර්යය සඵලතා මෙම වාර්තාව මගින් ඉදිරිපත් කරනු ලබයි.



Back

# මෙහෙයුම් අංශය



Back

# <u>මෙහෙයුම් අංශය</u>

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රක්ෂණ සේවා සපයන දිවයිනේ එකම රාජ්‍ය ආයතනය වශයෙන් දේශීය කෘෂිකර්මාන්තය නංවාලීමේ හා කෘෂිකාර්මිකයාගේ ආර්ථිකය ස්ථායී කිරීමෙහිලා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත පැවරි ඇති වගකීම ඉටු කරලීම අරමුණු කර ගනිමින් පහත සඳහන් මණ්ඩලීය යෝජනා ක්‍රම ගොවිජනතාව අතර ප්‍රචලිත කිරීමේ විශේෂ මෙහෙයුම් වැඩසටහන් 2012 වර්ෂයේදී ද දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරන ලදී.

1. **වගා රක්ෂණ යෝජනා ක්‍රම :-**
    - වී වගා රක්ෂණ යෝජනා ක්‍රමය
    - බඩ ඉරිඟු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
    - අතිරේක භෝග වගා ( මුං , රටකජු, සෝයා , උඳු )රක්ෂණ යෝජනා ක්‍රමය
    - ලොකුළුණු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
    - උක් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
    - අපනයන භෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමය
    - වැවිලි භෝග (තේ) වගා රක්ෂණ යෝජනා ක්‍රමය
    - පොල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
    - අර්තාපල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
    - මල් හා විසිතුරු පැළ වගා රක්ෂණ යෝජනා ක්‍රමය
    - ඉඟුරු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
    - මිරිස් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
    - එළවළු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
    - කෙසෙල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
    - පළතුරු වගා රක්ෂණ යෝජනා ක්‍රමය

2. ගබඩා රක්ෂණ යෝජනා ක්‍රමය
3. ට්‍රැක්ටර් ඇතුළු කෘෂි උපකරණ රක්ෂණ යෝජනා ක්‍රමය
4. පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය
    - එළු
    - ගව
5. හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය
6. සුවසෙත සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

අදාල යෝජනා ක්‍රම යටතේ උපරිම සේවාවක් ගොවිජනතාව වෙත ලබා දීමේ හා ඒ මගින් මණ්ඩලයේ මුල්‍ය අදායම වර්ධනය කර ගැනීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා දිස්ත්‍රික් කාර්යාල ජාලය මඟින් අදාල මෙහෙයුම් කටයුතු දිවයින පුරා ක්‍රියාත්මක කෙරුණි. එහිදී වාණිජ බැංකු සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කළ කෘෂිකාර්මික ණය යටතේ රක්ෂණ කටයුතු හා බාහිර ආයතන වල විශේෂ ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කළ රක්ෂණ කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලද අතර ඒ මඟින් වැඩි අදායමක් උපයා ගැනීමට අපේක්ෂා කරන ලදී. වර්තමානයේදී පැන නගිමින් පවතින දේශගුණික හා කාළගුණික විපර්යාශයන් හේතුවෙන් සිදුවන වගා හානි වෙනුවෙන් අඛණ්ඩව වන්දි මුදල් ගෙවීමට සිදු වීම මණ්ඩලයේ මුල්‍ය තත්ත්වය කෙරෙහි අහිත කර ලෙස බලපා ඇත. එසේ වුවද 2012 යල කන්නයේදී ද දිවයිනේ ප්‍රධානතම කෘෂිකාර්මික දිස්ත්‍රික්ක වලට දැඩි බලපෑමක් සිදුකරමින් නියඟයෙන් සිදු වු වගා හානි වෙනුවෙන් කන්නය අවසන් වීමටත් පෙර වන්දි මුදල් ගෙවා මණ්ඩලයේ වගකීම ඉටු කර බැංකු ක්ෂේත්‍රයෙහි සහ ගොවිජනතාවගේ විශ්වාසය දිනා ගැනීමට ද කටයුතු කර ඇත.

වාර්ෂික මුලා ඉලක්කය සපුරා ගැනීමේදි ප්‍රමුඛතම කාර්ය භාරය දිස්ත්‍රික් කාර්යාලීය කාර්ය මණ්ඩලය විසින් ඉටු කරනු ලබන බැවින් උතුරු නැගෙනහිර ද ඇතුළුව දිවයිනේ සියළුම දිස්ත්‍රික් කාර්යාල වලට අනුයුක්ත සහකාර අධ්‍යක්ෂ , සංවර්ධන හා ක්ෂේත්‍ර නිලධාරීන් පමණක් නොව එම කාර්යාල වල සියළුම කළමණාකරන සහකාර නිලධාරීන්ගේද සහභාගිත්වයෙන් ප්‍රධාන කාර්යාලය , අනුරාධපුරය, මහනුවර හා ඇඹිලිපිටිය යන ස්ථාන වලදී අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන්පැවති වැඩමුළුවලදී ඒ වන විට එක් ඒක් දිස්ත්‍රික් කාර්යාලයේ මුලා ප්‍රගතිය හා ඉදිරි මුලා ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩ සැලසුම් සාකච්ඡාවට භාජනය කර අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කරන ලදී. ඒ අනුව යෝජනා ක්‍රම යටතේ වාරික මුදල් අය කර ගැනීමේදී හා වගා හානි තක්සේරු කරීමේදී අවශ්‍ය පරිදි නිළධාරින් යෙදවීම , අනෙකුත් පහසුකම් සැපයීම , නිලධාරින් දැනුවත් කිරීම හා අධීක්ෂණය කිරීම මඟින් අදාල කටයුතු කාර්යක්ෂම ව මෙහෙයවීමට ද මෙහෙයුම් අංශය කටයුතු කර ඇත.රක්ෂණ කටයුතු මෙහෙය විමේදී කෘෂිකාර්මික ව්‍යාප්තියට අනුව දිවයිනේ ප්‍රදේශ ප්‍රධාන කොටස් දෙකකට වෙන් කර අදාල මෙහෙයුම් කටයුතු සිදු කරන ලදී.

## 1 <u>ප්‍රධාන කෘෂිකාර්මික කලාප:-</u>

සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයෙන් ඔබ්බට ගිය මහාවාරි යෝජනා ක්‍රම යටතේ විධිමත් වාරිකර්මාන්තයක් සහිත අපනයන කෘෂිකර්මාන්තය දක්වා ව්‍යාප්ත වීමෙන් කෘෂි ව්‍යාපාරිකයින් බවට පත්වූ වැඩි කෘෂි කාර්මික ජනතාවක් වාසය කරන දිස්ත්‍රික්ක ඇතුළත් කලාප මෙයට ඇතුළත් වේ . මෙම කලාප තුළ මුලා ආයතන වල සහය ඇතිව වෙළඳපොළ ඉලක්ක කරගනිමින් ප්‍රධාන වශයෙන් වගා කෙරෙන වී සහ බඩ ඉරිඟු ඇතුළු ප්‍රධාන වගාවන් රක්ෂණය කිරීම මඟින් වැඩි අදායමක් උපයා ගැනිමටත්, ඊට අමතරව එළවළු හා අතිරේක භෝග හා බහු වාර්ෂික භෝග වගාවන් රක්ෂණය මඟින් එම අදායම තවදුරටත් වර්ධනය කරගැනීමටත් අපේක්ෂා කරන ලදී. සෑම වසරකම සමස්ත මුලා අදායමෙන් වැඩි ප්‍රමාණයක් මෙම කෘෂිකාර්මික කලාපවල වගා රක්ෂණ කටයුතුවලින් උපයා ගැනෙන නමුදු විවිධ වූ හේතු සාධක රාශියක බලපෑමෙන් 2011 වර්ෂයේ මුලා ආදායමට සාපේක්ෂව 2012 වර්ෂයේ මුලා ආදායම පසුබෑමකට ලක් වී ඇත.

විශේෂයෙන්ම 2012 වර්ෂයේදි වගා රක්ෂණ කටයුතුවලට සෘජුවම මැදිහත් වූ පෞද්ගලික රක්ෂණ සමාගම් විසින් බැංකු වෙත හා පෞද්ගලිකවම ඒවායේ නිළධාරීන් වෙත විශේෂ දිරි දීමනා ලබා දී සිදුකර ඇති බලපෑම් මත අදාල බැංකු යටතේ රක්ෂණ කටයුතු මණ්ඩලයට අහිමි වීමත්, අඛණ්ඩව පසුගිය කන්නවල සිදු වූ වගා හානි නිසා වගා ණය කපා හරිතැයි අපේක්ෂාවෙන් වගා ණය නොගෙවා සිටි ගොවීන් වෙත නැවත වගා ණය නිකුත් කිරීම ප්‍රතික්ෂේප වීමත්,අළුතින් කුඹුරු අස්වැද්දීමේ කටයුතු ආරම්භ කර ඇති උතුරු නැගෙනහිර දිස්ත්‍රික්කවල ගොවි ජනතාව වගා කටයුතුවලට දිරිගැන්වීම උදෙසා විශේෂ සහනයක් වශයෙන් එම ප්‍රදේශවල මුලා ආයතන විසින් රක්ෂණයෙන් තොරව වගා ණය නිකුත් කිරීමත්,වැඩි මුලා ආදායමක් අපේක්ෂා කළ 2012/2013 මහ කන්නය සඳහා නියමිත කාලයට ප්‍රමාණවත් පරිදි ජලය නොලැබීමෙන් වගා කන්නය ප්‍රමාද වීම හා අක්‍රමවත් වීම නිසා ප්‍රායෝගික අත්දැකීම් අනුව එම වගාවන්ට වැඩි හානියක් සිදුවීමේ ප්‍රවනතාවය වැඩි බැවින් ස්වේච්ඡා රක්ෂණ කටයුතු ප්‍රවර්ධනය නොකිරීමට ප්‍රධාන කෘෂිකාර්මික කලාපවල දිස්ත්‍රික් කාර්යය මණ්ඩල කටයුතු කිරීමද ඇතුළු කරුණු රාශියක් හේතුවෙන් වගා රක්ෂණ කටයුතු වලින් අපේක්ෂිත ආදායම් උපයා ගැනීමට නොහැකි වීම 2012 වර්ෂයේ සමස්ථ මුලා ආදායම අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා ඇත.

2012 වර්ෂයේ අවසන් කාලයේදී ආරම්භ වී මේ වන විටත් ප්‍රධාන කෘෂිකාර්මික කලාපවල 2012/2013 මහ කන්නයේ වගාවන්ට අධික වර්ෂාවෙන් සහ ගංවතුරෙන් සිදු වෙමින් පවතින වගා හානි වෙනුවෙන් වන්දි මුදල් ගෙවීම සඳහා දැනට මණ්ඩලය සතු රක්ෂණ අරමුදල් ප්‍රමාණවත් නොවන තත්වයක පවතින බැවින් 2012 වර්ෂයේදී වගා රක්ෂණ කටයුතු සීමා වීම පවතින මුලා තත්වය මත වක්‍රාකාරව මණ්ඩලය ලද යම්කිසි සහනයක් වශයෙන් ද සඳහන් කළ හැක.

## 2 අර්ධ කෘෂිකාර්මික කලාප:-

කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය නොවන අතර අර්ධ වශයෙන් කෘෂිකාර්මික කටයුතු වල නිරත ජනතාවක් වාසය කරන දිස්ත්‍රික්ක මෙම කලාපයට අයත් වේ. මෙම දිස්ත්‍රික්ක වල මූලා ඉලක්කයන් සපුරා ගැනිමේදී පශු සම්පත් රක්ෂණය , සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණය ප්‍රමුඛතම රක්ෂණ යෝජනා ක්‍රම වශයෙන් ක්‍රියාත්මක වේ . මණ්ඩලයේ නාමය පසුගිය කාලය තුළදී ජනතාව අතර වඩාත් ප්‍රචලිත වීමට හේතුවූ මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන ලද ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම වැටුප් ගෙවීම 2011 වර්ෂයේ සිට විකල්ප ක්‍රියාමාර්ගයකින් තොරව අත්හිටුවීම නිසා ජනතාවගේ මෙන්ම, මණ්ඩලයේ යෝජනා ක්‍රම සඳහා දායකයින් බඳවා ගැනීමේදි සහය දක්වන ලද බාහිර ආයතන වල නිළධාරීන්ගේ ද මණ්ඩලය පිළිබඳ ව තිබූ විශ්වාසය බිදී යාම 2012 වර්ෂයේදී සමස්ත යෝජනා ක්‍රම ව්‍යාප්ත කිරිමේදී අහිතකර අන්දමින් බලපා ඇත.

## අලෙවිකරණ සහ ප්‍රචාරක කටයුතු

1. 2012 යල කන්නයේ නියඟයෙන් සිදු වූ වගා හානි තක්සේරු කටයුතු කඩිනමින් ඉටු කරවා කන්නය අවසන් වීමටත් පෙර අදාල වන්දි මුදල් ගෙවීම තුළින් මණ්ඩලය කෙරෙහි බැංකු ක්ෂේත්‍රයේ හා ගොවිජනතාවගේ විශ්වාසය තහවරු කිරීමට කටයුතු කිරිම.
2. ඉතිහාසයේ ප්‍රථම වතාවට රාජ්‍ය නායකයාගේ මූලිකත්වයෙන් වගා රක්ෂණ වන්දි මුදල් ගොවීන් වෙත ප්‍රදානය කිරිම සනිටුහන් කරමින් 2012 යල කන්නයේ වන්දි මුදල් ප්‍රදානය කිරිම වෙනුවෙන්ම වූ ජාතික උත්සවය අතිගරු ජනාධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් 2012.08.17 දින තඹුත්තේගමදී පවත්වන ලදී.
3. එමෙන්ම ගොවිජන සේවා හා වන ජීවී අමාත්‍ය ගරු එස්. එම්. චන්ද්‍රසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් වන්දි මුදල් ගෙවීමේ ප්‍රචාරාත්මක වැඩ සටහන් දෙකක් 2012.10.16 හා 2012 10.22 දින වලදී අනුරාධපුර දිස්ත්‍රික්කයේදීද , පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වන්දි මුදල් ප්‍රදානය කිරීම සෞඛ්‍ය අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2012.09.05 දින පොළොන්නරුව බුද්ධි මණ්ඩපයේ දී ද සිදු කරන ලදී.
4. වන්දි ප්‍රදානය කිරීමේ උත්සව සෑම විටම වගා ණය ලබා දෙන බැංකු වල නිළධාරීන්ගේ සහ විශාල ගොවිජනතාවකගේ සහභාගිත්වයෙන් පවත්වන ලද අතර ඒ තුළින් මණ්ඩලයේ ක්‍රියාකරකම් පිළිබඳව එම නිලධාරීන් හා ගොවි ජනතාව තුළ විශ්වාසයක් ගොඩනැගීමටද කටයුතු කර ඇත.
5. මෙම වන්දි මුදල් ප්‍රදානය කිරීමේ වැඩ සටහන් පිළිබඳව ගුවන් විදුලි හා රූපවාහිනි ප්‍රධාන ප්‍රවෘත්ති මගින් අඛණ්ඩව විකාශනය කෙරුණු අතර ජාතික පුවත්පත් වලද ප්‍රධාන ප්‍රවෘත්ති වශයෙන් පලවිය. ඒ අනුව මණ්ඩලයේ රක්ෂණ වැඩ පිලිවෙළ පිළිබඳ ව ජාතික මට්ටමින් ජනතාව දැනුවත් කිරීමටද අවස්ථාව උදාවිය.
6. වගා ණය යටතේ රක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමේදි මහජන බැංකු නිලධාරීන්ගේ සහය ලබා ගැනීම සඳහා සුහද හමුවක් පොළොන්නරුව දිස්ත්‍රික්කය වෙනුවෙන් 2012.06.15 දින පොළොන්නරුව විලේජ් හෝටලයේදී ද , කුරුණෑගල දිස්ත්‍රික් නිලධාරීන්ගේ සුහද හමුව 2012.06.10 දින පොල්ගහවෙලදී ද පවත්වන ලදී.
7. ප්‍රාදේශිය සංවර්ධන බැංකුවේ ණය යටතේ ලබා ගන්නා ගවයින් රක්ෂණය කිරීම පිළිබඳව පශු සම්පත් ගොවීන් දැනුවත් කිරීමේ වැඩ සටහනක් මහනුවර දිස්ත්‍රික්කයේ පන්විල පශු වෛද්‍ය කාර්යාලයේ දී 2012.06.20 දින පවත්වන ලද අතර එදින සහභාගි වූ ගොවීන් වෙත ඔවුන්ගේ ගවයින් වෙනුවෙන් මණ්ඩලය මගින් ඛණිජ පැකට් බෙදා දීමටද කටයුතු කර ඇත.

8. 2012/13 මහ කන්නයේ වගා රක්‍ෂණ කටයුතු ඉලක්ක කර ගනිමින් ගොවි ජනතාව දැනුවත් කිරීම සඳහා සිංහල භාෂාවෙන් හා දෙමළ භාෂාවෙන් මුද්‍රිත අත් පත්‍රිකා 15000 ක් දිස්ත්‍රික් කාර්යාල වෙත ලබා දී ඇත.
9. 2011 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද හදිසි අනතුරු රක්‍ෂණ යෝජනා ක්‍රමය ව්‍යාප්ත කිරිමේ ප්‍රවර්ධන වැඩසටහනේදී විශේෂ ප්‍රගතියක් පෙන්වන ලද මණ්ඩලීය හා බාහිර නිලධාරීන්ගේ සේවය ඇගයීමට හා ත්‍යාග ප්‍රධානය කිරීමටද කටයුතු කර ඇත.
10. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වසර 100 ක සේවාව සමරනු වස් 2012.09.12 සිට 2012.09.16 දින දක්වා ගාල්ල ලබුදූව රජයේ ගොවිපලේ පැවති ප්‍රදර්ශනයේ දී මණ්ඩලයේ ප්‍රදර්ශන කුටියක් පවත්වා ගෙන යන ලදි.
11. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සංවිධානයෙන් 2012/11/05 සිට 2012/11/07 දින දක්වා ගාල්ල නගර ශාලාවේදී පැවති කිතුල්මදින්නන්ගේ නිශ්පාදන ප්‍රදර්ශනයේදී මණ්ඩලයේ ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යාමට හා කිතුල්මදින්නන් සඳහා විශේෂ වූ හදිසි අනතුරු රක්‍ෂණ යෝජනා ක්‍රමය පිළිබඳව අත් පත්‍රිකා මඟින් දැනුවත් කිරිමටද කටයුතු කර ඇත.
12. 2012/10/27 දින අනුරාධපුරයේ කවරක්කුලම වෙල්යායේදී පැවති 2012 ජාතික වප්මඟුල් උත්සවයට සහභාගි වූ ආරාධිත අමුත්තන් හා ගොවීන් සඳහා " ජාතික වප්මඟුල් උත්සවය 2012 කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලය" යන ශීර්ෂ පාඨය මුද්‍රිත බැනියම් 50 ක් මණ්ඩලයේ ප්‍රචාරය වෙනුවෙන් ලබා දි ඇත.

# රක්ෂණ අංශය

## කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය

## හා

## පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය

ප්‍රාරක්ෂණ කටයුතු හා වන්දි ගණනය හා ගෙවීම රක්ෂණ අංශය මඟින් කෙරෙන ප්‍රධාන කාර්යයක් වේ.මෙහිදි වගා රක්ෂණ කටයුතු හා පශු රක්ෂණ කටයුතු මෙන්ම සාමාන්‍ය රක්ෂණ කටයුතු වලට අදාල වන්දි ගෙවීම් වලදී විශේෂ අවධානය යොමු කර කඩිනමින් වන්දි ගෙවීමට පියවර ගැනීම හා වන්දි ගෙවීම රක්ෂණ අංශය මඟින් සිදුවේ.

**2012 වර්ෂයේදී ප්‍රාරක්ෂණ මෙන්ම වන්දි ගෙවීමේ කටයුතුද කඩිනමින් සිදු කර ගැනීම අවස්ථාව සලසා ගන්නා ලදී.**

**ප්‍රාරක්ෂණ කටයුතු**

1) මනම්පිටිය කලාපයට අදාලව වී වගාව යටතේ සම්මත අස්වැන්න සංශෝධන කර වර්තමාන වෙළඳපල අවශ්‍යතාවයට සරිලන පරිදි යෝජනා ක්‍රමය සංශෝධනය කිරීම.
2) සෙලාන් බැංකුව සමඟ රක්ෂණ කටයුතු කිරීම.තේ වගා රක්ෂණ යෝජනා ක්රමය වර්තමාන වෙළඳපල අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන සංශෝධනය කිරීම.
3) වව්නියාව හා මුලතිව් දිස්ත්‍රික්කයන් සඳහා වගා රක්ෂණ කටයුතු පුළුල් කිරීමේ පරමාර්ථයෙන් විභවතාවයක් පවතින භෝග සඳහා රකෂණ ආවරණ දීර්ඝ කිරීම.විශේෂයෙන් මිරිස්,ළූණු,එළවළු වැනි වගාවන් සඳහා ආවරණය සැපයීම.
4) එසේම එම කලාප සඳහා රකෂණ ආවරණ මට්ටම්ද වැඩි කරන ලදී.විශේෂයෙන් බැංකු මඟින් ණය ආවරණ ලබා දීමේදී එම ණය මුදල ආවරණය වන පරිදි රක්ෂණ සැලසුම් සකස් කර ඉදිරිපත් කිරීම කරන ලදී.
5) තේ වගා රක්ෂණය සංශෝධනයන් සහිතව නැවත වෙළඳපලට නිකුත් කිරීමද සිදු කළ අතර එසේම වගා රක්ෂණය යටතේ භාවිතා කරනු ලබන ආකෘති පත්‍ර අවස්ථානුකූලව සංශෝධන කර යාවත්කාලීන කරන ලදී.
6) පශු රක්ෂණ යොජනා කුමයටද සංශෝධන කිහිපයක් එක් කරන ලදී.විශේෂයෙන්ම රක්ෂණ කොන්දේසි ක්‍රමවේදයන් හා සතුන් හඳුනා ගැනීමේ ක්‍රමවේදයන් සංශෝධනය කරන ලදී.
7) පශු රක්ෂණ ඔප්පු කඩිනමින් නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගත් අතර පශු රක්ෂණ වන්දි ගෙවීමේදී සිදු වන ප්‍රමාදයන් යම් අවම මට්ටමක පවත්වාගෙන යමින් වන්දි නිදහස් කිරීමට පියවර ගෙන ඇත.
8) ට්‍රැක්ටර් රක්ෂණය (බ්‍රවුන්ස් ව්‍යාපෘතිය) යටතේ ට්‍රැක්ටර් සඳහා නොමිලේ ලබා දෙනු ලබන රක්ෂණ ආවරණ වර්ෂ 02 ක කාලයක් සඳහා ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.
9) වෙළඳපල අවශ්‍යතාවය අනුව රක්ෂණ කටයුතු වලදි භාවිතා කරනු ලබන නව ආකෘති පත්‍ර හඳුන්වා දීමටත්,පවත්නා ආකෘති පත්‍ර සංශෝධනය කිරීමටත්,පියවර ගන්නා ලදී.තාවකාලික ආකෘති පත්‍ර හා තහවුරු ප්‍රකාශන පශු රක්ෂණ කටයුතු සඳහා එක් කරන ලදී.

**වන්දි ගෙවීමේ කටයුතු**

10) 2012 යල කන්නයේ ඇති වු දැඩි නියඟ තත්වය හමුවේ ඉදිරිපත් වු වගා හානි වන්දි,මසක් වැනි කෙටි කාලයක් තුළදී ගෙවා නිම කිරීම හා ඒ තුළින් වෙළඳපල අවශ්‍යතාව සැපයීම.මේ සඳහා ජංගම වන්දි ගෙවීමඒකක 5 ක් ක්‍රියාත්මක කරන ලද අතර, ඒ යටතේ රුපියල් මිලියන 40 ක පමණ වන්දි මුදලක් නිදහස් කරන ලදී.

11) 2012 වර්ෂයේදී මණ්ඩලයේ වගකීම ලෙස නිදහස් කරල ලද වන්දි මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 100 කි.එය පහත සඳහන් පරිදි වේ.

**වන්දි ගෙවීම**

| රක්ෂණ යෝජනා ක්‍රමය | ගෙවූ වන්දි මුදල (රු.මිලියන) |
|---|---|
| වී වගා රක්ෂණය | 75,770,287.50 |
| බඩ ඉරිඟු වගා රක්ෂණය | 9,456,453.05 |
| වෙනත් වගා රක්ෂණය | 6,341,753.10 |
| පශු රක්ෂණය | 7,818,212.51 |
| සාමාන්‍ය රක්ෂණය | 979,359.55 |
| **එකතුව** | **100,366,065.71** |

**විශේෂ ව්‍යාපෘති**

රක්ෂණ කටයුතු කරගෙන යෑමේදී ඇති වන ගැටළු හා වන්දි නිදහස් කිරීමේදි මතු වන ගැටළු මෙන්ම රක්ෂණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමේදි තිබිය යුතු මුලික අවබෝධයන් පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළු දිස්ත්‍රික් සියල්ල ආවරණය වන පරිදි සිදු කරන ලදී.

GIS තාක්ෂණය භාවිතා කර රක්ෂණ කටයුතු වලට භාවිතා කළ හැකිද, යන්න සොයා බැලීම සඳහා ආරම්භ කරන ලද නියමු ව්‍යාපෘතිය අවසන් කිරීම.

වන අලි තර්ජනය හේතුවෙන් සිදුවෙන අවදානම් රක්ෂණය කිරීම සඳහා රක්ෂණ යෝජනා ක්‍රමය සකස් කර අවසන් කරන ලදී.එයට අදාල මුලික මුරමුදලක් සහිතව මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අනුමත වුවද,මුලික අරමුදලක් සම්පාදනය කර ගැනීමට නොහැකි වීම මත යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.පොහොර සහනාධාර වැඩපිළිවෙලට සමගාමීව රක්ෂණ යෝජනා ක්‍රමයක් සකස් කළ ද එය ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව මණ්ඩලයට ගිලිහි ගිය වසරක් ලෙස සඳහන් කළ යුතුව ඇත.

# ගොවි විශ්‍රාම වැටුප් අංශය

## ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

## හා

## ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය



Back

**<u>ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සහ ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය:</u>**

කෘෂිකාර්මිකයාගේ අනාගත සුරක්ෂිතභාවය සැලසීම සඳහා 1987 වසරේදී ආරම්භ කරන ලද ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට 2012 වර්ෂය අවසාන වන විට වසර 25 ක් සම්පූර්ණ වේ. මෙම යෝජනා ක්‍රමයට දායක වී ඇති සමස්ථ දායකයින් සංඛ්‍යාව 959254 ක් වන අතර, 2012 වර්ෂයේ ආරම්භය වන විට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා ගත් දායකයින් සංඛ්‍යාව 90573 කි.

ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ පනත මඟින් සලසා තිබූ ප්‍රතිපාදන වලට අනුකූලව ගෙවීමට සැලසුම් කර තිබූ විශ්‍රාම වැටුප් මුදලට වඩා වැඩි කළ විශ්‍රාම වැටුපක් ගෙවීමට ගන්නා ලද තීරණය මත 2010 ජූලි මාසයේ අග භාගය වන විට ගොවි විශ්‍රාම වැටුප් අරමුදලද ශූන්‍ය බවට පත් විය. එතැන් සිට 2011 දෙසැම්බර් මාසය දක්වා මහා භාණ්ඩාගාරය මඟින් සලසා දුන් ප්‍රතිපාදනය සහ මහ භාන්ඩාගාරයේ අනුමැතිය මත මණ්ඩලය මඟින් පවත්වා ගෙන ගිය වෙනත් අරමුදල් යොදා ගනිමින් විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු යොදන ලදී. එසේ වුවද 2012 වර්ෂයේ දී ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සම්පාදනය කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් 2012 වර්ෂය තුළ මෙම ප්‍රතිලාභීන් වෙත නියමිත විශ්‍රාම වැටුප් ගෙවීමට හැකියාවක් නොලැබිණි.

කෙසේ වුවද 2011 දෙසැම්බර් 31 වන විට වයස අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම වැටුප් නොගෙවන ලද අළුතින් විශ්‍රාම වැටුප් ලේඛණයට ඇතුලත් වූ දායකයින් 1230 ක් වෙනුවෙන් ආරම්භක පියවරක් වශයෙන් රු. 6000/= බැගින් වූ විශ්‍රාම වැටුප් දීමනාවක් 2012 මාර්තු මාසයේ දී ගෙවීමට කටයුතු කරන ලද අතර, මෙම දායකයින් වෙනුවෙන් ගෙවූ මුදල රුපියල් මිලියන 7.3 කි. මේ අනුව මෙම යෝජනා ක්‍රමයේ ආරම්භයේ සිට 2012 වර්ෂය දක්වා රුපියල් මිලියන 6877 ක මුදලක් විශ්‍රාම වැටුප්ලාභීන් වෙත ගෙවා ඇත.

මෙම යෝජනා ක්‍රමයේ ඇති වී තිබෙන මූල්‍ය අර්බුදයට ස්ථිරසාර විසඳුමක් ලබා දී යෝජනා ක්‍රමය අකර්මණ්‍ය නොවී පවත්වා ගෙන යාම සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ උපදෙස් මත මෙයට විසඳුම් පිණිස යෝජනා ඉදිරිපත් කොට ඇති අතර, ඒ අනුව තිරසාර විසඳුමක් සඳහා ප්‍රවිශ්ඨ වීමට අවශ්‍ය සෑම පියවරක්ම ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර ඇත.

**<u>මරණ සහ බෙලහීනතා ප්‍රතිලාභ ගෙවීම :-</u>**

2012 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සම්පාදනය කර ගැනීම සම්බන්ධයෙන් ගැටළුකාරී තත්වයක් ඇති වුවද, මෙම යෝජනා ක්‍රමයට දායක වී මරණ හා බෙලහීනතාවයට පත්වූ දායකයින් වෙනුවෙන් ඔවුන්ට හිමි සියළු ප්‍රතිලාභ නියමිත පරිදි ගෙවීමට පියවර ගත් අතර, 2012 වසර තුළ මරණ පාරිතෝෂික වශයෙන් දායකයින් 444 ක් වෙනුවෙන් රු. 7,012,987/= ක මුදලක් සහ බෙලහීනතා ප්‍රතිලාභ වශයෙන් දායකයින් 05 ක් සඳහා රු. 135,827/= ක මුදලක් ප්‍රතිලාභීන් වෙත ලබා දීමට පියවර ගන්නා ලදී. (ඇමුණුම 01)

**<u>ශුද්ධ වාරික මුදල් හා පොළිය ගෙවීම :-</u>**

ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වී වාරික මුදල් අඛණ්ඩව නොගෙවීම මත දායකත්වය අවලංගුවූ සහ රැකියාවක් ලබා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් ඉල්ලා අස්වූ දායකයින් 455 ක් වෙනුවෙන් රු. 4,569,943/= මුදලක්ද ශුද්ධ වාරික වශයෙන් මෙම වසරේදී ප්‍රතිලාභීන් වෙත ගෙවීමට මණ්ඩලය විසින් පියවර ගන්නා ලදී. (ඇමුණුම 02)

**<u>ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම විධිමත් කිරීම සඳහා ගොවි විශ්‍රාම වැටුප්ලාභීන් පිළිබඳව තොරතුරු රැස් කිරීමේ සමීක්ෂණය :-</u>**

ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් වූ මූල්‍ය ශාක්‍යතාව පිළිබඳව ගැටළු සහගත තත්ත්වයකට මුහුණ පා ඇති බැවින් මෙම යෝජනා ක්‍රමයේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබාගන්නා විශ්‍රාමිකයින් හට පනතේ විධිවිධාන ප්‍රකාරව විශ්‍රාම වැටුප් ලබා ගැනීම සඳහා වූ සුදුසුකම් සපුරා තිබේද යන්න පිළිබඳව නිවැරදි තොරතුරු ලබා ගැනීම සඳහා දීපව්‍යාප්ත සමීක්ෂණයක් ග්‍රාම නිලධාරීන් හා ප්‍රාදේශීය ලේකම් වරුන්ගේ සහය ඇතිව 2012 වසරේ පෙබරවාරි මාසයේදී ක්‍රියාත්මක කරන ලදී. මෙම සමීක්ෂණයේදී සමස්ථ විශ්‍රාම වැටුප්ලාභීන්ගෙන් 88% ක් සුදුසුකම් සපුරා ඇති බවට නිවැරදි තොරතුරු ඉදිරිපත් කර ඇත.

**<u>ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය :-</u>**

2012 වර්ෂය අවසන් වන විට දායකත්වය ලබා ඇති මුළු ධීවරයින් සංඛ්‍යාව 68054 ක් වන අතර, විශ්‍රාම වැටුප් ලාභීන් 2185 ක් සඳහා රු. 30,068,226/= ක මුදලක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවන ලදී. මෙම ගෙවීම් තැපැල් කාර්යාල 390 ක් මඟින් සිදු කරන ලදී. (ඇමුණුම 03)

ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකයින් අතුරින් මරණයට පත් වූ දායකයින් 65 දෙනෙකු සඳහා රු. 919,000/= ක මරණ පාරිතෝෂික මුදලක් ද ප්‍රතිලාභ වශයෙන් ගෙවා ඇත.

| කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | | |
| --- | --- | --- |
| ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | | |
| ශුද්ධ වාර්ෂික මුදල හා පොලිය ගෙවීම - 2012 වර්ෂය | | |
| දිස්ත්‍රික්කය | මුළු දායකයින් සංඛ්‍යාව | ගෙවූ මුදල්(රුපියල්) |
| කොළඹ | 15 | 109502 |
| ගම්පහ | 36 | 316862 |
| කළුතර | 25 | 217676 |
| මහනුවර | 29 | 340215 |
| මාතලේ | 21 | 191764 |
| නුවරඑළිය | 19 | 252505 |
| ගාල්ල | 48 | 442465 |
| මාතර | 25 | 219480 |
| අම්පාර | 7 | 54139 |
| වලව | 3 | 34799 |
| පුත්තලම | 22 | 179677 |
| කුරුණෑගල | 29 | 310250 |
| මහව | 9 | 151839 |
| අනුරාධපුරය | 10 | 117199 |
| පොළොන්නරුව | 14 | 160333 |
| මොණරාගල | 4 | 65583 |
| හම්බන්තොට | 26 | 267785 |
| රත්නපුරය | 38 | 392288 |
| මහවැලි."H" | 1 | 8103 |
| බදුල්ල | 28 | 302219 |
| කෑගල්ල | 23 | 228402 |
| මහවැලි.ස" | 23 | 206858 |
| එකතුව | 455 | 4569943 |

| | දිස්ත්‍රික්කය | සංඛ්‍යාව 2011.12.31 දිනට | මුළු විශ්‍රාමිකයින් සඳහා ගෙවන මුදල | 1992 සිට මේ දක්වා ගෙවූ මුදල | තැපැල් කාර්යාල සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 3606 | 3,671,498.00 | 257,057,499.00 | 167 |
| 2 | ගම්පහ | 6985 | 7,150,325.00 | 508,813,182.00 | 267 |
| 3 | කළුතර | 5882 | 5,977,524.00 | 435,104,209.00 | 165 |
| 4 | මහනුවර | 8850 | 9,042,635.00 | 702,995,185.00 | 382 |
| 5 | මාතලේ | 2392 | 2,465,610.00 | 180,284,097.00 | 112 |
| 6 | නුවරඑළිය | 2498 | 2,567,154.00 | 183,363,987.00 | 127 |
| 7 | ගාල්ල | 8760 | 8,966,913.00 | 744,928,857.00 | 261 |
| 8 | මාතර | 5837 | 5,954,299.00 | 433,463,775.00 | 240 |
| 9 | හම්බන්තොට | 4438 | 4,558,663.00 | 311,045,693.00 | 136 |
| 10 | යාපනය/කිලිනොච්චි | 1544 | 1,622,609.00 | 136,906,922.00 | 147 |
| 11 | මන්නාරම | 32 | 33,019.00 | 1,518,697.00 | 9 |
| 12 | වවුනියාව | 235 | 246,579.00 | 23,469,774.00 | 42 |
| 13 | මුලතිව් | 59 | 61,942.00 | 7,448,883.00 | 14 |
| 14 | මඩකලපුව | 588 | 613,130.00 | 51,680,431.00 | 69 |
| 15 | අම්පාර | 2426 | 2,513,944.00 | 194,418,169.00 | 111 |
| 16 | ත්‍රිකුණාමලය | 531 | 547,043.00 | 42,610,286.00 | 45 |
| 17 | කුරුණෑගල-මහව | 10094 | 10,357,950.00 | 716,418,299.00 | 364 |
| 18 | පුත්තලම | 3075 | 3,176,364.00 | 226,819,681.00 | 135 |
| 19 | අනුරාධපුරය/මහවැලි H | 3941 | 4,078,390.00 | 293,140,935.00 | 213 |
| 20 | පොළොන්නරුව- B G | 3031 | 3,127,218.00 | 231,769,380.00 | 203 |
| 21 | බදුල්ල/මහවැලි සී | 3650 | 3,743,157.00 | 278,656,007.00 | 216 |
| 22 | මොණරාගල | 2746 | 2,861,553.00 | 216,690,559.00 | 94 |
| 23 | රත්නපුරය/උඩවලව | 4162 | 4,269,904.00 | 318,550,773.00 | 211 |
| 24 | කෑගල්ල | 5211 | 5,306,231.00 | 372,950,155.00 | 235 |
| | **එකතුව** | **90573** | **92,913,654.00** | **6,870,105,435.00** | **3965** |

## ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

### 2012 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා මරණ හා බෙලහීනතා ගෙවීම් විස්තරය

| | දිස්ත්‍රික්කය | මරණ සංඛ්‍යාව | ගෙවූ මුදල රුපියල් | බෙලහීන සංඛ්‍යාව | ගෙවූ මුදල රුපියල් | ළු සංඛ්‍යාවේ එකතුව | මුළු මුදල රුපියල් |
|---|---|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 08 | 107,583.00 | - | - | 8 | 107,583.00 |
| 2 | ගම්පහ | 29 | 506,132.00 | - | - | 29 | 506,132.00 |
| 3 | කලුතර | 20 | 279,645.00 | 2 | 43,654.00 | 22 | 323,299.00 |
| 4 | මහනුවර | 38 | 551,612.00 | 1 | 32,173.00 | 39 | 583,785.00 |
| 5 | මාතලේ | 05 | 90,770.00 | - | - | 5 | 90,770.00 |
| 6 | නුවරඑළිය | 15 | 204,451.00 | - | - | 15 | 204,451.00 |
| 7 | ගාල්ල | 36 | 480,613.00 | - | - | 36 | 480,613.00 |
| 8 | මාතර | 12 | 199,221.00 | - | - | 12 | 199,221.00 |
| 9 | හම්බන්තෙ | 23 | 403,217.00 | 1 | 30,000.00 | 24 | 433,217.00 |
| 10 | යාපනය | 08 | 83,000.00 | - | - | 8 | 83,000.00 |
| 11 | මන්නාරම | 01 | 30,199.00 | - | - | 1 | 30,199.00 |
| 12 | වව්නියාව | 04 | 63,000.00 | - | - | 4 | 63,000.00 |
| 13 | මුලතිව් | 00 | - | - | - | - | - |
| 14 | මඩකලපුව | 04 | 64,372.00 | - | - | 4 | 64,372.00 |
| 15 | අම්පාර | 01 | 24,563.00 | - | - | 1 | 24,563.00 |
| 16 | ත්‍රිකුණාමල | 01 | 8,000.00 | - | - | 1 | 8,000.00 |
| 17 | පුත්තලම | 19 | 334,535.00 | - | - | 19 | 334,535.00 |
| 18 | කුරුණෑගල | 35 | 513,654.00 | - | - | 35 | 513,654.00 |
| 19 | මහව | 30 | 479,505.00 | - | - | 30 | 479,505.00 |
| 20 | අනුරාධපුර | 18 | 306,536.00 | - | - | 18 | 306,536.00 |
| 21 | පොලොන් | 08 | 161,441.00 | - | - | 8 | 161,441.00 |
| 22 | මොණරාග | 22 | 297,528.00 | - | - | 22 | 297,528.00 |
| 23 | බදුල්ල | 18 | 300,593.00 | 1 | 30,000.00 | 19 | 330,593.00 |
| 24 | රත්නපුරය | 26 | 488,729.00 | - | - | 26 | 488,729.00 |
| 25 | කෑගල්ල | 23 | 405,662.00 | - | - | 23 | 405,662.00 |
| 26 | මහවැලි "H | 20 | 298,360.00 | - | - | 20 | 298,360.00 |
| 27 | මහවැලි B" | 10 | 194,207.00 | - | - | 10 | 194,207.00 |
| 28 | මහවැලි "C | 07 | 80,000.00 | - | - | 7 | 80,000.00 |
| 29 | මහවැලි "G | 02 | 30,000.00 | - | - | 2 | 30,000.00 |
| 30 | උඩවලව | 01 | 25,859.00 | - | - | 1 | 25,859.00 |
| | එකතුව | 444 | 7,012,987.00 | 5 | 135,827.00 | 449 | 7,148,814.00 |

| ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 2012.12.31 දිනට බඳවා ගැනීම් | | | | | | | | |
| දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති | | වයස අනුව දායක සංඛ්‍යාව | | | | | පසුගිය මසට | 2012 |
| කොට්ඨාශය | 18-29 | 30-35 | 36-45 | 46-50 | 51-54 | 55-59 | මුළු දායක සංඛ්‍යාව | මුළු දායක සංඛ්‍යාව |
| කළුතර | 1213 | 721 | 772 | 197 | 105 | 59 | 3067 | 3067 |
| ගාල්ල | 1082 | 676 | 840 | 221 | 118 | 95 | 3032 | 3032 |
| මහවැව | 3251 | 1700 | 2035 | 611 | 254 | 239 | 8090 | 8090 |
| මාතර | 1747 | 973 | 1223 | 345 | 197 | 164 | 4647 | 4649 |
| කොළඹ | 576 | 359 | 478 | 140 | 62 | 38 | 1653 | 1653 |
| තංගල්ල | 2505 | 1384 | 1622 | 407 | 198 | 166 | 6282 | 6282 |
| පුත්තලම | 2166 | 1156 | 1222 | 255 | 107 | 61 | 4967 | 4967 |
| මීගමුව | 2538 | 1597 | 2155 | 732 | 415 | 375 | 7812 | 7812 |
| මඩකලපුව | 2230 | 1360 | 1603 | 544 | 259 | 262 | 6258 | 6258 |
| ත්‍රිකුණාමලය | 654 | 516 | 550 | 129 | 81 | 78 | 2008 | 2008 |
| මන්නාරම | 1991 | 1145 | 1208 | 387 | 199 | 199 | 4938 | 5129 |
| කල්මුනේ | 1564 | 1108 | 1513 | 478 | 242 | 206 | 5095 | 5111 |
| මුලතිව් | 88 | 79 | 141 | 50 | 27 | 44 | 429 | 429 |
| කිලිනොච්චි | 519 | 340 | 540 | 250 | 185 | 183 | 2017 | 2017 |
| යාපනය | 2091 | 1037 | 1360 | 633 | 360 | 576 | 6057 | 6057 |
| | | | | | | | | ***66561*** |
| **මිරිදිය ධීවර ජලාශ** | | | | | | | | |
| නුවරඑළිය | 29 | 28 | 47 | 7 | 1 | 3 | 115 | 115 |
| පොළොන්නරුව | 45 | 35 | 27 | 11 | 2 | 1 | 121 | 121 |
| රත්නපුර | 27 | 15 | 9 | 1 | 3 | | 55 | 55 |
| මොණරාගල | 17 | 14 | 10 | 1 | | | 42 | 42 |
| කුරුණෑගල | 45 | 24 | 24 | 1 | | 2 | 96 | 96 |
| අනුරාධපුර | 169 | 81 | 84 | 17 | 7 | 5 | 363 | 363 |
| මාතලේ | 31 | 14 | 23 | 5 | 2 | 3 | 78 | 78 |
| නුවර | 13 | 12 | 25 | 5 | 3 | 3 | 61 | 61 |
| කෑගල්ල | 1 | 1 | 2 | | | | 4 | 4 |
| බදුල්ල | 59 | 33 | 33 | 3 | | 3 | 131 | 131 |
| වව්නියා | 59 | 33 | 41 | 15 | 4 | | 152 | 152 |
| මඩකලපුව මිරිදිය | 84 | 52 | 67 | 27 | 20 | 25 | 275 | 275 |
| එකතුව | | | | | | | | *1493* |
| මුළු එකතුව | **24794** | **14493** | **17654** | **5472** | **2851** | **2790** | **67845** | **68054** |

## ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

## 2012 වර්ෂය තුළ මරණ / බෙලහීනතා පාරිතෝෂික ගෙවීම්

| | දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කොට්ඨාශය | මරණ පාරිතෝෂික ගෙවීම් | | | බෙලහීනතා ගෙවීම් | | |
|---|---|---|---|---|---|---|---|
| | | දායක සංඛ්‍යාව | මුදල | | පූර්ණ | අර්ධ | මුදල |
| 1 | කළුතර | - | - | | - | - | - |
| 2 | ගාල්ල | 2 | 14,000.00 | | - | - | - |
| 3 | මහවැව | 3 | 38,000.00 | | | - | - |
| 4 | මාතර | 8 | 121,000.00 | | - | - | - |
| 5 | කොළඹ | 1 | 10,000.00 | | - | - | - |
| 6 | තංගල්ල | 1 | 10,000.00 | | - | - | - |
| 7 | පුත්තලම | - | - | | - | - | - |
| 8 | මීගමුව | 9 | 89,000.00 | | - | - | - |
| 9 | මඩකලපුව | 2 | 16,000.00 | | - | - | - |
| 10 | ත්‍රිකුණාමලය | - | - | | - | - | - |
| 11 | මන්නාරම | 3 | 38,000.00 | | - | - | - |
| 12 | කල්මුණේ | 5 | 63,000.00 | | - | - | - |
| 13 | මුලතිව් | 1 | 6,000.00 | | - | - | - |
| 14 | කිලිනොච්චි | 18 | 358,000.00 | | - | - | - |
| 15 | යාපනය | 10 | 126,000.00 | | - | - | - |
| | **මිරිදිය ධීවර ජලාශ** | | | | | | |
| 16 | නුවරඑළිය | - | - | | - | - | - |
| 17 | පොළොන්නරුව | - | - | | - | - | - |
| 18 | රත්නපුර | - | - | | - | - | - |
| 19 | මොණරාගල | - | - | | - | - | - |
| 20 | කුරුණෑගල | - | - | | - | - | - |
| 21 | අනුරාධපුර | - | - | | - | - | - |
| 22 | මාතලේ | - | - | | - | - | - |
| 23 | නුවර | - | - | | - | - | - |
| 24 | කෑගල්ල | - | - | | - | - | - |
| 25 | බදුල්ල | - | - | | - | - | - |
| 26 | වව්නියා | - | - | | - | - | - |
| 27 | මඩකලපුව මිරිදිය | 2 | 30,000.00 | | - | - | - |
| | එකතුව | 65 | 919,000.00 | | - | - | - |

## ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

### ධීවර විශ්‍රාම වැටුප් ගෙවීම - 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා

| දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කොට්ඨාශය | විශ්‍රාම වැටුප් ගෙවීම | | තැපැල් කාර්යාල සංඛ්‍යාව |
|---|---|---|---|
| | දායක සංඛ්‍යාව | මුදල | |
| කළුතර | 61 | 846,222.00 | 13 |
| ගාල්ල | 78 | 1,039,418.00 | 22 |
| මහවැව | 223 | 3,077,496.00 | 21 |
| මාතර | 227 | 2,989,928.00 | 18 |
| කොළඹ | 39 | 504,448.00 | 10 |
| තංගල්ල | 123 | 1,671,338.00 | 27 |
| පුත්තලම | 33 | 466,238.00 | 11 |
| මීගමුව | 395 | 5,361,791.00 | 33 |
| මඩකලපුව | 230 | 2,974,732.00 | 57 |
| ත්‍රිකුණාමලය | 62 | 837,826.00 | 14 |
| මන්නාරම | 196 | 2,472,204.00 | 16 |
| කල්මුනේ | 225 | 3,037,228.00 | 37 |
| මුලතිව් | - | | - |
| කිලිනොච්චි | 21 | 712,442.00 | 12 |
| යාපනය | 240 | 4,319,082.00 | 43 |
| **මිරිදිය ධීවර ජලාශ** | | | |
| නුවරඑළිය | 8 | 117,004.00 | 3 |
| පොළොන්නරුව | 1 | 12,000.00 | 1 |
| රත්නපුර | 1 | 14,196.00 | 1 |
| මොණරාගල | - | 8,000.00 | 1 |
| කුරුණෑගල | 1 | 14,004.00 | 1 |
| අනුරාධපුර | 2 | 26,798.00 | 3 |
| මාතලේ | 4 | 52,476.00 | 4 |
| නුවර | 3 | 39,000.00 | 3 |
| කෑගල්ල | - | | - |
| බදුල්ල | 2 | 24,000.00 | 2 |
| වව්නියා | - | | - |
| මඩකලපුව මිරිදිය | 10 | 125,996.00 | 6 |
| එකතුව | 2185 | 30,743,867.00 | 359 |

# පරිපාලන හා මානව සම්පත් අංශය



Back

# පරිපාලන හා මානව සම්පත් අංශය

**කාර්ය මණ්ඩලය**

2012.12.31 දිනට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

**කාර්ය මණ්ඩල සංයුතිය**

| සේවා ගණය | තනතුරු නාමය | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ | | | | |
| HM | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | - |
| HM | අධ්‍යක්ෂ | 5 | 1 | 4 |
| කළමනාකරණ | | | | |
| MM | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | 45 | 32 | 13 |
| කනිෂ්ඨ කළමනාකරණ | | | | |
| JM | පරිපාලන නිලධාරි | 2 | - | 2 |
| | පද්ධති පරිපාලක | 1 | - | 1 |
| | මූල්‍ය නිලධාරි | 1 | - | 1 |
| | සැලසුම් නිලධාරි | 1 | - | 1 |
| ආශ්‍රිත නිලධාරි | | | | |
| ASS.O | සංවර්ධන නිලධාරි | 55 | 38 | 17 |
| | සැපයුම් නිලධාරි | 1 | 1 | - |
| | අභ්‍යන්තර විගණන නිලධාරි | 1 | - | 1 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික) | | | | |
| MA - Tech | ප්‍රවාහන සහකාර | 1 | 1 | - |
| | ලේකම් | 1 | - | 1 |
| | පොත් තබන්නා | 4 | 1 | 3 |
| | මෘදුකාංග/දෘඩාංග කාර්මික ශිල්පී | 1 | - | 1 |
| | කාර්මික ශිල්පී (ශ්‍රව්‍ය/දෘශ්‍ය) | 1 | - | 1 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | | | | |
| MA - NonTech | කළමනාකරණ සහකාර | 220 | 175 | 45 |
| ප්‍රාථමික (ශිල්පීය) | | | | |
| PL - Skilled | රියදුරු | 38 | 22 | 16 |
| ප්‍රාථමික (ශිල්පීය නොවන) | | | | |
| PL - Non Skilled | කාර්යාල සහායක | 42 | 34 | 8 |
| | | **421** | **306** | **115** |

# 2012.12.31 දිනට කාර්ය මණ්ඩල විශ්ලේෂණය

## කාර්යය මණ්ඩලයේ ස්ත්‍රී /පුරුෂ විශ්ලේෂණය




පුරුෂ - 190

ස්ත්‍රී - 116

එකතුව - 306

## වයස් විශ්ලේෂණය

| වයස් කාණ්ඩය | සේවක සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 56 - 60 | 7 | 2% |
| 51 – 55 | 80 | 26% |
| 46 – 50 | 60 | 20% |
| 41 – 45 | 35 | 11% |
| 36 – 40 | 49 | 16% |
| 31 – 35 | 48 | 16% |
| 30 ට අඩු | 27 | 9% |
| එකතුව | 306 | 100% |




## සේවා කාලය අනුව විශ්ලේෂණය

| අවුරුදු | සේවක සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 30ට වැඩි | 10 | 2% |
| 26 – 30 | 40 | 14% |
| 21 – 25 | 72 | 23% |
| 16 – 20 | 26 | 8% |
| 15ට අඩු | 158 | 53% |
| එකතුව | 306 | 100% |




## 2012 වර්ෂය තුළ විශ්‍රාම යාම් හා සේවයෙන් ඉවත්වීම්

පුරුෂ - 10

ස්ත්‍රී - 07

එකතුව - 17

## 2012 වර්ෂය තුළ බඳවා ගැනීම් හා උසස් කිරීම්

බාහිර බඳවා ගැනීම් - නැත

අභ්‍යන්තර බඳවා ගැනීම් - 04

උසස් වීම් - 01

**<u>සේවක පුහුණු හා අධ්‍යාපන කටයුතු</u>**

2012 වසර තුළ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ මිලෝදා ආයතනයේ වැටුප් ලේඛන සකස් කිරීමේ කෙටිකාලීන පාඨමාලාව සඳහා චන්ද්‍රිකා කුලරත්න මිය හා ආර්.පී.ලියනගේ මියද සහභාගී කරවන ලද අතර, ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ හයිබ්‍රිඩ් වාහන තාක්ෂණ කෙටි කාලීන පුහුණු වැඩසටහනක් සඳහා ප්‍රවාහන සහකාර කල්ප රොෂාන් ගුණතිලක මහතාද සහභාගී කරවන ලදී.

**<u>සේවක සුභසාධනය</u>**

මණ්ඩලයේ සේවකයින් සඳහා උදේ, සවස තේ සැපයීමේ වැඩපිළිවෙල හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය පෙර වර්ෂයේදී මෙන් මෙම වර්ෂය තුළද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මීට අතිරේකව මණ්ඩලයේ සේවකයින්ගෙන් සැදුම් ලත් ක්‍රිකට් සමාජය විසින් 2012 මැයි මාසයේදී දිස්ත්‍රික් කාර්යාල කණ්ඩායම හා ප්‍රධාන කාර්යාල කණ්ඩායම අතර ප්‍රදර්ශන ක්‍රිකට් තරගයක්ද, කුරුණෑගල මහජන බැංකුව දිස්ත්‍රික් කණ්ඩායම සමඟ සුහද ක්‍රිකට් තරගයක්ද, ලංකා පොහොර සංස්ථාවේ ක්‍රිකට් කණ්ඩායම සමඟ සුහද ක්‍රිකට් තරගයක්ද සංවිධානය කරන ලදී. තවද 2012 බක්මහ උළෙල සියළුම දිස්ත්‍රික් කාර්ය මණ්ඩල සහභාගීත්වයෙන් 2012 අප්‍රේල් මස 28 දින පවත්වන ලදී.

**<u>ප්‍රසම්පාදන හා ප්‍රවාහන ක්ෂෙත්‍රය</u>**

2011 වර්ෂය තුළදී ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල අවශ්‍යතා වෙනුවෙන් කාර්යාල උපකරණ හා ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම මෙන්ම ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම් පෙර වර්ෂ වලදී මෙන්ම කාර්යාල අවශ්‍යතා පරිදි සිදු කරන ලදී. මෙම වසර තුළ මණ්ඩලයේ වාහන සංචිතයට අයත් වාහනවල එදිනෙදා අලුත්වැඩියාවන් හා වාර සේවාවන් හැර වාහන මිලදී ගැනීම් වැනි කිසිවක් සිදු නොවීය.

**<u>කාර්යාල ගොඩනැගිලි</u>**

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය 2011 වසරේදී මෙන්ම මෙම වසර තුලදීද නො:117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ ලිපිනයේ පිහිටි ගොඩනැගිල්ලේ පවත්වාගෙන යන ලදී. මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල 26ක් පවත්වාගෙන යනු ලබන අතර, ඉන් මණ්ඩලයට අයත් ගොඩනැගිලි 06කි. අනෙක් කාර්යාල මාසික කුලී පදනම මත රාජ්‍ය හා පෞද්ගලික ගොඩනැගිලි තුළ තව දුරටත් පවත්වාගෙන යනු ලබේ.

## සේවක විනය කටයුතු

මණ්ඩලය විසින් හා මණ්ඩලයට එරෙහිව පවරා ඇති නඩු සම්බන්ධයෙන් 2012 වර්ෂය තුල ක්‍රියාකාරීත්වය පහත සඳහන් පරිදි විය.

1-වැඩ තහනමට ලක්ව සිටින ක්ෂේත්‍ර නිලධාරී ජී.එල්.ජී.ශාන්ත කුමාර මයාට එරෙහිව ත්‍රිකුණාමලය මහාධිකරණයේ පවරා තිබූ HCT/33/2004(T) නඩුව අවසන් විය.

2-වැඩ තහනමට ලක්ව සිටින ක්ෂේත්‍ර නිලධාරි කේ.බී.කරුණානන්ද මයාට එරෙහිව කෑගල්ල මහාධිකරණයේ පවරා තිබූ HC 2327/06 නඩුව අවසන් විය.

3-ලිපිකරු කේ.ඒ.සුදත් බණ්ඩාර මයාට එරෙහිව පවරා ඇති B/520/03 නඩුව හා ක්ෂේත්‍ර නිලධාරී කේ.ඒ.හීන්බණ්ඩාර මයාට එරෙහිව පවරා තිබූ B/2171/2 නඩුව අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයේදී විභාග වෙමින් පවතී.

4-වැඩ තහනමට ලක්ව සිටින ක්ෂේත්‍ර නිලධාරී ඩබ්.බී.එල්.සුසිල් ප්‍රේමරත්න මයාට එරෙහිව අනුරාධපුර මහාධිකරණයේ පවරා ඇති HC/05 2009 නඩුව වගඋත්තරකාර ක්ෂේත්‍ර නිලධාරි සුසිල් ප්‍රේමරත්න මහතා 2011.11.28 දින මිය ගොස් ඇති බැවින් අවසන් කර ඇත.

5-මහනුවර දිස්ත්‍රික් කාර්යාලයේ සිදුවී ඇති ගොවි විශ්‍රාම වැටුප් වාර මුදල් වංචා කිරීමේ සිද්ධියට අදාළව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති B 3012/නඩුව විභාග වෙමින් පවතී.

6-සේවයෙන් ඉවත් කරනු ලැබ ඇති එම්.අයි.එම්.ඉල්ලියාස් මයා විසින් පවරා ඇති 23/කු/6833/98 නඩුවේ අභියාචනා පෙත්සම කුරුණෑගල සිවිල් අභියාචනා මහාධිකරණයේදි විභාග වෙමින් පවතී.

7-මණ්ඩලය විසින් ලංකා බැංකුවට එරෙහිව පවරනු ලැබ ඇති 21843,21844 හා 21845 දරණ නඩුවල ඒකාබද්ධ නියෝගයට එරෙහිව ලංකා බැංකුව ගොනු කර ඇති WP/HCCA/Col 312/2003 (f) දරණ අභියාචනා පෙත්සම සිවිල් අභියාචනා මහාධිකරණයේදී විභාග වෙමින් පවතී.

8-මහේෂි දිලිනි බුද්ධිකා මෙය පුහුණුව අවසන් කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයට එරෙහිව ඇඹිලිපිටිය කම්කරු විනිශ්චය සභාවේ පවරා ඇති 6ඊ/7030/1/1 දරණ නඩුව විභාග වෙමින් පවතී.

9-ආර්.පී.බන්දුමතී මිය වයස අවු.57න් විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් මණ්ඩලයට එරෙහිව කොළඹ සිවිල් අභියාචනාධිකරණයේ පවරා ඇති CA555/11 දරණ නඩුව නිෂ්ප්‍රභාවී ඇත.

10-සහකාර අධ්‍යක්ෂ ඒ.එල්.ඩී.පී.එස්.අඹේපිටිය මහතා මහරගම කම්කරු විනිශ්චය සභාවේ පවරා තිබූ අංක 33/1007/2011 නඩුව ඉල්ලුම්කරු විසින් ඉවත් කර ගැනීම නිසා අවසන් විය .

11-සහකාර අධ්‍යක්ෂ එච්.සුරංග විතානගේ මහතා ඇඹිලිපිටිය කම්කරු විනිශ්චය සභාවේ පවරා තිබූ අංක 6ඊ/7079/11 නඩුව ඉල්ලුම්කරු විසින් ඉවත් කර ගැනීම නිසා අවසන් විය .

# අභ්‍යන්තර විගණන අංශය



Back

අභ්‍යන්තර විගණන අංශය

2012 වර්ෂය සඳහා, මණ්ඩලයේ ක්‍රියාත්මක යෝජනා ක්‍රම සඳහා ඒ ඒ අංශ සහ දිස්ත්‍රික් කාර්යාල අනුව පිළියෙල කරන ලද වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහන පරිදි අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, මණ්ඩලයේ ක්‍රියාත්මක යෝජනා ක්‍රම වෙනුවෙන්, ප්‍රධාන කාර්යාලීය හා දිස්ත්‍රික් කාර්යාලීය මට්ටමින්, දිස්ත්‍රික් කාර්යාල (26) භූගෝලීය ව්‍යාප්තිය සහ මෙම අංශයේ සීමිත මානව සම්පත් (නියෝජ්‍ය අධ්‍යක්ෂ, අභ්‍ය. විගණන නිළධාරී, විගණන ලිපිකරු, ලිපිකරු) ප්‍රමාණය මත වුවද පුහුණු වන්නන්ගේ සේවය ලබාගෙන අභ්‍යන්තර විගණන පරීක්ෂණ 68 ක් සිදුකරන ලදී.

එමෙන්ම, මණ්ඩලයේ සියළුම අංශ සහ දිස්ත්‍රික් කාර්යාල කටයුතු (ආවරණය වන පරිදි) වල ක්‍රියාත්මක පාලන ක්‍රම පිළිබඳව ඒවායේ ප්‍රමාණාත්මකභාවය හා ක්‍රියාකාරීත්වය ඇගයීම් කරමින් පහත ක්ෂේත්‍රයන් යටතේ අභ්‍යන්තර විගණන පරීක්ෂණ සිදුකරන ලදී.

පාලන අංශය සඳහා, පාරිතෝෂික ගෙවීම්, සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ගෙවීම්, දිස්ත්‍රික් කාර්යාලීය පැමිණීම, නිවාඩු තොග ලේඛණ පවත්වා ගැනීම, චෙක්පත් ලැබීම් හා බැංකු ගත කිරීම්, ණය මුදල් නිකුත් කිරීම, අය නොවන ආපදා ණය ශේෂ අයකර ගැනීම, වැටුප් පියවරෙහි පිහිටුවීම්, පැමිණීම හා නිවාඩු, දිස්ත්‍රික් කාර්යාලයීය පැමිණීම/ නිවාඩු වාර්තා එවීම. අත්තිකාරම් පියවීම් පරීක්‍ෂණ කටයුතු සිදුකර ඇත.

මීට අමතරව, අතිකාල ගමන් වියදම් ගෙවීම, විදුලි බිල්පත් ගෙවීම, ධාවන සටහන්, වාහන නඩත්තු කිරීම (ලොග් පොත්), වත්කම් වල අයිතිය තහවුරු කර ගැනීම, ගබඩා කටයුතු, නව බඳවා ගැනීම් පටිපාටිය, සේවක බඳවා ගැනීම්, පාරිතෝෂික සඳහා වෙන් කිරීම්, වාහන අළුත් වැඩියාව සහ නීතිමය කටයුතු, යන පරීක්‍ෂණ කටයුතු සිදුකරන ලදී.

මුදල් අංශයේ කටයුතු වලට අදාළව, මුදල් පොත් හා බැංකු සැසඳුම් පරීක්ෂාවන් යටතේ ණය සහ අත්තිකාරම් ගිණුම, සුවසෙත රක්ෂණ ගිණුම, පශු සම්පත් රක්ෂණ ගිණුම, ප්‍රාග්ධන ගිණුම, මරණ බෙලහීන වන්දි ගිණුම, කෘෂි රක්ෂණ පරිපාලන ගිණුම, ගොවි විශ්‍රාම වැටුප් පරිපාලන ගිණුම, ගොවි විශ්‍රාම වැටුප් රැස්කිරීමේ ගිණුම, ධීවර විශ්‍රාම වැටුප් පරිපාලන ගිණුම, වෛද්‍යාධාර ගිණුම පරීක්‍ෂාකර ඇත.

මුදල් පොත් සහ ගෙවීම් වව්චර් පරීක්ෂාව යටතේ, ගොවි විශ්‍රාම වැටුප් පරිපාලන ගිණුම, ධීවර විශ්‍රාම වැටුප් පරිපාලන ගිණුම, කෘෂි රක්ෂණ පරිපාලන ගිණුම, ප්‍රාග්ධන ගිණුම, පශු සම්පත් රක්ෂණ වන්දි ගෙවීම, සුවසෙත රක්ෂණ ගිණුම, වී වගා රක්‍ෂණ වන්දි සහ අතිරේඛ බෝග වන්දි ගිණුම පරීක්‍ෂා කරන ලදී.

මීට අමතරව, පාරිතෝෂික සඳහා වෙන් කිරීම, ප්‍රග්ධන ප්‍රතිපාදන ලැබීම්, වී වගා රක්ෂණ වාර මුදල් අය වීම් ප්‍රේෂනය කිරීම, කුවිතාන්සි පොත් නිකුත් කිරීම්, පශු රක්‍ෂණ වාර මුදල් අය වීම් ප්‍රේෂනය කිරීම පරීක්‍ෂා කර ඇත. තවද, වත්කම් මිලදී ගැනීම, චෙක්පත් ලැබීම් බැංකු ගත කිරීම, නියෝජිත ආයතන මගින් පසු වාරික මුදල් අයකර ගැනීම්, පාරිතෝෂික ගෙවීම්, ණය ගෙවීම්, හිඟ ණය ශේෂ අය කර ගැනීම්, අත්තිකාරම් පියවීම් යන පරීක්‍ෂණ සිදුකර ඇත. දිස්ත්‍රික් පරිපාලන ගිණුම් යටතේ කෑගල්ල, මහනුවර, මඩකලපුව, බදුල්ල යන විගණන පරීක්‍ෂණ කටයුතුද සිදුකරන ලදී.

රක්‍ෂණ අංශයේ කටයුතු ආවරණය වන පරිදි, පශු රක්‍ෂණ යොජනා පත්‍ර හා වාරික මුදල් අයකිරීම ප්‍රේෂණය කිරීම, සුවසෙත රක්ෂණ වාර මුදල් අය කිරීම, අතිරේක භෝග වාරමුදල් අය කිරීම ප්‍රේෂණය කිරීම, ණය දෙන ආයතන මගින් රක්‍ෂණය කිරීම වාර මුදල් අයකිරීම ප්‍රේෂණය කිරීම, කුවිතාන්සි පොත් පාලනය යන පරීක්‍ෂණ කටයුතු සිදුකරන ලදී.තවද, පශු රක්‍ෂණ වන්දි හිමිකම් පරීක්ෂාව (රත්නපුර, මහනුවර, වවුනියාව) සුවසෙත රක්‍ෂණ ප්‍රතිලාභ ගෙවීම්, වී වගා රක්‍ෂණ වන්දි ගෙවීම්(හම්බන්තොට), බඩ ඉරිගු වන්දි ගෙවීම් (අනුරාධපුරය) යන පරීක්‍ෂණ කටයුතු සිදුකරන ලදී.

මෙහෙයුම් අංශයේ කටයුතු ආවරණය වන පරිදි ඉදිරි වැඩසටහන් ඉදිරිපත් කිරීම, ඉලක්ක ඉටු කිරීම දිස්ත්‍රික් කාර්ය මණ්ඩල ප්‍රගතිය, සමස්ථ ප්‍රගතිය (ක්‍රියාකාරී සැලැස්ම අනුව) පිළිබද පරීක්ෂා කිරීම යන පරීක්‍ෂණ කටයුතු සිදුකර ඇත.

විශ්‍රාම වැටුප් අංශයට අදාළව හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප් ආපසු ගෙන්වා ගැනීම, මරණ හා ප්‍රතිලාභ ගෙවීම, ගොවි විශ්‍රාම වැටුප් අත්හිටුවීමේ පටිපාටිය, අඛන්ඩව මාස 06ක් හිමිකම් නොපෑ සහ මිය ගිය ගොවි විශ්‍රාම වැටුප් ලාභින් හදුනා ගැනීම, ගොවි විශ්‍රාම වැටුප් පසු වාරික මුදල් අය කිරීම, (නියොජිත ආයතන මගින්, නිලධාරීන් මගින්) ධීවර විශ්‍රාම වැටුප් හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප් ලාභින් හදුනා ගැනීම, පරිපාලන වියදම් ගෙවීම් පිළිබද පරීක්‍ෂණ සිදුකරන ලදී.

දිස්ත්‍රික් කාර්යාල පරීක්‍ෂාව යටතේ හම්බන්තොට, මහනුවර, බදුල්ල දිස්ත්‍රික් කාර්යාල වල කටයුතු පරීක්‍ෂා කරන ලදී.

# මුදල් අංශය



Back

## මූල්‍ය සම්පිණ්ඩනය

2012 වර්ෂයේදී 2011 හා සැසඳීමේ දි කෘෂිරක්ෂණ යෝජනා ක්‍රමයේ ආදායමේ සුළු පසු බෑමක් පෙන්නුම් කරයි. 2011 දී රු.මි.157.4 ක් වූ වාරික ආදායම 2012 දී රු.මි. 124.7 ක් ලෙස සටහන් විය. එසේම මෙම වර්ෂය තුළ දී රු.මි.126.6 ක වන්දි ගෙවීමට සිදුවන නිසා ප්‍රවර්ථන වර්ෂය තුලදී යෝජනා ක්‍රමය ශුද්ධ අලාභදායී තත්වයක් ද පෙන්නුම් කරයි.

මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයද ප්‍රවර්ථන වර්ෂය තුළදී ද අර්බුදකාරී තත්වයකට මුහුණ පෑමට සිදු වූ අතර අරමුදල් සපයා ගැනීමට නොහැකි වූ නිසා 2012 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රමාද කිරීමට සිදු විය.

ලාභදායීත්වය

- කෘෂි රක්‍ෂණ යෝජනා ක්‍රමය

| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| මෙහෙයුම් වියදම(රු.මිලි) | 31.1 | 36.7 | 274.3 | 67.4 | 135.2 |
| වාරික රක්ෂණ ආදායම(රු.මිලි.) | 70.5 | 83.3 | 105.1 | 157.4 | 124.7 |




කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලයේ 2008 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ ප්‍රතිව්‍යුහගත වැඩ පිළිවෙලට අනුකූලව රක්‍ෂණ කටයුතු කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම නිසා 2007 වර්ෂයේදී පැවති කෘෂි රක්‍ෂණ ආදායම වූ රුපියල් මිලියන 27.7ක ප්‍රමාණය 2008 වර්ෂයේදී මිලියන 70.5 දක්වා වැඩි විය. එම වැඩපිළිවෙල අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම නිසා 2011 වර්ෂයේදී මෙම කෘෂි රක්ෂණ ආදායම වාර්තා ගත ලෙස රුපියල් මිලියන 157 දක්වා ඉහළ නංවා ගැනීමට හැකි වුවද මණ්ඩලය මුහුණ දුන් බැරෑරුම් තත්වය හමුවේ 2012 වර්ෂයේ දී කෘෂි රක්ෂණ ආදායම රු.මි.124.7 ක් ලෙස සුළු පසුබෑමකට ලක් වී ඇත.

**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය**

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|
| ආදායම | 501 | 431 | 282 | 154 | 110 | 58.1 |
| මෙහෙයුම් වියදම | 740 | 868 | 1016 | 1106 | 1282 | 1433 |




<u>**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය**</u>

| වර්ෂය ආරම්භයේ මුදල් හා බැංකු ශේෂය | 5,262,474.01 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | **2,459,103.54** |
| **වර්ෂය අවසානයේ මුදල් හා බැංකු ශේෂය** | |
| බැංකුවේ ඇති මුදල් 2012.12.31 | **2,459,103.54** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**<u>2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා</u>**

<u>වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

**01.** පොදු

**01.01.** ගිණුම් පිළියෙල කිරිමේ පදනම.

1. යෝජනා ක්‍රමයේ මුල්‍ය තත්ව ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, සමුච්ත අරමුදල වෙනස් විමේ වාර්තාව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය ගිණුම් ප්‍රතිපත්ති සහ ගිණුම් වලට අදාළ සටහන් පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව වේ.
2. යෝජනා ක්‍රමයේ මුල්‍ය වාර්තා පිළියෙළ කර ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනමට වේ.
3. උද්ධමන සාධකය මත වන බලපෑම් පිළිබඳව මුල්‍ය වාර්තාවල ගැලපිම් කර නැත.
4. යෝජනා ක්‍රමයේ සියලුම මුල්‍ය වාර්තා පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.
5. සියළුම මුල්‍ය ප්‍රකාශන 1987 අංක 27 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතට අනුකූලව පිළියෙල කර ඇත.
6. මුල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන්නේ අඛණ්ඩ පැවැත්ම සංකල්පයටය.

**01.02** ආදායම් බදු

මෙම යෝජනා ක්‍රමය 1990 වර්ෂයේ අංක 22 දරණ දේශිය ආදායම් පනත සහ ඊට පසු සංශෝධන අනුව ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

**01.03** සංසන්දනාත්මක තොරතුරු

යෝජනා ක්‍රමය මඟින් ගිණුම් ප්‍රතිපත්ති ඒකාකාරිව අනුගමනය කර ඇති අතර පෙර වසර වටිනාකම් සහ ප්‍රකාශ අවශ්‍ය තැන්හි දි ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම හා එකඟ වන පරිදි නැවත සකසා ඉදිරිපත් කර ඇත.

**01.04** ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් විම

වර්ෂ 1987 සිටම රාජ්‍ය ප්‍රග්ධන ප්‍රධානයන් ලෙස ගිණුම්ගත කර තිබුන අතර, 2011 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 අනුව ප්‍රාග්ධන ප්‍රදානයන් ගිණුම්ගත කරන ලදි.

**02.** වත්කම් සහ ඒවා අගය කිරිමේ පදනම

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ මුදල් හා බැංකු ශේෂයන් වර්ගීකරණය කර ඇති අතර අනෙකුත් ජංගම වත්කම් වර්ෂයක් හෝ ඊට අඩු කාලයක් තුල මෙහෙයුම් චක්‍රයේ දි මුදල් බවට පත්වන බව බලාපොරොත්තු වේ.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**<u>2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා</u>**

<u>වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

**02.01 දේපල, පිරියත හා උපකරණ ක්ෂය විම්.**

**02.01.01 දේපල පිරියත හා උපකරණ**

යන්ත්‍ර හා යන්ත්‍රාගාරය දේපල වටිනාකම සමුච්චිත ක්ෂය විම් අඩුකර පෙන්වා ඇත. දේපල, යන්ත්‍ර යන්ත්‍රාගාරය දේපල මිලදි ගැනිමේ පිරිවැය සහ වත්කම් ප්‍රයෝජනයට ගතහැකි තත්වයට ගෙන ඒමට දරණ ලද වියදම් වලින් සමන්විත වේ.

වත්කමක් අත්පත් කර ගැනීමට, වැඩිදියුණු කිරීමට, හෝ භාවිතාවට ගන්නා කාලය දීර්ඝ කිරීමට හෝ සේවා ලබාගන්නා කාලය වැඩිකිරිමට, ධාරිතාවය වැඩි කිරිමට දරණ ලද සියළුම වියදම් ප්‍රාග්ධන වියදම් වලට ඇතුලත් වේ.

ප්‍රමාණාත්මක භෞතික වත්කම් මණ්ඩලය සතු නොවන බැවින් LKRS ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුව ප්‍රත්‍යාගණනය සිදුකර නොමැත.

**02.01.02 ක්ෂය වීම්**

වත්කම් ක්ෂය කිරිම සරළ මාර්ග ක්‍රමය යටතේ පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| මෝටර් රථ | 20% |
| ලී බඩු හා සවි කිරිම් | 10% |
| කාර්යාල උපකරණ | 10% |
| ප්‍රචාරණ උපකරණ | 10% |
| සුභසාධක උපකරණ | 10% |
| වායු සමීකරණ | 20% |
| පරිගණක | 20% |

2009 ජනවාරි 01 දිනට ප්‍රථමව මිලදි ගන්නා ලද වත්කම් සඳහා අදාල වත්කම් ඉවත් කරන වර්ෂයේදි ක්ෂය කිරිම නොකරන අතර වත්කම් මිලදි ගන්නා /පවරා ගන්නා වර්ෂයේදී මුළු වර්ෂය සඳහාම ක්ෂය කිරීම කරනු ලබයි. 2009 ජනවාරි 01 දිනට පසුව මිලදි ගන්නා ලද වත්කම් සඳහා වත්කම මිලදි ගන්නා / පවරා ගත් මාසයේ සිටම ක්ෂය කිරීම කරනු ලබයි.

**02.02.** **ආයෝජන**

භාණ්ඩාගාර බිල්පත් වල හා ස්ථාවර වත්කම් ආයෝජන පෙන්වා ඇත්තේ පිරිවැය අගයට වේ.

**02.03.** **තොගය**

තොගයේ අගය පෙන්වා ඇත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධිත අගය යන දෙකෙන් අඩු අගයට වේ.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**<u>2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා</u>**

**<u>වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>**

**02.04** **ලැබිය යුතු ගිණුම්**

මාවිල්ආරු වන්දිගෙවීම වෙනුවෙන් මහාභාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු. 120,198,876.76 මුදල මහාභාණ්ඩාගාරයෙන් ලැබු ප්‍රතිපාදනයන්ගෙන් හිලව් කර ඇත.

**03.** **වගකිම් හා වෙන් කිරිම.**

**03.01** ශේෂ පත්‍ර දින සිට වර්ෂයක් ඇතුලත ගෙවා අවසන් වන ආකාරයට ශේෂ පත්‍රයේ සඳහන් වගකීම් ජංගම වගකිම් ලෙස වර්ගීකරණය කර ඇත.

ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇත්තේ ශේෂ පත්‍ර දින සිට වර්ෂයකට පසුව ගෙවීමට සිදුවන වගකීම් වේ.

හඳුනාගත හැකි සියළුම වගකීම් ගිණුම් වාර්තා පිළියෙල කිරිමේ දි සැලකිල්ලට ගෙන ඇත.

**03.02** **විශ්‍රාම ප්‍රතිලාභ**

විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 අනුව මණ්ඩලයේ ස්ථිර සේවයේ වර්ෂයක් සම්පූර්ණ වූ සියලු සේවකයින් සඳහා පාරිතෝෂික වෙන් කිරිම් සිදුකර තිබේ. කෙසේ වෙතත් 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත අනුව පාරිතෝෂික හිඟවීම් ඇති වනුයේ අඛණ්ඩව සේවා කාලය වර්ෂ 5 ක් සම්පූර්ණ කල පසුවය. සත්‍ය වගකිම බාහිරව මූල්‍යනය කර නොමැත.

**03.03** **ගොවි විශ්‍රාම වැටුප් වගකීම**

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ මුළු වගකීමේ වර්තමාන අගය ගිණුම්ගත කර ඇත.

**04.** **ප්‍රාග්ධන හා සංචිත**

**04.01** **ගොවි විශ්‍රාම වැටුප් අරමුදල**

ජීව ගණක ගණනයන්ට අනුව යෝජනා ක්‍රමයේ මුළු වගකීම් ගිණුම්ගත කර ඇත.

ILO ආයතනය මගින් සිදුකරන ලද අධ්‍යනයට අනුව යෝජනා ක්‍රමයේ මුළු වගකීමේ වර්තමාන අගය රු.බි. 29.5 කි.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**05. ආදායම් හා වියදම් ගිණුම්.**

**05.01 ආදායම්.**

01. යෝජනා ක්‍රමයේ ආදායම් නියෝජනය වන්නේ විශ්‍රාම වැටුප් දායක වාරික, භාණ්ඩාගාර බිල්පත් / බැඳුම්කර සේවක ණය මත පොලිය සහ අනෙකුත් විවිධ ආදායම් වලින් වේ.

02. සියළුම වාරමුදල් ආදායම් මුදල් පදනම මත හඳුනාගෙන ඇත.

03. 2012 වර්ෂය තුල පුනරාවර්ථන වියදම් සහ ප්‍රග්ධන වියදම් සඳහා රාජ්‍ය ප්‍රදානයන් ලැබී ඇත.

**05.02 අදායම් හඳුනාගැනිම**

01. දායකයින් බඳවා ගන්නා අවස්ථාවේ දී අයකරන වාරික මුදල, ආදායම ලෙස හඳුනා ගෙන ඇත.

02. ඉහත සඳහන් කල ආදායම මුදල් පදනම මත සම්බන්ධිත වියදම් සමඟ ගලපා ඇත.

03. පොළී ආදායම් කාල පදනම මත උපචිත පදනමට ගෙන ඇත.

**05.03 වියදම.**

A. වර්ෂයේ අතිරික්ත හෝ ඌනතාවය ගණනය කිරිමේ දි ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරකම් සඳහා දරා ඇති සියළුම වියදම්, ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම, ආදායමට එරෙහිව උපචිත පදනමට ගෙන ගණනය කර ඇත.

B. වක්‍ර වියදම් පහත සඳහන් ප්‍රතිශතයන් මත ගණනය කර ඇත. මෙම ප්‍රතිශතයන් අංක 401/04 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවෙන් අනුමත කර ඇත.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| වියදම | අනුපාත |
|---|---|
| වැටුප්, අර්ථ සාධක, සේවක භාරකාර, පාරිතෝෂික | 50% |
| වෛද්‍යාධාර වියදම් | 50% |
| උපදේශණ ගාස්තු | 40% |
| සුභසාධක වියදම | 50% |
| නිල ඇඳුම් | 48% |
| සංග්‍රහ දිමනා | 40% |
| මුද්‍රණ වියදම් | 40% |
| නීති වියදම් | 40% |
| දැනුවත් කිරිමේ හා පුහුණු වියදම් | 20% |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 40% |
| ගෙවල් කුලි හා දුරකථන | 40% |
| තැපැල් ගාස්තු | 55% |
| විදුලිය | 40% |
| ගමන් වියදම් , අතිකාල | 50% |
| ජල ගාස්තු | 40% |
| දෛනික වැටුප් | 50% |
| ආරක්ෂක ගාස්තු | 20% |
| කාර්යාල උපකරණ නඩත්තු | 20% |
| මෝටර් වාහන නඩත්තු | 40% |
| පරිගණක වියදම් | 40% |
| ඉන්ධන | 30% |

| | |
|---|---|
| ගොඩනැගිලි නඩත්තු වියදම් | 40% |
| ලිපිද්‍රව්‍ය | 48% |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**06. රාජ්‍ය ප්‍රදාන**

රාජ්‍ය ප්‍රදානයන් ක්‍රමානුකූල පදනමක් යටතේ ආදායම් ලෙස හඳුනාගෙන ඇත.

**07. අසම්භාවයන්**

මාවිල්ආරු වන්දි ගෙවීමේ දි රුපියල් මිලියන 07 වංචනික ලෙස භාවිතා කිරිම සම්බන්ධයෙන් මණ්ඩලයේ නිලධාරීන් තිදෙනෙකුට කොළඹ අධිකරණයේ දි නඩුවක් විභාගවෙමින් පවති.

**08. මුදල් ප්‍රවාහ ප්‍රකාශය.**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 07ට අනුකූලව වක්‍ර ක්‍රමය උපයෝගි කරගෙන වේ.

**09. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්.**

සියළුම ප්‍රමාණාත්මක ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර, අවශ්‍ය තැන් වලදි ගැලපීම් කර සහ හෙළිදරව් කිරිම් කර ඇත.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සටහන 01

2012 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණ

| විස්තරය | මෝටර් වාහන | කාර්යාල උපකරන | සුභසාධක උපකරන | ලී බඩු හා සවිකිරීම් | වායු සමීකරන | පරිගණක | ප්‍රචාරක උපකරන | පරිගනක මෘදුකාංග | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2012 ජනවාරි 1 දිනට පිරිවැය | 833637 | 1620558.04 | 22330.75 | 819738.53 | 360136.62 | 24519248.94 | 422837.14 | 0 | 28598487.02 |
| එකතුකලා 2012 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1475000 | 1475000 |
| අඩු කල ඉවත් කිරීම් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| මුළු පිරිවැය | 833637 | 1620558.04 | 22330.75 | 819738.53 | 360136.62 | 24519248.94 | 422837.14 | 1475000 | 30073487.02 |
| ක්ෂයවීම් අනුපාත | 0.2 | 0.1 | 0.1 | 0.1 | 0.2 | 0.2 | 0.1 | 0.2 | |
| 2012 ජනවාරි 1 දිනට | | | | | | | | | |
| සමුච්චිත ක්ෂය | 833637 | 1563844.52 | 14938.55 | 664638.53 | 360136.62 | 22781068.79 | 422837.14 | 0 | 26641101.15 |
| අඩු කල ඉවත් කිරීම් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 2012 වර්ෂය සඳහා ක්ෂය කිරිම | 0 | 32951.64 | 1514.075 | 32732.4 | 0 | 958750.6 | 0 | 295000 | 1320948.715 |
| | 0 | 0 | 0 | 0 | 0 | | | | |
| මුළු ක්ෂය | 833637 | 1596796.16 | 16452.625 | 697370.93 | 360136.62 | 23739819.39 | 422837.14 | 295000 | 27962049.87 |
| ශුද්ධ වටිනාකම | 0 | 23761.88 | 5878.125 | 122367.6 | 0 | 779429.55 | 0 | 1180000 | 2111437.145 |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

## *2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සටහන්*

| | 31.12.2012<br>Rs. Cts. | 31.12.2011<br>Rs. Cts. |
|---|---|---|
| **සටහන් 2 - තොගය** | | |
| මුද්‍රණ ද්‍රව්‍ය | 2,890,153.97 | 2,877,591.66 |
| ලිපි ද්‍රව්‍ය තොගය | 46,095.64 | 32,464.93 |
| | **2,936,249.61** | **2,910,056.59** |
| **සටහන් 3 - ලැබිය යුතු දෑ** | | |
| ප්‍රචාරක අත්තිකාරම් | - | 20,427.30 |
| ලැබිය යුතු අයදුම්පත් ගාස්තු | - | 3,887.25 |
| රක්ෂිරිමේ නියෝජිතයන්ගෙන් ලැබිය යුතු දෑ | 774,479.20 | 774,479.20 |
| ගමන් වියදම් අත්තිකාරම් | - | 57,333.00 |
| උපයන විට ගෙවීම් සඳහා ලැබිය යුතු පොළී | - | 57,036.00 |
| දිස්ත්‍රික් මරණ පාරිතෝෂික අත්තිකාරම් | 15,000.00 | 15,000.00 |
| මිශ්‍ර අත්තිකාරම් | - | 152,224.81 |
| ගොවිජන පොළ | - | 3,500,000.00 |
| අමාත්‍යාංශ ණය | - | 300,000.00 |
| භාණ්ඩාගාර ණය (මාවිල් ආරු) | - | 120,198,876.75 |
| | **789,479.20** | **125,079,264.31** |
| **සටහන 4 - ලැබිය යුතු පොළී** | | |
| භාණ්ඩාගාර බිල්පත් - මහජන බැංකුව | 23,013.70 | 22,142.17 |
| භාණ්ඩාගාර බිල්පත් - ලංකා බැංකුව | 6,605.19 | 45,672.41 |
| | **29,618.89** | **67,814.58** |
| **සටහන් 5 - ලැබිය යුතු ආදායම්** | | |
| ගොවීන්ගේ දායකත්වය | 3,911,252.75 | 7,960,380.45 |
| ජීවිත රක්ෂණ වාර මුදල සඳහා ගොවීන්ගේ දායකත්වය | 495,180.00 | 916,710.00 |
| පරිපාලන අදායම් සඳහා ගොවීන්ගේ දායකත්වය | 247,590.00 | 458,355.00 |
| | **4,654,022.75** | **9,335,445.45** |
| **සටහන 6 - ආයෝජන** | | |
| භාණ්ඩාගාර බිල්පත් - මහජන බැංකුව | 11,400,000.00 | 29,900,000.00 |
| භාණ්ඩාගාර බිල්පත් - ලංකා බැංකුව | 1,070,000.00 | 821,383.80 |
| | **12,470,000.00** | **30,721,383.80** |
| **සටහන 7 - බැංකුවේ ඇති මුදල්** | | |
| ගිණුම් අංක 100150112345 - මහජන බැංකුව යුනියන් පෙදෙස | 1,700,369.58 | 3,341,136.88 |
| ගිණුම් අංක 100180112344 - මහජන බැංකුව යුනියන් පෙදෙස | 141,103.29 | 200,829.67 |
| ගිණුම් අංක 100130112351 - මහජන බැංකුව යුනියන් පෙදෙස | 75,269.05 | 243,440.69 |
| ගිණුම් අංක 100110112347 - මහජන බැංකුව යුනියන් පෙදෙස | 426,582.33 | 1,340,882.13 |
| ගිණුම් අංක 7979475 - ලංකා බැංකුව ආයතනික ශාඛාව | 111,620.53 | 112,120.53 |
| ගිණුම් අංක 8403704 - ලංකා බැංකුව යුනියන් පෙදෙස | 4,158.76 | 24,064.11 |
| | **2,459,103.54** | **5,262,474.01** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

## *2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සටහන්*

| | 31.12.2012 | 31.12.2011 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |

**සටහන 08 - ගොවි විශ්‍රාම වැටුප් අරමුදල**

| | 31.12.2012 | 31.12.2011 |
|---|---|---|
| ඉ/ගෙ ශේෂය | (44,154,270,181.96) | (40,536,699,624.79) |
| අනාගත විශ්‍රාම වැටුප් වගකීමේ වර්තමාන අගය | - | - |
| | **(44,154,270,181.96)** | **(40,536,699,624.79)** |
| එකතු / අඩුකල | | |
| ආදායම් ඉක්මවූ මුළු වියදම් | (4,670,653,346.93) | (3,617,570,557.17) |
| මාවිල් ආරු වන්දි ගෙවීම් හිලව් කිරීම | (120,198,876.75) | - |
| | **(48,945,122,405.64)** | **(44,154,270,181.96)** |

**සටහන 9 - ප්‍රග්ධන වියදම් සඳහා රජයේ දායකය**

| | 31.12.2012 | 31.12.2011 |
|---|---|---|
| ඉ / ගෙ ශේෂය | 1,957,386.91 | 2,597,200.19 |
| එකතු / අඩුකලා | | |
| රාජ්‍ය දායක ක්‍රමක්ෂය | (1,320,948.72) | (1,227,701.28) |
| වර්ෂය තුල එකතු කිරීම් (කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය) | 1,475,000.00 | 587,888.00 |
| ප / ගෙ ශේෂය | **2,111,438.19** | **1,957,386.91** |

**සටහන 10 - ගෙවිය යුතු දෑ**

| | 31.12.2012 | 31.12.2011 |
|---|---|---|
| නියෝජිත කොමිස් | 109,935.00 | 214,055.00 |
| සේවක ආරක්ෂණ තැන්පතු | 185,900.00 | 185,900.00 |
| A.A.I.B. ජංගම ගිණුම | 57,147,178.08 | 43,945,494.19 |
| විශ්‍රාම වැටුප් | 1,386,329,200.00 | 187,175,644.00 |
| විශ්‍රාම වැටුප් ගෙවීම් සඳහා කොමිස් | 6,148,860.00 | |
| සමූහ ජීවිත රක්ෂණ වාරමුදල | 86,704,870.00 | 57,304,080.00 |
| ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් සඳහා ණය | | |
| - ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | 608,316,450.94 | 553,014,955.94 |
| - කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය | 272,829,074.77 | 154,776,074.77 |
| | **2,417,771,468.79** | **996,616,203.90** |

**සටහන 11 - උපචිත වියදම්**

| | 31.12.2012 | 31.12.2011 |
|---|---|---|
| මුද්‍රණ ගාස්තු සඳහා වෙන් කිරීම් | 211,771.16 | 111,771.16 |
| උපචිත පරිපාලන වියදම් | - | 37,107.00 |
| විගණන ගාස්තු සඳහා වෙන්කිරීම් | | |
| - පෙර වර්ෂය | 2,382,031.00 | 2,082,031.00 |
| - ප්‍රවර්ථන වර්ෂය | 250,000.00 | 300,000.00 |
| | **2,843,802.16** | **2,530,909.16** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

## *2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සටහන්*

| | 31.12.2012 | 31.12.2011 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| **සටහන 12 - පරිපාලන වියදම්** | | |
| වැටුප් හා වේතන | 54,606,010.08 | 51,617,526.26 |
| සේවක අර්ථ සාධක අරමුදල | 4,472,351.25 | 4,488,225.34 |
| සේවක භාරකාර අරමුදල | 1,118,089.87 | 1,122,056.36 |
| ගමන් වියදම් | 1,302,748.21 | 1,266,018.50 |
| අතිකාල | 666,687.63 | 1,569,624.20 |
| දෛනික දීමනා | 48,022.44 | 92,114.85 |
| වෛද්‍යාධාර ගෙවීම් | 279,072.00 | 296,510.00 |
| පාරිතෝෂික දීමනා | 2,880,180.00 | 3,570,790.00 |
| උපදේශක කමිටු දීමනා | 8,992.00 | 36,000.00 |
| සේවක සුභසාධක | 261,702.50 | 151,403.00 |
| නීති ගාස්තු | 103,749.20 | 57,258.60 |
| සේවක නිල ඇඳුම් | 7,200.00 | 112,207.24 |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 111,490.00 | 106,772.00 |
| උපදේශක ගාස්තු | 4,800.00 | 7,300.00 |
| කම්කරු කුලී | 6,900.00 | 21,850.00 |
| ගොඩනැගිලි කුලී | 4,868,831.30 | 4,430,266.12 |
| දුරකථන ගාස්තු | 1,054,554.64 | 1,013,106.10 |
| තැපැල් වියදම් | 544,452.02 | 718,038.86 |
| ආරක්ෂක ගාස්තු | 130,325.56 | 91,373.37 |
| විදුලි ගාස්තු | 914,205.14 | 707,818.00 |
| ජල ගාස්තු | 119,419.11 | 153,769.16 |
| විගණන ගාස්තු | 250,000.00 | 300,000.00 |
| ඉන්ධන | 1,919,515.89 | 1,609,011.79 |
| ප්‍රචාරක හා පුහුණු | 200,713.79 | 686,309.25 |
| මුද්‍රණ | 788,629.69 | 1,107,740.29 |
| ලිපිද්‍රව්‍ය හා පාරිතෝෂික ද්‍රව්‍ය | 1,406,547.03 | 1,783,011.95 |
| සංග්‍රහ වියදම් | 66,910.20 | 132,302.40 |
| වාහන නඩත්තු | 1,737,113.42 | 1,931,662.27 |
| ගොඩනැගිලි නඩත්තු | 58,373.00 | 148,828.08 |
| කාර්යාල උපකරණ නඩත්තු | 217,867.27 | 126,067.26 |
| පරිගණක උපකරණ නඩත්තු | 282,504.27 | 49,669.44 |
| ක්ෂයවීම් | 1,320,948.72 | 1,227,701.28 |
| | **81,758,906.23** | **80,732,331.97** |
| **සටහන 13 - මූල්‍ය හා වෙනත්** | | |
| ණය පොළී | 67,154,495.00 | 37,037,576.33 |
| බැංකු ගාස්තු | 80,903.35 | 61,081.12 |
| බැංකු කොමිස් | - | 1,333.75 |
| හරබදු | - | 452,762.70 |
| අයකරගත නොහැකි ලැබීම් | 4,090,908.36 | - |
| | **71,326,306.71** | **37,552,753.90** |

## 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන

# ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය



Back

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2012.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය** — නැවත පිහිටුවන ලද

| | සටහන | 31.12.2012<br>රු. ශත | 31.12.2011<br>රු. ශත |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ***ජංගම නොවන වත්කම්*** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 1 | 2,966.60 | 4,193.20 |
| | | **2,966.60** | **4,193.20** |
| ***ජංගම වත්කම්*** | | | |
| තොගය | 2 | 170,081.30 | 186,363.08 |
| ලැබිය යුතු දෑ | 3 | 610,126,275.94 | 554,882,306.94 |
| ලැබිය යුතු පොලී | 4 | 94,275.97 | 285,833.05 |
| ආයෝජන | 5 | 35,376,535.64 | 62,809,285.28 |
| බැංකුවේ ඇති මුදල් | 6 | 2,460,055.58 | 848,328.18 |
| | | **648,227,224.43** | **619,012,116.53** |
| **මුළු වත්කම්** | | **648,230,191.03** | **619,016,309.73** |
| ***ස්කන්ධය හා වගකීම්*** | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | |
| ධීවර විශ්‍රාම වැටුප් අරමුදල | 7 | (1,529,127,538.52) | (1,374,434,361.89) |
| සමූහ ජීවිත රක්ෂණ අරමුදල | 8 | 19,198,329.70 | 18,207,786.70 |
| | | **(1,509,929,208.82)** | **(1,356,226,575.19)** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ධීවර විශ්‍රාම වැටුප් වගකීම | | **2,149,338,000.00** | **1,968,125,000.00** |
| සේවක පාරිතෝෂික සඳහා වෙන් කිරීම | | **942,945.00** | **1,326,385.00** |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු දෑ | 9 | 6,647,429.85 | 4,740,474.92 |
| උපචිත වියදම් | 10 | 1,231,025.00 | 1,051,025.00 |
| | | **7,878,454.85** | **5,791,499.92** |
| මුළු ස්කන්ධය හා වගකීම් | | **648,230,191.03** | **619,016,309.73** |
| | | - | |

.................................

සභාපති
කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල

.................................

අධ්‍යක්ෂ (මුදල්)
කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
## ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
## 2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සදහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | සටහන | 31.12.2012<br>රු. ශත | 31.12.2011<br>රු. ශත |
|---|---|---|---|
| පොලී ආදායම | | 59,813,431.35 | 40,525,747.27 |
| ධීවරයින්ගේ දායකත්වය | | 1,793,052.50 | 1,429,682.00 |
| ජීවිත රක්ෂණ වාර මුදල් සදහා ධීවර දායකත්වය | | 1,649,340.00 | 1,595,580.00 |
| | | 63,255,823.85 | 43,551,009.27 |
| අඩුකලා | | | |
| පොලී ආදායමෙන් පරිපාලන වියදම් සදහා | | (3,500,000.00) | (3,500,000.00) |
| අරමුදල සදහා සමස්ත ආදායම | | **59,755,823.85** | **40,051,009.27** |
| <u>අඩුකලා</u> වියදම් | | | |
| ශුද්ධ දායක ආපසු ගෙවීම | | (506,856.00) | (614,816.00) |
| දායක ආපසු ගෙවීම් සදහා ගෙවූ ශුද්ධ පොලී | | (433,133.00) | (482,798.00) |
| දිරිදීමනා ගෙවීම | | (160,054.00) | (189,896.00) |
| සමූහ රක්ෂණ වාරමුදල් සදහා ගෙවීම | | (1,649,340.00) | (1,595,580.00) |
| විශ්‍රාම වැටුප් හා කොමිස් ගෙවීම | | | |
| - විශ්‍රාම වැටුප් ගෙවීම | | (29,496,923.00) | (24,636,392.00) |
| - විශ්‍රාම වැටුප් ගෙවීම මත කොමිස් | | (342,495.00) | (325,965.00) |
| මුළු වියදම් | | **(32,588,801.00)** | **(27,845,447.00)** |
| වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය | | **27,167,022.85** | **12,205,562.27** |
| **ධීවර විශ්‍රාම වැටුප් වගකීම් වැඩි වීම** | | **(181,213,000.00)** | **(170,403,000.00)** |
| | | **(154,045,977.15)** | **(158,197,437.73)** |
| **<u>ආදායම් - පරිපාලන වියදම් සදහා</u>** | | | |
| පරිපාලන වියදම් සදහා පොලී ආදායම | | 3,500,000.00 | 3,500,000.00 |
| පරිපාලන වියදම් සදහා රජයේ දායකත්වය | | - | 1,500,000.00 |
| | | **3,500,000.00** | **5,000,000.00** |
| විවිධ ආදායම් | | - | |
| | | **3,500,000.00** | **5,000,000.00** |
| අඩුකලා - වියදම් | | | |
| ආයතන හා පරිපාලන වියදම් | 11 | 4,140,729.31 | 4,172,931.31 |
| මූල්‍ය ගාස්තු | 12 | 6,470.17 | 7,928.81 |
| මුළු පරිපාලන වියදම් | | **4,147,199.48** | **4,180,860.12** |
| පරිපාලන වියදම් අතිරික්තය / (ඌනතාවය) | | **(647,199.48)** | **819,139.88** |
| වර්ෂය සදහා මුළු අතිරික්තය | | **(154,693,176.63)** | **(157,378,297.85)** |

(ධීවර විශ්‍රාම වැටුප් අරමුදලට මාරු කලා)

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය**

**2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | ධීවර විශ්‍රාම වැටුප් අරමුදල | සමූහ ජීවිත රක්ෂණ අරමුදල | එකතුව |
|---|---|---|---|
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | 424,677,935.96 | 17,699,206.70 | 442,377,142.66 |
| පෙර වර්ෂ ගැලපුම් | - | - | - |
| 2010.12.31 සඳහා ගලපන ලද ශේෂය | 424,677,935.96 | 17,699,206.70 | 442,377,142.66 |
| 2011 වර්ෂය තුළ ගැලපීම් | | | |
| ශුද්ධ අතිරික්තය | (157,378,297.85) | 508,580.00 | (156,869,717.85) |
| වියදම් ඉක්ම වූ ආදායම - ජීවිත රක්ෂණ | - | | - |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | **267,299,638.11** | **18,207,786.70** | **285,507,424.81** |
| විශ්‍රාම වැටුප් වගකීමේ වර්තමාන අගය | (1,641,734,000.00) | | |
| එකතු කලා පෙර වර්ෂ ගැලපුම් | - | - | - |
| 2011.12.31 සඳහා ගලපන ලද ශේෂය (නැවත පිහිටුවන ලද) | (1,374,434,361.89) | 18,207,786.70 | (1,356,226,575.19) |
| **2012 වර්ෂය තුළ එකතු කිරීම්** | | | |
| ශුද්ධ අතිරික්තය | (154,693,176.63) | - | (154,693,176.63) |
| වියදම් ඉක්ම වූ ආදායම - ජීවිත රක්ෂණ | - | 990,543.00 | 990,543.00 |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | **(1,529,127,538.52)** | **19,198,329.70** | **(1,509,929,208.82)** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | 31.12.2012 |
|---|---|
| | රු. ශත |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය | |
| ශුද්ධ අතිරික්තය | (154,693,176.63) |
| **ගැලපුම්** | |
| ක්ෂය වීම් | 1,226.60 |
| පෙර වර්ෂ ගැලපීම් | - |
| | **(154,691,950.03)** |
| විශ්‍රාමික පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 142,632.00 |
| **මෙහෙයුම් ලාභය කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර** | **(154,549,318.03)** |
| (වැඩි වීම)/ අඩුවීම - තොගය | 16,281.78 |
| (වැඩි වීම)/ අඩුවීම - ලැබිය යුතු දෑ | (55,243,969.00) |
| (වැඩි වීම)/ අඩුවීම - ලැබිය යුතු පොලී | 191,557.08 |
| (වැඩි වීම)/ අඩුවීම - අනෙකුත් ගෙවිය යුතු දෑ | 1,906,954.93 |
| (වැඩි වීම)/ අඩුවීම - උපචිත වියදම් | 180,000.00 |
| | **(52,949,175.21)** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය | (207,498,493.24) |
| ගෙවූ විශ්‍රාම පාරිතෝෂික | **(526,072.00)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(208,024,565.24)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | |
| වර්ෂය තුල ආයෝජන | 27,432,749.64 |
| සමූහ ජීවිත රක්ෂණ ක්‍රමයට දායකත්වය | 1,649,340.00 |
| වර්ෂය තුල ගෙවූ ප්‍රතිලාභ | (658,797.00) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | **28,423,292.64** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | |
| ධීවර විශ්‍රාම වැටුප් වගකීම වැඩිවීම | **181,213,000.00** |
| දිගුකාලීන ණය ආපසු ගෙවීම | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **181,213,000.00** |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/ අඩුවීම** | **1,611,727.40** |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | 848,328.18 |
| | 2,460,055.58 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | |
| බැංකුගත මුදල් - 31.12.2012 | 2,460,055.58 |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**<u>2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා</u>**

<u>වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

## 01. පොදු

### 01.01. ගිණුම් පිළියෙල කිරිමේ පදනම

1. මණ්ඩලයේ මූල්‍ය තත්ව ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, සමුච්ත අරමුදල වෙනස් වීමේ වාර්තාව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය ගිණුම් ප්‍රතිපත්ති සහ ගිණුම් වලට අදාල සටහන් පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව වේ.
2. මණ්ඩලයේ මූල්‍ය වාර්තා පිළියෙළ කර ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනමට වේ.
3. උද්ධමන සාධකය මත වන බලපෑම් පිළිබඳව මූල්‍ය වාර්තාවල ගැලපීම් කර නැත.
4. යෝජනා ක්‍රමයේ සියලුම මූල්‍ය වාර්තා පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.
5. සියළුම මූල්‍ය ප්‍රකාශන 1990 ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතට අනුකූලව පිළියෙල කර ඇත.
6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන්නේ අඛණ්ඩ පැවැත්ම සංකල්පයටය.

### 01.02 ආදායම් බදු

මෙම යෝජනා ක්‍රමය 1990 වර්ෂයේ අංක 22 දරණ දේශිය ආදායම් පනත සහ ඊට පසු සංශෝධන අනුව ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

### 01.03 සංසන්දනාත්මක තොරතුරු

ගිණුම් ප්‍රතිපත්ති ඒකාකාරිව අනුගමනය කර ඇති අතර ඉලක්කම් හා ප්‍රකාශන අවශ්‍ය තැන් වලදි නැවත සකසා ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කර ඇත.

## 02. වත්කම් සහ ඒවා අගය කිරිමේ පදනම.

### 02.01 පදනම

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ මුදල් හා බැංකු ශේෂයන් වර්ගීකරණය කර ඇති අතර අනෙකුත් ජංගම වත්කම් ඒවා සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ දි හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වර්ෂයක් ඇතුලත යන දෙකෙන් කෙටි කාලය තුල මුදල් බවට පත් කල හැකි බවත් අපේක්ෂා කෙරේ.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**<u>2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා</u>**

**<u>වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>**

**02.02 දේපල, පිරියත හා උපකරණ සහ ක්ෂය වීම්.**

**02.02.01 දේපල පිරියත උපකරණ**

යන්ත්‍ර හා යන්ත්‍රාගාර දේපල වටිනාකම සමුච්චිත ක්ෂය වීම් අඩුකර පෙන්වා ඇත. දේපල, යන්ත්‍ර යන්ත්‍රාගාරය දේපල මිලදී ගැනිමේ පිරිවැය අනෙකුත් අනියම් වියදම් සමඟ ගොඩ නැඟීමට දැරූ වියදම සහ වත්කම් වර්තමාන ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට ගෙන ඒමට දරණ ලද වියදම් වලින් සමන්විත වේ.

වත්කමක් අත්පත් කර ගැනිමට, වැඩිදියුණු කිරිමට, හෝ භාවිතාවට ගන්නා කාලය දීර්ඝ කිරිමට හෝ සේවා ලබාගන්නා කාලය වැඩිකිරිමට, ධාරිතාවට වැඩි කිරිමට දරණ ලද සියළුම වියදම් ප්‍රාග්ධන වියදම් වලට ඇතුලත් වේ.

ප්‍රමාණාත්මක භෞතික වත්කම් මණ්ඩලය සතු නොවන බැවින් LKRS ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුව ප්‍රත්‍යාගණනය සිදුකර නොමැත.

**02.02.02 ක්ෂය වීම්**

වත්කම් ක්ෂය කිරිම සරළ මාර්ග ක්‍රමය යටතේ පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| ලී බඩු හා සවි කිරිම් | 10% |
| කාර්යාල උපකරණ | 10% |
| සුභසාධක උපකරණ | 10% |
| පරිගණක | 20% |

2009 ජනවාරි 01 දිනට ප්‍රථමව මිලදී ගන්නා ලද වත්කම් සඳහා අදාල වත්කම් ඉවත් කරන වර්ෂයේදි ක්ෂය කිරිම නොකරන අතර වත්කම් මිලදී ගන්නා /පවරා ගන්නා වර්ෂයෙදි මුළු වර්ෂය සඳහාම ක්ෂය කිරීම කරනු ලබයි. 2009 ජනවාරි 01 දිනට පසුව මිලදී ගන්නා ලද වත්කම් සඳහා වත්කම මිලදී ගන්නා / පවරා ගත් මාසයේ සිටම ක්ෂය කිරිම කරනු ලබයි.

**02.03. ආයෝජන**

භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන පෙන්වා ඇත්තේ පිරිවැය අගයට වේ.

**02.04.** තොගය

තොගයේ අගය පෙන්වා ඇත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධිත අගය යන දෙකෙන් අඩු අගයට වේ.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**02.05 ලැබිය යුතු ගිණුම්**

ලැබිය යුතු ගිණුම් පෙන්වා ඇත්තේ ඇස්තමේන්තු ගත උපලබ්ධි අගය මත වේ.

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා කෙටිකාලීණ ණය

ගොවි විශ්‍රාම වැටුප් අරමුදල 2010 අගෝස්තු මාසය තුලදි ශූන්‍ය වූ නිසා, මාසික විශ්‍රාම වැටුප් ගෙවිම වෙනුවෙන් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට කෙටිකාලීන ණය මුදලක් ලබාදෙන ලදි.

**03. වගකිම් හා වෙන් කිරිම්.**

**03.01** අවශ්‍ය වු විට ශේෂ පත්‍ර දින සිට වර්ෂයක් ඇතුලත ගෙවා අවසන් වන ආකාරයට ශේෂ පත්‍රයේ සඳහන් වගකීම් ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

ජංගම නොවන වගකිම් යටතේ දක්වා ඇත්තේ ශේෂ පත්‍ර දින සිට වර්ෂයකට පසුව ගෙවීමට සිදුවන වගකීම් වේ.

හදුනාගත හැකි සියළුම වගකීම් ගිණුම් වාර්තා පිළියෙල කිරිමේ දි සැලකිල්ලට ගෙන ඇත.

**03.02 විශ්‍රාම ප්‍රතිලාභ.**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ට අනුව වසරක සේවා කාලයක් සම්පූර්ණ කල සියළුම ස්ථිර සේවකයින්ට විශ්‍රාමික පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීමක් කර ඇත. කෙසේ වෙතත් 1983 අංක 12 දරණ සේවක පාරිතෝෂික දිමනා පනත අනුව පාරිතෝෂික දිමනා වගකීම් පැන නගිනුයේ අඛණ්ඩව වර්ෂ 5 ක කාලයක් සේවය සම්පූර්ණ කල සේවයකයන්ට පමණි. මෙම වගකිම සඳහා අරමුදල් බාහිරව මුල්‍යනය කර නොමැත.

**04. ධීවර විශ්‍රාම වැටුප් අරමුදල**

යෝජනා ක්‍රමයේ මුළු වගකීමම ජීවගණනයට අනුව ගිණුම්ගත කර ඇත.

**05. ආදායම් හා වියදම් ගිණුම්.**

**05.1 ආදායම්**

01. යෝජනා ක්‍රමයේ ආදායම් නියෝජනය වන්නේ දායක වාරික මුදල්, භාණ්ඩාගාර බිල්පත් පොළිය සහ අනෙකුත් විවිධ ආදායම් වලින් වේ.

02. සියළුම වාරික මුදල් ආදායම් මුදල් පදනම මත හඳුනාගෙන ඇත.
03. ධීවර අමාත්‍යාංශයේ ප්‍රධානයන්

වාර්ෂිකව රු.මි 1,500,000 ක මුදලක් පරිපාලන වියදම් ලෙස ධීවර අමාත්‍යාංශයෙන් යෝජනාක්‍රමය වෙත ලබාදෙනු ලැබේ.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**<u>2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා</u>**

**<u>වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>**

**05.02 අදායම් හඳුනාගැනිම.**

01. දායක කර ගන්නා අවස්ථාවේදී ධීවර වාරික මුදල ආදායම ලෙස හඳුනා ගෙන ඇත.

02. ඉහත ආදායම සම්බන්ධිත වියදම් සමග ගලපමින් මුදල් පදනම මත ගලපා ඇත.

03. පොළි ආදායම් කාල පදනම මත උපචිත පදනමට ගෙන ඇත.

**05.03 වියදම.**

01. වර්ෂයේ අතිරික්තය හෝ ඌනතාවය ගණනය කිරිමේ දි ධිවර වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරකම් සඳහා දරා ඇති සියළුම වියදම්, ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම, ආදායමට එරෙහිව උපචිත පදනමට ගෙන ගණනය කර ඇත.

02. අංක 401/4 හා 2008.10.15 දින දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව වක්‍ර වියදම් පහත සඳහන් ප්‍රතිශතයන් මත ගණනය කර ඇත.

| <u>වියදම</u> | <u>අනුපාත</u> |
|---|---|
| ගෙවල් කුලි හා දුරකථන | 5% |
| තැපැල් ගාස්තු හා ජල බඳු | 5% |
| විදුලිය | 5% |
| කාර්යාල උපකරණ නඩත්තු | 5% |
| ගොඩනැගිලි නඩත්තු වියදම් | 5% |
| මෝටර් වාහන නඩත්තු | 3% |
| ඉන්ධන | 2% |

| | |
|---|---|
| ලිපිද්‍රව්‍ය | 2% |
| නිල ඇඳුම් | 2% |
| ආරක්ෂක වියදම් | 5% |
| පරිගණක වියදම් | 5% |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

**06. අසම්භාවයන්**

**ලැබිය යුතු පොලී**

මණ්ඩලය විසින් කොළඹ දිස්ත්‍රික් උසාවියේ ලංකා බැංකුවට එරෙහිව 1996 වර්ෂයේ ආයෝජන පොලී අහිමි වීම වෙනුවෙන් නඩුවක් ගොනු කර ඇත.

විස්තර පහත පරිදි වේ.

| නඩු අංක | වටිනාකම |
|---|---|
| MR 21843 | 1,454,670.84 |
| MR 21844 | 1,172,602.46 |
| MR 21845 | 2,784,657.55 |

මණ්ඩලයට වාසි සහගත අයුරින් නඩු තීන්දුව දී ඇතත් තීන්දුවට එරෙහිව ලංකා බැංකුව අභියාචනාධිකරණයේ නඩුවක් ගොනු කර ඇත.

**07. මුදල් ප්‍රවාහ ප්‍රකාශය.**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 07ට අනුකූලව වක්‍ර ක්‍රමය උපයෝගි කරගෙන වේ.

**08. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්.**

සියළුම ප්‍රමාණාත්මක ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර, අවශ්‍ය තැන් වලදි ගැලපීම් කර සහ හෙලිදරව් කිරිම් කර ඇත.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

| | 31.12.2012 | 31.12.2011 |
|---|---|---|
| ***සටහන් 02 - තොග*** | රු. ශත | රු. ශත |
| මුද්‍රණ ද්‍රව්‍ය | 170,081.30 | 186,363.08 |
| | **170,081.30** | **186,363.08** |

***සටහන් 03 - ලැබිය යුතු දෑ***

| | | |
|---|---|---|
| කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය | - | - |
| ගො.වි.වැ. යෝජනා ක්‍රමයෙන් ලැබිය යුතු ණය | 608,316,450.94 | 553,014,955.94 |
| ධීවර දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු මුදල | 1,500,000.00 | 1,500,000.00 |
| මරණ පාරිතෝෂික අත්තිකාරම් | 50,000.00 | 50,000.00 |
| ලැබිය යුතු වාර මුදල් | 259,825.00 | 317,351.00 |
| | **610,126,275.94** | **554,882,306.94** |

***සටහන් 04 - ලැබිය යුතු පොලී***

| | | |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් - (ල/බැ) | 94,275.97 | 285,833.05 |
| | **94,275.97** | **285,833.05** |

***සටහන් 05 ආයෝජන***

| | | |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් - (ල/බැ) | 35,376,535.64 | 62,809,285.28 |
| | **35,376,535.64** | **62,809,285.28** |

***සටහන් 06 - බැංකුවේ ඇති මුදල්***

| | | |
|---|---|---|
| ගිණුම් අංක 164790 - ලංකා බැංකුව යුනියන් පෙදෙස | 156,865.23 | 113,793.23 |
| ගිණුම් අංක 164795 - ලංකා බැංකුව යුනියන් පෙදෙස | 2,303,190.35 | 734,534.95 |
| | **2,460,055.58** | **848,328.18** |

***සටහන් 07 - ධීවර විශ්‍රාම වැටුප් අරමුදල***

| | | |
|---|---|---|
| ශේෂය ඉ/ගෙ | (1,374,434,361.89) | (1,217,056,064.04) |
| පෙර වර්ෂ ගැලපුම් | - | - |
| | (1,374,434,361.89) | (1,217,056,064.04) |
| වර්ෂය තුළ එකතු කිරීම | | |
| මෙහෙයුම් අතිරික්තය | (154,045,977.15) | (158,197,437.73) |
| ආදායම් වියදම් ගිණුමේ අතිරික්තය | (647,199.48) | 819,139.88 |
| | (154,693,176.63) | (157,378,297.85) |
| | **(1,529,127,538.52)** | **(1,374,434,361.89)** |

## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
## ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

## 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

| | 31.12.2012 | 31.12.2011 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| ***සටහන් 08 - සමූහ ජීවිත රක්ෂණ අරමුදල*** | | |
| ශේෂය ඉ/ගෙ | 18,207,786.70 | 17,699,206.70 |
| එකතු කිරීම් | | |
| වර්ෂයේ දායකත්වය | 1,649,340.00 | 1,595,580.00 |
| අඩු කිරීම් | | |
| බෙලහීන පාරිතෝෂික ගෙවීම් | - | (10,000.00) |
| මරණ පාරිතෝෂික ගෙවීම් | (658,797.00) | (1,077,000.00) |
| | (658,797.00) | (1,087,000.00) |
| | **990,543.00** | **508,580.00** |
| | **19,198,329.70** | **18,207,786.70** |

| | 31.12.2012 | 31.12.2011 |
|---|---|---|
| ***සටහන 09 - ගෙවිය යුතු දෑ*** | | |
| විශ්‍රාම වැටුප් ගෙවීම | 310,059.00 | 2,226,246.00 |
| කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමයට | 5,596,546.85 | 1,526,813.92 |
| ආපසු ගෙවිය යුතු දායක මුදල් | 189,740.00 | 252,157.00 |
| ගෙවිය යුතු මරණ පාරිතෝෂික | 316,000.00 | 456,000.00 |
| ගෙවිය යුතු බෙලහීන ප්‍රතිලාභ | - | - |
| ගෙවිය යුතු- දිරි දීමනා | 64,371.00 | 69,067.00 |
| ආපසු ගෙවිය යුතු දායකත්ව මත පොළී | 170,713.00 | 181,496.00 |
| ගෙවිය යුතු විශ්‍රාම කොමිස් | - | 28,695.00 |
| | **6,647,429.85** | **4,740,474.92** |

| | 31.12.2012 | 31.12.2011 |
|---|---|---|
| ***සටහන 10 - උපචිත වියදම්*** | | |
| මුද්‍රණ ගාස්තු | 155,000.00 | 75,000.00 |
| පරිපාලන වියදම් | 17,000.00 | 17,000.00 |
| විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් | 1,059,025.00 | 959,025.00 |
| | **1,231,025.00** | **1,051,025.00** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | 31.12.2012 | 31.12.2011 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| ***සටහන 11 - පරිපාලන වියදම්*** | | |
| වැටුප් හා වේතන | 1,846,497.68 | 1,789,702.23 |
| සේවක අර්ථසාධක අරමුදල | 221,579.73 | 214,764.27 |
| සේවක භාරකාර අරමුදල | 55,390.81 | 53,691.07 |
| අතිකාල දීමනා | 14,539.56 | 14,947.48 |
| උපදේශක කමිටු දීමනා | 4,500.00 | 19,500.00 |
| විශේෂ දීමනා | 352,428.00 | 442,209.00 |
| පාරිතෝෂික | 142,632.00 | 112,207.50 |
| ඉන්ධන | 125,789.06 | 104,529.82 |
| ලිපිද්‍රව්‍ය | 54,780.44 | 57,209.44 |
| මුද්‍රණ | 96,281.78 | 182,590.39 |
| නිල ඇඳුම් | 300.00 | 4,675.30 |
| කාර්යාල කුලී | 608,603.90 | 553,783.30 |
| දුරකථන | 131,819.33 | 126,638.26 |
| තැපැල් ගාස්තු | 49,495.64 | 60,910.81 |
| ජල ගාස්තු | 14,927.39 | 19,221.14 |
| ආරක්ෂක වියදම් | 32,581.39 | 22,843.34 |
| විදුලි ගාස්තු | 114,275.64 | 88,477.25 |
| මෝටර් වාහන නඩත්තු | 130,283.51 | 144,874.67 |
| ගොඩනැගිලි නඩත්තු | 7,296.60 | 18,603.51 |
| කාර්යාල උපකරණ නඩත්තු | 17,421.82 | 29,836.82 |
| පරිගණක වියදම් | 18,078.43 | 10,275.36 |
| ක්ෂය වීම් | 1,226.60 | 1,440.35 |
| විගණන ගාස්තු | 100,000.00 | 100,000.00 |
| | **4,140,729.31** | **4,172,931.31** |

*සටහන 12 - මූල්‍ය වියදම්*

| | 31.12.2012 | 31.12.2011 |
|---|---|---|
| බැංකු ගාස්තු | 6,470.17 | 7,827.60 |
| හර බදු | - | 101.21 |
| | **6,470.17** | **7,928.81** |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல / My No } එෆ්බී/ඊ/ඒඒඅයිබී/එෆ්ඒ/2012

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2013 දෙසැම්බර් [illegible]

සභාපතිනි,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

මාගේ සමාංක හා 2013 ඔක්තෝබර් 29 දිනැති ලිපිය හා බැඳේ.

02. ඉහත සඳහන් ලිපිය සමඟ ඉංග්‍රීසි අනුවාදය එවන ලද මාගේ වාර්තාව මේ සමඟ එවා ඇත.

**එච්.ඒ.එස්. සමරවීර**

විගණකාධිපති

පිටපත - ලේකම්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය


නො 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල

இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை

No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථන / தொலைபேசி / Telephone } 2887028 - 34

ෆැක්ස් / பக்ஸ் இல / Fax No. } 2887223

ඊ - මේල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet



Back

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | එෆ්බී/ ඊ/ඒඒඅයිබී/<br>එෆ්ඒ/2012 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2013 ඔක්තෝබර් 29 දින |

සභාපතිනිය ,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) ( සී ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ පනතේ 28 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14( 2 )( සී ) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපතිනිය වෙත 2013 අගෝස්තු 23 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 2.2.1 මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂ පහක කාල පරිච්ඡේදය සඳහා ආදායම, හානි පුරණ ගෙවීම සහ ඒ මත දරන ලද වියදම පිළබඳ සැසඳීමක් පහත දැක්වෙන අතර රජයේ සහායක් නොමැතිව මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිතතාවය එයින් දැක්වේ.

| වර්ෂය | ලැබුණු වාරික<br>රු.මිලියන | හිමිකම් ගෙවීම<br>රු.මිලියන | මෙහෙයුම් වියදම<br>රු.මිලියන | පරිපාලන වියදම<br>රු.මිලියන | මුළු වියදම<br>රු.මිලියන | ලැබුණු වාරික වලට වැඩි වියදම<br>රු.මිලියන |
|---|---|---|---|---|---|---|
| 2008 | 70.5 | 27.0 | 4.2 | 78.7 | 109.9 | (39.4) |
| 2009 | 83.4 | 31.0 | 5.7 | 84.1 | 120.8 | (37.4) |
| 2010 | 105.1 | 268.7 | 5.6 | 86.3 | 360.6 | (255.5) |
| 2011 | 157.4 | 57.3 | 10.1 | 82.3 | 149.7 | 7.7 |
| 2012 | 124.7 | 126.6 | 8.6 | 81.8 | 217.0 | (92.3) |

(ආ) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලවලට අදාළව අහිතකර ලෙස බලපෑ වී සහ අතිරේක බෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමවලට අදාළව විශාල වියදමක් දරා තිබුණු බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| රක්ෂණ යෝජනා ක්‍රමය | ආදායම රු. | මුළු මෙහෙයුම් වියදම රු. | ආදායමේ ප්‍රතිශතයක් ලෙස මෙහෙයුම් වියදම % |
|---|---|---|---|
| වී | 77,930,573 | 100,303,622 | 129 |
| පශු සම්පත් | 15,807,854 | 5,241,680 | 33 |
| සුව සෙත | 2,494,794 | 787,277 | 32 |
| අතිරේක බෝග වගා | 22,016,546 | 20,065,955 | 91 |
| කෘෂි උපකරණ | 929,429 | 129,405 | 14 |
| ගබඩා රක්ෂණ | 199,987 | 100,000 | 50 |

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 1 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. (මුල් වතාවට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කිරීම )

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 ප්‍රකාරව ලාභය හෝ පාඩුව මඟින් සාධාරණ අගය, (FVPL) කල්පිරීම (HTM) ණය සහ ලැබිය යුතු ශේෂ (LR) සහ විකිණීම සඳහා ලබාගැනීම (AFS) මූල්‍ය උපකරණවල හඳුනාගෙන හා ගණනය කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 07 ප්‍රකාරව මූල්‍ය උපකරණ පිළිබඳ හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 ප්‍රකාරව නියම කරන ලද ප්‍රතිලාභ සැලැස්ම යටතේ වගකීමෙන් නිදහස් වීමට හැකිවන පරිදි නියම කරන ලද ප්‍රතිලාභ සැලැස්ම සඳහා ආයුගණක තක්සේරුව හා ගිණුම් තැබීම සිදුකර නොතිබුණු අතර සේවා යෝජක විසින් කරන දායකය ආයෝජනය කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ කරන ලද උසාවි නියෝගයක් අනුව 2013 වර්ෂයේ සේවකයෙකුට ගෙවන ලද රු.200,000 ක් වූ හානිපූරණ ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

## 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භෝග රක්ෂණය ක්‍රියාත්මක කිරීම සඳහා භූ- දත්ත තොරතුරු සැකසීමේ විද්‍යා අයදුම්පත් සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානයට සහ භූ- දත්ත තොරතුරු සැකසීමේ විද්‍යාව පිළිබඳ පිළියෙල කළ ශක්‍යතා වාර්තාව සම්බන්ධයෙන් මොරටුව විශ්ව විද්‍යාලයේ පුහුණුව සඳහා ගෙවිය යුතු රු.153,836 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

(ආ) හිටපු සභාපතිනියට ගෙවන ලද දීමනා මත 2012 සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා අයකරන ලද උපයන විට ගෙවීම් බදු රු.12,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ වැඩ තහනම් කරනු ලදුව නැවත සේවයේ පිහිටවනු ලැබූ සේවකයෙකුට ගෙවිය යුතු 2012 වර්ෂයට අදාළ රු.561,220 ක හිඟ වැටුප් 2013 වර්ෂයේදී ගෙවා තිබූ අතර එය සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට ගෙන නොතිබුණි.

(ඈ) මූලික ගෙවීම් වවුචර් අනුව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල පරිපාලන වියදම් රු.423,439 කින් අඩුවෙන් දක්වා තිබූ බව නිරීක්ෂණය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය සඳහා ඌනතාවය එම මුදලින් අඩුවෙන් දැක්වේ.

(ඉ) රු.111,451 ක් වූ බදු හා වරිපනම් පූර්ව ගෙවීම් මූල්‍ය ප්‍රකාශනවල පූර්ව ගෙවීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. ඒ වෙනුවට සමාලෝචිත වර්ෂය සඳහා ආදායමට අයකර තිබුණි.

## 2.2.4 පැහැදිලි නොකරන ලද වෙනස්කම්

-----------------------------------

(අ) ආදායම සම්බන්ධයෙන් සංවර්ධන ශාඛාවේ විස්තරාත්මක උපලේඛනයන්හි දැක්වෙන ප්‍රමාණයන් හා 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ප්‍රමාණයන් අතර පහත දැක්වෙන වෙනස්කම් නිරීක්ෂණය විය.

| රක්ෂණ යෝජනා ක්‍රම | මූල්‍ය ප්‍රකාශන අනුව<br><br>රු. | සංවර්ධන ශාඛාවේ විස්තරාත්මක උපලේඛන අනුව<br><br>රු. | වෙනස<br><br>රු. |
|---|---|---|---|
| පශු සම්පත් | 15,807,854 | 13,103,900 | 2,703,954 |
| සුවසෙත හා ජීවිත | 2,494,794 | 2,196,974 | 297,820 |
| කෘෂි උපකරණ | 929,428 | 4,483,967 | 3,554,539 |
| ගබඩා | 199,987 | 238,370 | 38,383 |

(ආ) සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද හානි පූර්ණ ගෙවීම්වලට අදාළව සංවර්ධන ශාඛාවේ විස්තරාත්මක උපලේඛනවල දැක්වෙන ප්‍රමාණයන් හා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ප්‍රමාණයන් අතර පහත දැක්වෙන වෙනස්කම් නිරීක්ෂණය විය.

| රක්ෂණ යෝජනා ක්‍රමය | මූල්‍ය ප්‍රකාශන අනුව | සංවර්ධන ශාඛාවේ විස්තරාත්මක උපලේඛන අනුව | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| පශු සම්පත් | 5,241,680 | 7,818,212 | (2,576,532) |
| වී | 100,303,622 | 75,770,287 | 24,533,335 |
| කෘෂි උපකරණ | 129,405 | 165,823 | (36,418) |
| අතිරේක බෝග වගා | 20,065,955 | 15,798,206 | 4,267,749 |
| සුවසෙත හා ජීවිත | 787,276 | 713,365 | 73,740 |

## 2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු.2,254,178 ක් වූ පහත දැක්වෙන සේවක ණය සහ අත්තිකාරම් ශේෂ අයකර ගැනීමෙන් තොරව ගිණුම්වල පැවතුණි. එයින් රු.1,902,915 ක් වර්ෂ පහකට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

| **ණය සහ අත්තිකාරම් වර්ගය** | **රු.** |
|---|---|
| ආපදා ණය | 1,238,190 |
| උත්සව අත්තිකාරම් | 55,300 |
| විශේෂ අත්තිකාරම් | 17,050 |
| ඉන්ධන අත්තිකාරම් | 160,602 |
| යතුරු පැදි ණය | 341,572 |
| විශේෂ සේවක ණය | 4,800 |
| විවිධ අත්තිකාරම් | 324,293 |
| ගමන් අත්තිකාරම් | 8,000 |
| වැටුප් අත්තිකාරම් | 50,261 |
| විවිධ ණයගැති හා යතුරු පැදි වියදම් | 54,110 |
| | 2,254,178 |

(ආ) එකතුව රු.320,944 ක් වූ මියගිය සේවකයන්ට ගෙවිය යුතු පාර්තොෂික, නිරවුල් කිරීමෙන් තොරව දීර්ඝ කාලයක් පැවතුණි.

(ඇ) 2007 වර්ෂයේදී රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාවට ගෙවන ලද රු.145,008 ක් වූ කුලී අත්තිකාරම් ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ආපසු ගෙවන ලද රු.604,800 ක්වූ රඳවා ගැනීම් බදු භාණ්ඩාගාරයට නිරවුල් කිරීමෙන් තොරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා කෘෂිකාර්මික හා ගොවි රක්ෂණ මණ්ඩලය විසින් 2010 සිට 2012 දක්වා කාලය තුළ ගොවි විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවා තිබුණු රු.272,829,074 ක මුදලක් 2012 දෙසැම්බර් 31 දක්වා අයකර නොතිබුණි.

(ඊ) සේවකයන් 4 දෙනෙකු පහත දැක්වෙන ආයතනවලට මුදාහැර තිබුණි. මෙම සේවකයන් 4 දෙනාට ගෙවන ලද රු.1,908,815 ක්වූ වැටුප් අයකර ගෙන හෝ මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන් ලෙස දක්වා හෝ නොතිබුණි.

- තැපැල් විදුලි සංදේශ හා උඩරට සංවර්ධන අමාත්‍යාංශය
- ප්‍රජා සංවර්ධනය හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය
- විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය
- කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය

## 2.2.6 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතෙ 10 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ සේවකයෙකුට ගෙවන ලද රු.21,253,050 ක් වු ජීවනාධාර දීමනා මත රු.2,550,366 ක් වු සියයට 12 ක සේවක අර්ථ සාධක අරමුදල් දායකය අයකර සේවක අර්ථ සාධක අරමුදලට ගෙවා නොතිබුණි. |
| (ii). 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනතෙ 16(1) වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ සේවකයෙකුට ගෙවන ලද රු.21,253,050 ක් වු ජීවනාධාර දීමනා මත රු.637,592 ක් වු සියයට 3 ක සේවක භාරකාර අරමුදල් සේවක භාරකාර අරමුදලට ගෙවා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | 2011 අප්‍රේල් 18 දිනැති අංක උවිගෙ/බදු/අංක1/2011 දරන දේශීය ආදායම් චක්‍රලේඛය | ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අරමුදල් කළමනාකරණයට සහභාගීවූ නිලධාරීන්ට ගෙවන ලද දීමනා වලින් රු.11,161 ක් වූ උපයන විට ගෙවීම් බදු අඩුකර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 110 | පාඩු පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |

2.2.7 ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන කාර්යාලය හා ශාඛාවකට අදාළ ජල බිල්පත් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් විසන්ධි කරන ලද ජල සම්බන්ධතාවය නැවත සම්බන්ධ කිරීමේ ගාස්තු ලෙස රු.18,480 ක මුදලක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

(ආ) සේවකයන් නියමිත වේලාවට පැමිණීම පවත්වා ගැනීම සඳහා කාර්ය මණ්ඩල ප්‍රවාහන පහසුකම් වෙනුවෙන් 2012 වර්ෂයේ මාස 6 ක් සඳහා මණ්ඩලය රු.325,000 ක මුදලක් දරා තිබුණි. කෙසේ වුවද, ප්‍රමාදවී පැමිණීම් සිදුවී තිබුණු හෙයින් අරමුණ ඉටුවී නොතිබුණි.

(ඇ) භෝග රක්ෂණය සඳහා හානිපූරණ ගෙවීමේදී "GPS/GLS" තාක්ෂණය යොදා ගැනීමට පියවර ගෙන නොතිබණි. කෙසේ වුවද භූ දත්ත තොරතුරු සැකසීමේ නියමු ව්‍යාපෘතිය සඳහා ගෙවන ලද රු.625,346 ක මුදල ආර්ථික නොවූ ගනුදෙනුවක් ලෙස හඳුනාගත හැක.

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් අතිරික්තය පරිපාලන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.1,467,963 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.101,215,444 ක් විය. සමාලෝචිත වර්ෂයේ ලැබුණු රජයේ ප්‍රදාන හා වෙනත් ආදායම් රු.65,095,828 ක් පරිපාලන හා මූල්‍ය වියදම් සමඟ ගැලපීමෙන් පසු සමස්ත

ඌනතාවය රු.15,420,596 ක් වු අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ලැබුණු රජයේ ප්‍රදාන හා වෙනත් ආදායම් රු.68,998,243 ක් පරිපාලන හා මුල්‍ය වියදම් සමඟ ගැලපීමෙන් පසු ඉකුත් වර්ෂයේ සමස්ත අතිරික්තය රු.87,675,318 ක් විය. ඒ අනුව මුල්‍ය ප්‍රතිඵලයේ රු.103,095,914 ක පිරිහීමක් දැක්වුණි. ඉහත පිරිහිම සඳහා හේතුවු ප්‍රධාන කරුණු පහත දැක්වේ.

(i) පෙර වර්ෂය සමඟ සැසදීමේදී රක්ෂණ වාරිකය සියයට 21 කින් අඩුවී තිබුණි.

(ii) පෙර වර්ෂය සමඟ සැසදීමේදී මෙහෙයුම් වියදම සියයට 100 කින් වැඩිවී තිබුණි.

(iii) පෙර වර්ෂය සමඟ සැසදීමේදී වෙනත් ආදායම සියයට 72 කින් අඩුවී තිබුණි.

(ආ) මුල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වු තොරතුරු අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව මුල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත වගුවෙන් දැක්වේ.

| **විෂයය** | **ප්‍රවර්ථන වර්ෂය (2012)** | **පෙර වර්ෂය (2011)** | **පෙර වර්ෂයෙන් වෙනස්වීමේ ප්‍රතිශතය** |
|---|---|---|---|
| | රු.(000) | රු.(000) | % |
| රක්ෂණ වාරික | 124,708 | 157,417 | (21) |
| පොලී | 11,988 | 11,268 | 6 |
| | ------------ | ----------- | |
| මුළු මෙහෙයුම් ආදායම | 136,696 | 168,685 | (19) |
| මෙහෙයුම් වියදම | (135,228) | (67,470) | 100 |
| | ------------- | ----------- | |
| මෙහෙයුම් අතිරික්තය / (ඌනතාවය ) | 1,468 | 101,215 | (99) |
| පරිපාලන වියදම් සඳහා රජයේ ප්‍රදාන | 63,323 | 62,750 | 0.9 |
| වෙනත් ආදායම | 1,773 | 6,248 | (72) |
| පරිපාලන, මුල්‍ය හා වෙනත් වියදම් | (81,984) | (82,538) | (0.7) |
| | ------------- | ----------- | |
| ශුද්ධ අතිරික්තය / ( ඌනතාවය ) | (15,420) | 87,675 | (118) |
| කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල | - | 5,060 | - |

සංචිත අරමුදල සඳහා ප්‍රතිපාදන

| | | | |
|---|---|---|---|
| | ----------- | ---------- | |
| ප්‍රතිපාදනයෙන් පසු ශුද්ධ අතිරික්තය / (ඌනතාවය ) | (15,420) | (82,615) | (119) |

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 5 ක මූල්‍ය ප්‍රතිඵල අනුව , රජයේ ප්‍රදානවලට පෙර ශුද්ධ අතිරික්තය ක්‍රමයෙන් අඩුවී තිබුණි. විස්තර පහත පරිදි වේ.

| | 2012<br>රු.මිලියන | 2011<br>රු.මිලියන | 2010<br>රු.මිලියන | 2009<br>රු.මිලියන | 2008<br>රු.මිලියන | 2007<br>රු.මිලියන |
|---|---|---|---|---|---|---|
| මුළු ආදායම | 139 | 175 | 128 | 114 | 96 | 48 |
| මුළු වියදම | 217 | 150 | 361 | 121 | 134 | 50 |
| ශුද්ධ අතිරික්තය/ (ඌනතාවය) | (78) | 25 | (233) | ( 7) | (38) | (2) |
| රජයේ ප්‍රදාන | 63 | 63 | 85 | 75 | 42 | 12 |
| රජයේ ප්‍රදාන වලින් පසු අතිරික්තය/ (ඌනතාවය ) | | | | | | |

ශුද්ධ අතිරික්තය / (ඌනතතාවය ) අනුව, 2007 සිට 2012 කාල පරිච්ඡේදය තුළ 2011 වර්ෂය හැර මණ්ඩලය රජයේ ප්‍රදාන මත යැපෙන බව නිරීක්ෂණය විය.

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වගා රක්ෂණ හානි පුරණ යෝජනා දින වෙනස් කර තිබූ එකතුව රු.640,860 ක්වූ රක්ෂණ හානි පූර්ණ ගෙවීම් ප්‍රතිලාභීන් 24 ක් දෙනෙකුට ගෙවා තිබුණි.

(ආ) 2010/2011 මහ කන්නය තුළදී මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 49 දෙනෙකුට එකතුව රු.1,099,780 ක මුදලක් හානි පූර්ණ ගෙවීම් ලෙස දෙවාරයක් ගෙවීම් කර තිබුණි. මෙම ගෙවීමෙන් රු.133,540 ක් 2013 ජනවාරි 31 දක්වා අයකර ගෙන නොතිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

4.1 **කාර්ය සාධනය**

-----------------

**රක්ෂණ යෝජනා ක්‍රමය පරිපාලනය**

---------------------------------------

ලබාගත හැකිවූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා රක්ෂණ යෝජනා ක්‍රමවල භෞතික හා මූල්‍ය කාර්ය සාධනය පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| | | විෂයය | මිණුම | ඉලක්කය | | | | ඉටුකරගැනීම | | | | ඉටුකර ගැනීම ප්‍රතිශතයක් ලෙස % | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | භෞතික | | මූල්‍ය | | භෞතික | | මූල්‍ය | | භෞතික | | මූල්‍ය | |
| | | | | 2011 | 2012 | 2011 | 2012 | 2011 | 2012 | 2011 | 2012 | 2011 | 2012 | 2011 | 2012 |
| | | | | | | (රු.000) | (රු.000) | | | (රු.000) | (රු.000) | % | % | (රු.000) | (රු.000) |
| 1. | භෝග රක්ෂණය | | | | | | | | | | | | | | |
| | (අ) | වී | අක්කර | 90,519 | 97,290 | 71,371 | 85,897 | 101,741 | 66,352 | 94,437 | 77,931 | 112.40 | 68.20 | 132.32 | 90.73 |
| | (ආ) | මිරිස් | අක්කර | 823 | 490 | 1,411 | 1,583 | 431 | 206 | 826 | 825 | 52.00 | 42.00 | 58.54 | 52.12 |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | (ඇ) | ලොකු ළූණු | අක්කර | 341 | 1,125 | 3,386 | 3,328 | 998 | 1,538 | 2,744 | 4,086 | 292.67 | 136.71 | 81.04 | 122.77 |
| | (ඈ) | පොල් | අක්කර | 130 | 193 | 140 | 304 | 5 | - | 11 | - | 3.88 | - | 7.86 | - |
| | (ඉ) | උක් | අක්කර | 1,040 | 1,200 | 2,570 | 2,000 | 30 | - | 28 | - | 2.88 | - | 1.09 | - |
| | (ඊ) | බඩ ඉරිඟු | අක්කර | 12,065 | 12,530 | 18,583 | 19,028 | 9,788 | 6,618 | 16,263 | 10,441 | 81.13 | 52.81 | 87.52 | 54.87 |
| | (උ) | අපනයන හා පාරම්පරික හෝග | අක්කර | 1,376 | 1,865 | 3,759 | 2,466 | 14 | 17 | 49 | 37 | 1.02 | 0.91 | 1.30 | 1.5 |
| | (ඌ) | මල් පැළ | සංඛ්‍යාව | 64,752 | 5,050 | 261 | 201 | - | - | - | - | - | - | - | - |
| | (එ) | වගා හෝග | අක්කර | 222 | 1,341 | 444 | 2,575 | 756 | 2,254 | 709 | 1,983 | 340.54 | 168 | 159 | 77 |
| | (ඒ) | අර්තාපල් | අක්කර | 600 | 1,280 | 3,037 | 3,200 | 817 | 732 | 2,919 | 2,886 | 136.17 | 57.18 | 96.11 | 90 |
| | (ඔ) | වෙනත් හෝග | අක්කර | 5,236 | 6,229 | 3,751 | 5,825 | 1,076 | 638 | 1,130 | 821 | 20.55 | 10.24 | 30.13 | 14.0 |
| | (ඕ) | එළවළු | අක්කර | 375 | 400 | 1,273 | 1,200 | 889 | 631 | 869 | 937 | 237.07 | 157.75 | 68.26 | 78 |
| 2. | පශු සම්පත් | | | | | | | | | | | | | | |
| | | ගවයින් | සංඛ්‍යාව | 11,200 | 10,096 | 25,928 | 23,381 | 12,982 | 4,856 | 16,729 | 11,899 | 115.91 | 48.09 | 64.52 | 50.89 |
| | | එළුවන් | සංඛ්‍යාව | 11,646 | 9,168 | 6,140 | 4,305 | 2,837 | 2,261 | 1,506 | 1,205 | 24.36 | 24.6 | 24.53 | 27.99 |
| 3. | ගබඩා | | සංඛ්‍යාව | 1,063 | 860 | 4,897 | 3,810 | 5 | 17 | 44 | 238 | 0.47 | 1.97 | 0.9 | 6.25 |
| 4. | කෘෂි උපකරණ | | සංඛ්‍යාව | 3,645 | 4,109 | 13,600 | 13,625 | 402 | 316 | 5,881 | 4,484 | 11.03 | 7.69 | 43.24 | 32.91 |
| 5. | සුවසෙත | | සංඛ්‍යාව | 36,085 | 33,715 | 15,478 | 14,946 | 13,181 | 2,013 | 6,953 | 1,040 | 36.53 | 5.97 | 44.92 | 6.9 |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6. | ජීවිත රක්ෂණ | සංඛ්‍යාව | 12,069 | 21,931 | 10,189 | 18,185 | 8,105 | 1,433 | 7,272 | 1,157 | 67.16 | 6.53 | 71.37 | 6.36 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) මිරිස්, අපනයන හා පාරම්පරික භෝග, වෙනත් භෝග, එළවළු, ගවයන් ගබඩා, කෘෂි උපකරණ, ජීවිත රක්ෂණ හා සුව සෙතට අදාළ රක්ෂණ කාර්යයන් සම්බන්ධයෙන් භෞතික ඉලක්ක සියයට 50 ට අඩුවෙන් ඉටුකර ගෙන තිබුණි. අපනයන හා පාරම්පරික භෝග, වෙනත් භෝග, සුවසෙත, ජීවිත රක්ෂණ හා ගබඩා රක්ෂණයට අදාළ භෞතික ඉලක්ක සියයට 7 කට අඩුවෙන් ඉටකර ගෙන තිබුණි.

(ආ) අපනයන හා පාරම්පරික භෝග, වෙනත් භෝග, එළවළු, ගබඩා, කෘෂි උපකරණ ජීවිත රක්ෂණ හා සුවසෙතට අදාළ රක්ෂණ කාර්යයන් සම්බන්ධයෙන් මූල්‍ය ඉලක්කයන් සියයට 50 ට අඩුවෙන් ඉටුකර ගෙන තිබුණි. අපනයන හා පාරම්පරික භෝග , ජීවිත රක්ෂණ, සුවසෙත හා ගබඩා රක්ෂණය සම්බන්ධයෙන් මූල්‍ය ඉලක්කයන් සියයට 10 කට අඩු ප්‍රමාණයක් පමණක් ඉටුකර ගෙන තිබුණි.

(ඇ) වී, මිරිස්, බඩ ඉරිඟු, අර්තාපල්, වෙනත් භෝග, ගවයන්, ජීවිත රක්ෂණ, කෘෂි උපකරණ හා සුවසෙත රක්ෂණය සම්බන්ධයෙන් මූල්‍ය ඉලක්ක ඉටුකර ගැනීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව අඩුවී තිබුණි.

(ඇ) මල් පැල, පොල් හා උක් රක්ෂණය සම්බන්ධයෙන් භෞතික හා මූල්‍ය ඉලක්ක සකස් කර තිබුණද , සමාලෝචිත වර්ෂය තුළ එක් රක්ෂණයක් හෝ කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

එක් සේවකයකු වයස අවු 57 න් පසු සේවා කාලය දීර්ඝ කිරීම සඳහා 2008 වර්ෂයේදී මණ්ඩලයට එරෙහිව නඩුවක් ගොනු කර තිබුණි. 2011 වර්ෂයේදී මණ්ඩලයට නඩුවෙන් අවාසි වී තිබු අතර ඒ සඳහා අභියාචනයක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද මණ්ඩලයේ පරිපාලනයේ නොසැලකිලිමත්කම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී උසාවිය විසින් අභියාචනය නිෂ්ප්‍රභා කර තිබුණි.

## 4.3 වත්කම් කළමනාකරණය

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලබාගත හැකිවු තොරතුරු අනුව , වාහන 4 ක් වර්ෂ 3 ක කාලයක් භාවිතා කිරීමෙන් තොරව ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ නිෂ්කාර්යව තිබුණි.

(ආ) රු.526,321 ක් වටිනාකම වු භාවිතා නොකළ මුද්‍රණ ද්‍රව්‍ය තොග දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව තිබුණි.

## 4.4 ව්‍යාපෘති ප්‍රමාදයන්

--------------------

ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2008 වර්ෂයේදී ඉඩමක් සංවර්ධනය කිරීම සඳහා රු.585,800 ක වියදමක් දරා තිබුණු අතර, එය 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන අත්තිතාරමක් ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද දීර්ඝ කාලයක් ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් තොරව ඉඩම නිෂ්කාර්යව පැවතුණි.

## 4.5 නිත්‍යානුකුල අයිතිය නොමැති ඉඩම්වල ගොඩනැගිලි ඉදිකිරීම

--------------------------------------------------------------------

(අ) ඉඩම්වල නිත්‍යානුකුල අයිතිය ලබාගැනීමෙන් තොරව ඇඹිලිපිටිය හා තඹුත්තේගම හි ගොඩනැගලි ඉදිකර තිබුණි. විස්තර පහත පරිදි වේ.

| ප්‍රදේශය | ඉදිකිරීම සඳහා වැයකළ මුදල |
|---|---|
| | රු. |
| ඇඹිලිපිටිය | 1,183,496 |

| | |
|---|---|
| තඹුත්තේගම | 1,283,815 |
| | ------------- |
| | 2,467,311 |

(ආ) 1986 සිට 2012 දක්වා කාලය තුළ කුලී , ප්‍රමාද ගාස්තු හා මුලික ගෙවීම ලෙස රු.1,844,750 ක් ගෙවිය යුතු බව නේවාසික ව්‍යාපෘති කළමනාකරු (වලව) විසින් මණ්ඩලයට දන්වා තිබුණි. දේපල අත්කර ගැනීම සඳහා අදාළ ක්‍රියාමර්ගයන් නොගැනීම හේතුවෙන් මණ්ඩලයට මෙම මුදල ගෙවීමට සිදුවී තිබුණි.

## 4.6 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

ලබාගත හැකිවු තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ දෙක සඳහා අනුමත කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | | | තථ්‍ය සේවක සංඛ්‍යාව | | | පුරප්පාඩු සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2012 දෙසැම්බර් 31 | 2011 දෙසැම්බර් 31 | 2010 දෙසැම්බර් 31 | 2012 දෙසැම්බර් 31 | 2011 දෙසැම්බර් 31 | 2010 දෙසැම්බර් 31 | 2012 දෙසැම්බර් 31 | 2011 දෙසැම්බර් 31 | 2010 දෙසැම්බර් 31 |
| විධායක | 56 | 56 | 45 | 34 | 38 | 39 | 22 | 18 | 06 |
| විධායක නොවන | 285 | 285 | 264 | 216 | 235 | 176 | 69 | 50 | 88 |
| සුළු සේවක | 80 | 80 | 69 | 56 | 60 | 60 | 24 | 20 | 09 |
| අනියම් | - | - | - | 02 | 07 | 68 | - | - | - |
| එකතුව | 421 | 421 | 378 | 308 | 340 | 343 | 115 | 88 | 103 |

2010, 2011 හා 2012 වර්ෂයන්හි පිළිවෙලින් 103, 88 හා 115 වශයෙන් පුරප්පාඩු පැවති බව මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වු අතර පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගෙන නොතිබුණි.

## 4.7 වාහන උපයෝජනය

මණ්ඩලය වෙත අයිතිය මාරු කර නොතිබු ජීප් රථ අටක් හා එක් කැබ් රථයක මණ්ඩලය විසින් දීර්ඝ කාලයක සිට භාවිතා කර තිබුණි. මෙම වාහන වලින් කිහිපයක් සමාලෝචිත වර්ෂය තුළ ආදායම් බලපත්‍ර හා රක්ෂණ ලබා ගැනීමෙන් තොරව මණ්ඩලය විසින් භාවිතා කර තිබුණි.

5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

5.1 සංයුක්ත සැලැස්ම

---------------------

2009 - 2012 දක්වා කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය ප්‍රකාරව එය 2012 වර්ෂය සඳහා යාවත්කාලීන කර නොතිබුණි.

5.2 ක්‍රියාකාර සැලැස්ම

මිරිස්, උක්, බඩ ඉරිඟු, මල් පැල, අපනයන හා පාරම්පරික භෝග, එළවළු, ගවයන්, එළුවන්, ගබඩා, කෘෂි උපකරණ, සුවසෙත සහ ජීවිත රක්ෂණයට අදාළ රක්ෂණයන් සම්බන්ධයෙන් 2012 වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මේ දක්වා තිබූ ඇතැම් ඉලක්කයන් ඉටුකර ගෙන නොතිබූ බවත් එය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බවත් නිරීක්ෂණය විය.

5.3 අයවැය පාලනය

අයවැය ගත ආදායම හා වියදම සහ 2012 වර්ෂය සඳහා තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි මුල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) රක්ෂණ යෝජනා ක්‍රම

(ආ) හානි රක්ෂණ ගෙවීම

(ඇ) සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර සැලැස්ම

(ඈ) අයවැය

(ඉ) සේවක ණය හා අත්තිකාරම් නිරවුල් කිරීම

(ඊ) නීති, රීති හා රෙගුලාසි වලට අනුකූලවීම

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

වැඩ බලන විගණකාධිපති

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனதுஇல / My No. } එෆ්බී/ ඊ/එෆ්පීඑස් / එෆ්ඒ/2012

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2014 පෙබරවාරි 20 දින

සභාපතිනිය ,
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) ( සී ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

සමාංක හා 2013 නොවැම්බර් 01 දින දරන ලිපියට යොමු වේ.

02. ඉහත සඳහන් ලිපිය සමඟ එවන ලද ඉංග්‍රීසි වාර්තාවේ මාගේ වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

පිටපත :- ලේකම් , මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය


අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. } 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR G AL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனதுஇல / My No. එෆ්බී/ ඊ/එෆ්පීඑස් / එෆ්ඒ/2012 | ඔබේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date 2013 නොවැම්බර් 01 දින |

සභාපතිනිය ,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) ( සී ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තිර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනතේ 28(4) වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2013 අගෝස්තු 29 දින මණ්ඩලයේ සභාපතිනිය වෙත නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka
දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම තක්සේරු කිරීම්වලදී, අවසථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.2 තත්ත්වාගණනය කළ මතය**

----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

**2.2.1 යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම**

--------------------------------------

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ශේෂය 2006 වර්ෂයේදී රු.මිලියන 2,003 ක් වූ ධන ශේෂයක සිට සමාලෝචිත වර්ෂය අවසානයට රු.48,945.1 ක ඍණ ශේෂයක් දක්වා පහත දැක්වෙන පරිදි අඩුවී තිබුණි.

මූල්‍ය ප්‍රකාශනවල සටහන් අනුව , 2010 අගෝස්තු අවසානයට සියළුම අරමුදල් අවසාන වී තිබුණු අතර, ඉන් පසු කෘෂිකාර්මික හා ණය රක්ෂණ මණ්ඩලයේ පවතින වෙනත් අරමුදල් වලින් කෙටි කාලීන ණය ලබා ගනිමින් මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකර තිබුණි. එබැවින් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අනාගත පැවැත්ම සම්පූර්ණයෙන්ම රජයේ ප්‍රදාන මත රඳා පවතී.

| වර්ෂය | යෝජනා ක්‍රමයේ ශේෂය |
|---|---|
| ------- | ------------------------- |
| | රු.මිලියන |
| 2006 | 2,003.7 |
| 2007 | 1,639.8 |
| 2008 | 1,404.8 |
| 2009 | 663.8 |
| 2010 | (40,536.7) |
| 2011 | (44,154.2) |
| 2012 | (48,945.1) |

## 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම

-----------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 1 ප්‍රකාරව පළමුවරට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 39 ප්‍රකාරව ලාභය හෝ පාඩුව මඟින් සාධාරණ අගය, ණය සහ ලැබිය යුතු ශේෂ කල්පිරීම හා විකිණීමට තබා ගැනීම ආදී මූල්‍ය උපකරණ හඳුනා ගෙන නොතිබුණි.

(ඇ) මූල්‍ය උපකරණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 07 ප්‍රකාරව හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ඈ) නියම කරන ලද ප්‍රතිලාභී සැලැස්ම සඳහා ආයුගණක තක්සේරුව හා ඒ සඳහා ගිණුම් තැබීම සිදුකර නොතිබුණි. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 19 ප්‍රකාරව නියම කරන ලද ප්‍රතිලාභී සැලැස්ම යටතේ වගකීම නිදහස් කිරීම සඳහා සේවක හා සේවක දෙපාර්ශ්වය විසින් තවදුරටත් සිදුකරන දායකයන් ආයෝජනය කර නොතිබුණි.

(ඉ) විශ්‍රාම වගකීම සඳහා අවසාන ආයුගණක තක්සේරුව 2007 වර්ෂයේදී සිදුකරන ලද අතර ඉන් පසු විශ්‍රාම වගකීම සඳහා ආයුගණක තක්සේරුවක් සිදුකර නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වගකීම් පිළිබඳ නිරවද්‍යතාවය ප්‍රශ්නගත වේ.

## 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල ගොවීන්ට ගෙවන ලද රු.7,305,897 ක් වූ විශ්‍රාම වැටුප් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල විශ්‍රාම වැටුප් වගකීමෙන් අඩුකර නොතිබුණි. එබැවින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයට විශ්‍රාම වැටුප් වගකීම එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2012 වර්ෂය තුළදී විශ්‍රාම වැටුප් ආපසු ගැනීමේදී තැපැල් කාර්යාල වලට ගෙවන ලද රු.6,148,860 ක් වූ කොමිස් මුදල, කොමිස් මුදල් ලෙස ගිණුම් ගත කරනු වෙනුවට විශ්‍රාම වැටුප් වගකීමෙන් අඩුකර දක්වා තිබුණි.

## 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන රු.4,654,023 ක් වූ ලැබිය යුතු මුළු ශේෂ එකතුවෙන් රු.2,111,885 ක් එනම් සියයට 45 ක් පමණක් අදාල පාර්ශ්වයන් විසින් සනාථ කර තිබුණි.

(ආ) එකතුව රු.2,382,031 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු දීර්ඝ කාලයක සිට නිරවුල් කර නොතිබුණි.

(ඇ) යෝජනා ක්‍රමය එහි සියළුම මුදල් වැයකර අවසන් වීම හේතුවෙන් , ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් රු.533,014,955 ක හා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් රු.260,976,074 ක කෙටි කාලීන ණය ලබා ගනිමින් මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකර තිබුණි. ඉහත ණය හා ඒ මත පොලී 2013 මැයි 20 වන විටත් නිරවුල් කර නොතිබුණි.

## 2.2.5 මතභේදයට තුඩුදෙන කරුණු

--------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ රු.2,791,679 ක් වටිනාකම වූ චෙක්පත් 48 ක් හා රු.7,152,249 ක් වූ බැංකු අණකර මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් 2 දෙනෙකු හා එක් සහකාර අධ්‍යක්ෂවරයකු විසින් වංචා කර තිබුණි. මේ සම්බන්ධයෙන් මහාධිකරණයේ නඩුවක් ගොනුකර ඇති බව මණ්ඩලය විසින් මා වෙත දන්වා තිබුණි.

(ආ) රු.369,590 ක් වූ විශ්‍රාම මුදල් වංචා කරන ලද ක්ෂේත්‍ර නිලධාරියකුට විරුද්ධව ගොනු කර ඇති නඩුවෙන් සමාලෝචිත වර්ෂයේදී එම නිලධාරියා සේවයෙන් පහකර තිබුණි. කෙසේ වුවද ඔහුගෙන් රු.100,000 ක මුදලක් පමණක් අයකරගෙන තිබුණු අතර නඩුව අවසන් කර තිබුණි. එබැවින් රු.269,590 ක ශේෂය අයකර ගත නොහැකි වූ අතර ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

## 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

ලිඛිත සාක්ෂි 2013 මැයි 20 දක්වා ඉදිරිපත් නොවීම හේතුවෙන් ගිණුම්වල වූ පහත දැක්වෙන විෂයය විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| විස්තරය | මුදල | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| අනුරාධපුරය හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල ගොවීන් 936 ක් සඳහා ගෙවන ලද විශ්‍රාම වැටුප් ගෙවීම් | 3,288,000 | විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ විස්තරාත්මක උපලේඛන |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු.4,670,653,346 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය

රු.3,617,570,557 ක් වුයෙන් රු.1,053,082,789 කින් එනම් සියයට 29 කින් මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමක් දැක්වුණි. විස්තර පහත දැක්වේ.

| | 2012 | 2011 | විචලනය ප්‍රතිශතය |
|---|---|---|---|
| | ------- | ------- | ------------------- |
| | රු. | රු. | |
| පොලී ආදායම | 2,702,921 | 1,566,195 | 72.6 |
| ගොවීන්ගේ දායකය | 55,475,042 | 108,458,800 | (48.8) |
| විශ්‍රාම වැටුප් ගෙවීම | (1,380,677,601) | (1,226,744,103) | (12.5) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (52,552,338) | (54,806,188) | 4.1 |
| වියදමට වැඩි ආදායම | (1,375,051,976) | (1,171,525,296) | (17.37) |
| රජයේ ප්‍රදාන | 8,232,560 | 664,855,487 | (98.8) |
| විශ්‍රාම වැටුප් බැරකම වැඩිවීම | 3,216,991,000 | (3,059,459,000) | 5.1 |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය | 1,320,949 | 1,227,701 | 7.6 |
| පරිපාලනය සඳහා ආදායම | 66,292,332 | 68,159,142 | (2.7) |
| පරිපාලන හා මූල්‍ය වියදම් | (154,456,210) | (120,828,592) | (27.8) |
| වර්ෂය සඳහා සමස්ත ඌනතාවය | | | |
| | (4,670,653,346) | (3,617,570,557) | 29.11 |

ඉහත ප්‍රතිඵලය සඳහා පහත දැක්වෙන කරුණු හේතුවී තිබුණි.

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පොලී ආදායම සියයට 72.6 කින් වැඩිවී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ගොවීන්ගේ දායකය සියයට 48.8 කින් අඩුවී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 ප්‍රකාරව 2007 වර්ෂයේදී සිදුකරන ලද ආයුගණක තක්සේරුව මත පදනම්ව ශේෂ පත්‍ර දිනයට ගොවින්ගේ විශ්‍රාම වැටුප් වගකීම තීරණය කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල විශ්‍රාම වැටුප් වගකීම වැඩිවීම රු.3,216,991,000 ක් ලෙස දක්වා තිබුණු අතර අනුරූපී සංඛ්‍යා නැවත දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා රු.මිලියන 8.23 ක් වු රජයේ ප්‍රදානය ලැබී තිබුණි. ඉකුත් වර්ෂයේ අනුරූපී සංඛ්‍යා සමඟ සැසඳීමේදී එය සියයට 98.8 කින් අඩුවී තිබුණි.

## 3.2 මූල්‍ය ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වය පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනය

-----------------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිපාලන වියදම් වලින් කොටසක් රජයේ ප්‍රදාන වලින් දරා තිබුණද , යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය තවදුරටත් අවදානම් තත්ත්වයක විය. යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රතිඵලය පහත දැක්වෙන පරිදි 2008 වර්ෂයේ රු.මිලියන 235 ක ඌනතාවය 2012 වර්ෂයේදී රු.මිලියන 4,671 ක ඌනතාවයක් දක්වා පිරිහී තිබුණි. එබැවින් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ පැවැත්ම පිළිබඳ බරපතල අවිනිශ්චිතතාවයක් පවතී.

ඉකුත් වර්ෂ පහක මූල්‍ය ප්‍රතිඵල අනුව ශුද්ධ ඌනතාවය පහත පරිදි වේ.

| | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|
| | රු.(000) | රු.(000) | රු.(000) | රු.(000) | රු.(000) |
| මුළු ආදායම | 61,148 | 115,434 | 170,898 | 306,607 | 431,209 |
| මුළු වියදම | (1,587,686) | (1,402,349) | (1,195,110) | (1,103,779) | (951,623) |
| විශ්‍රාම වැටුප් වගකීම වැඩිවීම | (3,059,459) | (2,938,033) | - | - | - |
| ශුද්ධ අතිරික්තය / (ඌනතාවය) | (4,743,529) | (4,346,404) | (3,962,245) | (797,172) | (520,414) |
| රජයේ ප්‍රදාන | 71,555 | 727,605 | 39,500 | 55,860 | 285,000 |
| රජයේ ප්‍රදාන ක්‍රම ක්ෂය | 1,321 | 1,228 | 1,477 | - | - |
| රජයේ ප්‍රදාන වලින් පසු ශුද්ධ අතිරික්තය / ( ඌනතාවය ) | (4,670,653) | (3,617,571) | (3,921,268) | (741,312) | (235,414) |

i. 2008 සිට 2012 දක්වා කාල පරිච්ඡේදය තුළ බඳවා ගැනම් සඳහා උනන්දු නොකිරීම හේතුවෙන් ආදායම සියයට 85 කින් ක්‍රමයෙන් අඩුවී තිබුණු අතර විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් ලැබූ ගොවීන්ගේ ප්‍රමාණය වැඩිවීම හා යෝජනා ක්‍රමයෙන් ආපසු ගැනීම් වැඩිවීම හේතුවෙන් එම කාල පරිච්ඡේදය තුළ එම මුළු වියදම සියයට 67 කින් වැඩිවී තිබුණි.

ii. නියම කොන්දේසි වලට විශ්‍රාම වැටුප් බැරකම තහවුරු කිරීම හේතුවෙන් හා වියදම වැඩිවීම හේතුවෙන් 2008 සිට 2012 කාල පරිච්ඡේදය තුළදී රජයේ ප්‍රදානයට පෙර ශුද්ධ අතිරික්තය සීඝ්‍ර ලෙස අඩුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 තුළදී යෝජනා ක්‍රමය සඳහා ගොවීන්ගෙන් එකතු කර ගන්නා ලද මුළු දායකයන් හා විශ්‍රාම වැටුප් ගෙවීම් පහත දැක්වේ.

| වර්ෂය | දායකය | විශ්‍රාම වැටුප් ගෙවීම |
|---|---|---|
| ------- | --------- | -------------------- |
| | රු.මිලියන | රු.මිලියන |
| 2008 | 163.1 | 809.1 |
| 2009 | 148.7 | 955.6 |
| 2010 | 136.7 | 1,044.7 |
| 2011 | 97.6 | 1,226.7 |
| 2012 | 49.6 | 1,380.7 |

(ඇ) පහත දැක්වෙන පරිදි 2007 වර්ෂයේ සිට ආයෝජන සීඝ්‍රයෙන් අඩුවී තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2012 වර්ෂයේදී ආයෝජන වලින් ලද ආදායමද සීඝ්‍ර අඩුවීමක් වාර්තා කර තිබුණි.

| වර්ෂය | වර්ෂය අවසානයට ආයෝජන | වර්ෂය සඳහා පොලී ආදායම |
|---|---|---|
| ------- | --------- | -------------------- |
| | රු.මිලියන | රු.මිලියන |
| 2007 | 1,656.0 | 251.3 |
| 2008 | 1,256.1 | 243.9 |
| 2009 | 582.2 | 138.9 |
| 2010 | 3.5 | 14.9 |
| 2011 | 30.7 | 1.6 |
| 2012 | 12.4 | 2.7 |

ඉහත තොරතුරු වලට අනුව , ආයෝජන 2007 වර්ෂයේ රු.මිලියන 1,656 සිට 2012 වර්ෂයේ රු.මිලියන 12.4 දක්වා එනම් සියයට 99 ක් දක්වා අඩුවී තිබුණු අතර පොලී ආදායම 2007 වර්ෂයේ රු.මිලියන 251.3 සිට 2012 වර්ෂයේ රු.මිලියන 2.7 දක්වා එනම් සියයට 98.92 ක් දක්වා අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 4.1 කාර්ය සාධනය

-----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේදී යෝජනා ක්‍රමයේ අරමුදල් භාරදී තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස යෝජනා ක්‍රමයේ මූල්‍ය හිඟයන් වැඩිවීම හේතුවෙන් බඳවා ගැනීම් නවතා තිබුණි. යෝජනා ක්‍රමයේ මෙහෙයුම් පිළිබඳ අවසාන තීරණයක් ගෙන නොතිබුණි. එබැවින් ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා 2012 වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී රු.58,428,092 ක් වූ දෙවැනි හා පසු වාරික රැස්කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී එක් ගොවියෙකු හෝ බඳවා ගැනීම් කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1992 වර්ෂයේ සිට උපලබ්ධි නොවී පැවතුණු බැංකු ගිණුම් තුනක තැන්පත් කරන ලද චෙක්පත් 116 කට අදාළව රු.1,179,624 ක්වූ උපලබ්ධි නොවූ තැන්පතු වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. විස්තර පහත පරිදි වේ.

| ගිණුම් අංකය | තැන්පත් කරන ලද කාල පරිච්ඡේදය | චෙක්පත් සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| 100-150-112345 | 1992- 2000 | 81 | 1,112,339 |
| 100-150-112347 | 1993-2012 | 07 | 40,650 |
| 100-150-112344 | 1993-1998 | 28 | 26,635 |
| | | ---- | ------------ |
| | | 116 | 1,179,624 |

## 4.3 ව්‍යාපෘති ප්‍රමාදයන්

---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යෝජනා ක්‍රමයේ දායකයන්ගේ පෞද්ගලික ගිණුම් පරිගණක ගත කිරීම සඳහා 1987 වර්ෂයේ සිට රු.මිලියන 21.5 ක මුදලක් ගෙවා තිබුණද , වර්ෂ 25 ක් ගත වීමෙන් පසුව , 2012 දෙසැම්බර් 31 වන විටත් ගිණුම් පරිගණක ගත කිරීම සම්පූර්ණ කර හෝ යාවත්කාලීන කර නොතිබුණි. ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට දායක මුදල් ගෙවීම සඳහා දායකයින් සුදුසු බවට පත්වීම තීරණය කිරීමට ප්‍රමාණවත් තොරතුරු යෝජනා ක්‍රමය සතු නොවීය. දායකයන්ගේ ගිණුම් දිස්ත්‍රික් කාර්යාල මගින්ද යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරකෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා නව පරිගණක පද්ධතියක් සංවර්ධනය කිරීමට 2008 වර්ෂයේදී කොළඹ විශ්ව විද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඒ මත දරන ලද වියදම රු.5,479,120 ක් විය. ගිවිසුමට අනුව ව්‍යාපෘතිය මාස 6 ක් ඇතුළත නිම කළ යුතු වුවද එය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිම කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) පරිගණකගත පද්ධතිය

(ආ) මූල්‍ය කළමනාකරණය

(ඇ) විශ්‍රාම වැටුප් ගෙවීම හා නොගෙවන ලද විශ්‍රාම වැටුප්

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

වැඩ බලන විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENE[illegible]S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No. } එෆ්බී/ඊ/එෆ්අයිඑස්එච්/ එෆ්ඒ/2012

මබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதි / Date } 2013 දෙසැම්බර් 31 දින

සභාපතිනිය
ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) සී වගන්ති ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

මාගේ සමාංක හා 2013 නොවැම්බර් 01 දිනැති ලිපිය හා බැඳේ.

2. ඉහත සඳහන් ලිපිය සමඟ ඉංග්‍රීසි අනුවාදය එවන ලද මාගේ වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

පිටපත - ලේකම් , මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. } 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனதுஇல / My No. එෆ්බී/ ඊ/එෆ්අයිඑස්එච්/ එෆ්ඒ/2012

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2013 නොවැම්බර් 01 දින

සභාපතිනිය ,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) ( සී ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනතේ 28(4) වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14( 2 )( සී ) වගන්තිය ප්‍රකාර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2013 සැප්තැම්බර් 05 දින මණ්ඩලයේ සභාපතිනිය වෙත නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.3 තත්ත්වාගණනය කළ මතය

----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 2.2.1 විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

---------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් වගකීම තක්සේරු කර තහවුරු කර තිබුණු අතර ප්‍රතිපාදනය ආදායමට එරෙහිව අයකර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවලට විශාල සෘණ බලපෑමක් ඇති වී තිබුණි. ඒ අනුව ඉදිරි වර්ෂයන් සඳහා ප්‍රතිපාදනය වැඩිවනු ඇති අතර ඉදිරි පාඩු වැඩිවීමද සිදුවනු ඇත. තවද විශ්‍රාම වැටුප් වගකීම තහවුරු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ වත්කම්

තත්ත්වයෙහි සෘණ අගයක් දැක්වේ. මෙය විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්මට අයහපත් ලෙස බලපානු ඇත.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම

---------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පළමුවරට අනුගමනය කිරීම මගින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 1 ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 ප්‍රකාරව ණය සහ ලැබිය යුතුදෑ , විකිණීමට ඇති දෑ මූල්‍ය වත්කම්වල ලාභය හෝ පාඩුව මගින් සාධාරණ අගයට ගෙන නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 07 ප්‍රකාරව මූල්‍ය උපකරණවලට අදාළව හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 ප්‍රකාරව නියම කරන ලද ප්‍රතිලාභ සැලැස්මක් යටතේ වගකීම බෙදාහැරීමේ අරමුණින් නියම කරන ලද ප්‍රතිලාභී සැලැස්ම සඳහා ආයු ගණක තක්සේරුව හා එහි ගිණුම් තැබීම සිදුකර නොතිබුණි. එසේම සේවාදායක විසින් කරන ලද දායකයද ආයෝජනය කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 ප්‍රකාරව විශ්‍රාම වැටුප් බැරකම සඳහා ආයුගණක තක්සේරුව 2007 වර්ෂයේදී කර තිබුණු අතර ඉන්පසු 2013 මැයි 20 දක්වා විශ්‍රාම වැටුප් බැරකම සඳහා ආයුගණක තක්සේරුවක් කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 1991 මාර්තු 19 දිනැති අංක 01 දරන චක්‍රලේඛයට අනුව, මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සභාපති හා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ පරිපාලන වියදම් ප්‍රතිපූරණය කිරීමට එකඟ වී තිබුණු අතර ඒ අනුව මෙම වියදම් 2010 වර්ෂය දක්වා ප්‍රතිපූරණය කර තිබුණි. කෙසේ වුවද, 2011 වර්ෂය සඳහා ලැබිය යුතු මුදලද මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ලෙස දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු මුදල ගිණුම්වලට ගෙන නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂයේ අදායම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවන ලද රු.371,190 ක් වූ කොමිස් මුදල විශ්‍රාම වැටුප් බැරකමෙන් අඩුකර තිබුණි. විශ්‍රාම වැටුප් බැරකම තක්සේරු කිරීමේදී මෙම කොමිස් මුදල ඇතුළත් කර නොතිබුණි. එබැවින් එම මුදලින් විශ්‍රාම වැටුප් බැරකම අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) මුල්‍ය ප්‍රකාශන අනුව, යොජනා ක්‍රමයේ සේවකයන් 6 දෙනෙකු සඳහා වැටුප් වියදම් හා පාරිතෝෂික ප්‍රතිපාදන කර තිබුණු බව නිරීක්ෂණය විය. භෞතික පරීක්ෂණයට අනුව, සේවකයන් 4 ක් පමණක් ධීවර විශ්‍රාම වැටුප් අංශයට අනුයුක්ත කර තිබූ බවත් මෙම සේවකයන් සඳහා පමණක් වැටුප් හා පාරිතෝෂික වෙන්කළ යුතු බවත් නිරීක්ෂණය විය. එබැවින් වැටුප් වියදම් රු.602,864 ක් හා පාරිතෝෂික ප්‍රතිපාදන රු.304,360 ක් මුල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

## 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

-------------------------------

ධීවර අංශයෙන් ලැබී තිබුණු තොරතුරු අනුව, පහත සඳහන් පැහැදිලි නොකළ වෙනස්කම් විගණනයේදී නිරීක්ෂණය විය. මෙම වෙනස්කම් 2013 මැයි 20 දක්වා සැසඳීම් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| විස්තර | මුල්‍ය ප්‍රකාශන අනුව මුදල<br>රු. | ධීවර අංශය විසින් පවත්වා තිබුණු වාර්තා අනුව මුදල<br>රු. | වෙනස<br>රු. |
|---|---|---|---|
| ධීවර විශ්‍රාම වැටුප් සඳහා දායකය | 3,442,392 | 2,934,986 | 507,406 |
| ශුද්ධ දායකය ආපසු ගෙවීම | 506,856 | 191,600 | 315,256 |
| ශුද්ධ පොලී ආපසු ගෙවීම | 433,133 | 204,168 | 228,965 |
| මරණ පාරිතෝෂික ගෙවීම | 658,797 | 826,000 | (167,203) |

## 2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

පහත නරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ණය මුදලක් ලෙස රු.මිලියන 608 ක මුදලක් ගොවි විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවා තිබූ අතර ශේෂ පත්‍ර දිනයට පොලිය ඇතුළත් හිඟ මුදල රු.මිලියන 608 ක් විය. මෙම හිඟ මුදල අයකර ගැනීමට 2013 මැයි 20 දක්වා ධීවර විශ්‍රාම වැටුප අරමුදලට නොහැකිවී තිබුණි.

(ආ) එකතුව රු.1,059,025 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු දීර්ඝ කාලයක් නිරවුල් නොකර තිබුණි.

(ඇ) රු.823,980 ක් වූ නොගෙවූ ධීවර විශ්‍රාම වැටුප් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා නොතිබුණි.

### 2.2.6 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති , රීති ආදියට යොමුව** | | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත | | |
| (i) | 20 වගන්තිය | විධිවිධාන ප්‍රකාරව උපදේශක කමිටුව නිල බලයෙන් සාමාජිකයන් 06 දෙනෙකු හා නම් කළ සාමාජිකයන් 06 දෙනෙකු ඇතුළත්ව සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද , 2012 වර්ෂය තුළදී සාමාජිකයන් 06 දෙනෙකු පමණක් පත්කර තිබුණි. |
| (ii) | 26 වගන්තිය | පනත ප්‍රකාරව සාමාජික ගාස්තු ගෙවීම පැහැර හැරිය සාමාජිකයන්ගේ සාමාජිකත්වය අවලංගු කිරීම සම්බන්ධයෙන් අදාළ සාමාජිකයන් දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | |
| 9 පරිච්ඡේදයේ 7 ඡේදය | | මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව නිලධාරීන් කිහිපදෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.352,428 ක් වූ විශේෂ දීමනා ගෙවා තිබුණි. |

### 2.2.7 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

----------------------------------

ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට ලබාදෙන ලද අරමුදල් සඳහා රු.55,301,495 ක පොලී මුදලක් සමාලෝචිත වර්ෂය සඳහා පොලී ආදායම ලෙස

හදුනාගෙන තිබුණි. කෙසේ වුවද මෙම යෝජනා ක්‍රම දෙක අතර ස්ථිර පොලී අනුපාතයක් ගෙවීමට කිසිදු ගිවිසුමක් නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මුළු ආදායමෙන් සියයට 92.5 ක් පොලී ආදායමින් නියෝජනය වී තිබු බැවින් ඉහත මුදල යෝජනා ක්‍රමයේ පොලී ආදායම ලෙස හඳුනා ගැනීම ගැටලු සහගත වේ.

## 3. මූල්‍ය ප්‍රකාශන

----------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ වැඩ කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.30,667,022 ක මෙහෙයුම් අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.15,705,562 ක් වුයෙන් රු.14,961,460 කින් එනම් සියයට 95 කින් මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමක් දැක්වුණි. විස්තර පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | විචලනය |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | % |
| පොලී ආදායම | 59,813,431 | 40,525,747 | 47.6 |
| ධීවරයින්ගේ දායකය | 3,442,392 | 3,025,262 | 13.78 |
| විශ්‍රාම වැටුප් ගෙවීම | (29,496,923) | (24,636,392) | (19.72) |
| වෙනත් මෙහෙයුම් වියදම | (3,091,878) | (3,209,055) | 3.6 |
| මෙහෙයුම් අතිරික්තය | 30,667,022 | 15,705,562 | 95.0 |
| මෙහෙයුම් ප්‍රදාන | - | 1,500,000 | - |
| විශ්‍රාම වැටුප් බැරකම වැඩිවීම | (181,213,000) | (170,403,000) | (6.0) |
| පරිපාලන හා මූල්‍ය වියදම් | (4,147,199) | (4,180,860) | 0.8 |

| | | | |
|---|---|---|---|
| වර්ෂය සඳහා සමස්ත ඌනතාවය | (154,693,177) | (157,378,298) | 1.7 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා දී තිබූ ණය මත ලැබිය යුතු පොලී වැඩිවීම හේතුවෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පොලී ආදායම සියයට 47.59 කින් වැඩිවී තිබුණි. භාණ්ඩාගාර බිල්පත් පොලිය රු.4,511,936 ක් වූ අතර එය මුළු පොලී ආදායමෙන් සියයට 7.5 ක් විය.

(ආ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ධීවරයන්ගේ දායකය සියයට 13.78 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් අරමුදලට මුළු දායකය රු.3,442,392 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා මුළු විශ්‍රාම වැටප් ගෙවීම රු.29,496,923 ක් විය. එබැවින් විශ්‍රාම වැටුප් ගෙවීම සියයට757 කින් දායකය ඉක්මවා තිබුණි.

(ඇ) 2007 වර්ෂයේ කරන ලද ආයු ගණක තක්සේරුව මත පදනම්ව මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයට විශ්‍රාම වැටුප් වගකීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 ප්‍රකාරව සහතික කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල විශ්‍රාම වැටුප් වගකීම වැඩිවීම රු.181,213,000 ක් ලෙස දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ශේෂය රු.මිලියන 27.4 කින් එනම් සියයට 44 කින් අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 4.1 කාර්ය සාධනය

-----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යෝජනා ක්‍රමයට දායකයින් වැඩි ප්‍රමාණයක් බඳවා ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු ප්‍රවර්ධන වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා දායකයින් 2,140 ක් ඉලක්ක කර තිබුණද , බඳවා ගත් තථ්‍ය දායක සංඛ්‍යාව 498 පමණක් වූ අතර සියයට 23.27 ක ඉටුකර ගැනීමක් පමණක් එයින් දැක්වුණි. දිස්ත්‍රික්ක තුනක එක් දායකයෙක් හෝ බඳවා ගෙන නොතිබූ බවද නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා බඳවා ගැනීම් පිළිබඳ මූල්‍ය ඉලක්කය රු.4,117,000 ක් වූ නමුත්, තථ්‍ය දායකත්වය රු.2,104,381 ක් පමණක් විය. මෙම අඩු කාර්ය සාධනය සඳහා හේතුවී තිබුණේ දිස්ත්‍රික්ක දෙකක එක් දායකයෙක් හෝ මේ සඳහා බඳවා නොගැනීමත් දිස්ත්‍රික්ක 5 ක සඳහා එක් දායකයකු පමණක් බඳවා ගැනීමත් බවද නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දායකයන් 39,854 ක ගෙන් දෙවැනි සහ පසු වාරික එකතු කිරීමේ ඉලක්කය රු.5,978,000 ක් වුවද තථ්‍ය එකතු කිරීම දායකයින් 1,122 ක ගෙන් රු.830,605 ක් පමණක් විය. ඒ අනුව, තථ්‍ය මූල්‍ය ඉටුකරගැනීම සියයට 13.89 ක් පමණක් වූ අතර තථ්‍ය බඳවා ගැනීමේ ප්‍රගතිය සියයට 2.81 ක් පමණක් විය. දිස්ත්‍රික්ක 11 කින් එක් වාරිකයක් හෝ රැස්කර ගෙන නොතිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව, රු.29,496,923 ක් වූ විශ්‍රාම වැටුප් ගෙවීම් කර තිබුණු අතර එකතු කරන ලද මුළු දායකය රු.1,793,052 ක් එනම් සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද මුළු විශ්‍රාම වැටුප් ගෙවීම් වලින් සියයට 6.0 ක් පමණක් විය.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

ධීවර විශ්‍රාම යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය අහිමි කරන ලද දායකයින් හඳුනා ගැනීමට හා හිඟ වාරික අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අරමුණු ඉටුකර ගැනීම.

(ආ) ධීවරයින්ට ප්‍රතිලාභ ගෙවීම

(ඇ) ලැබිය යුතු මුදල්

(ඈ) 2 වන සහ පසු වාරික අයකර ගැනීම

(ඉ) උපදේශක කමිටුවල ක්‍රියාකාරිත්වය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

වැඩ බලන විගණකාධිපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
**AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD**

විදුලි පණිවිඩ / தந்தி / Telegrams: රක්ෂණ / ரக்ஷன / Rakshana

117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේ
117, Subadrarama Rd., Gangodavila, Nugegoda


dd

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No.: 2012/4/5/මු/ර/2

ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No.: ..............................

දිනය / திகதி / Date: 2013.07.08

විගණන අධිකාරි,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

**2012 වර්ෂයේ කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14 (2) (C) වාර්තාව සඳහා පිළිතුරු සැපයීම.**

2012 වර්ෂයේ කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14 (2) (C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

..............................
අධ්‍යක්ෂ ජනරාල්
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය


| දුරකථන / தொலைபேசி / Telephones | සභාපති / தலைவர் | අධ්‍යක්ෂ ජනරාල් | ප්‍රධාන කාර්යාලය / தலைமையகம் |
|---|---|---|---|
| | 011-2812571 | 011-5732397 | 011-5384000 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 011-2812572 | 011-2812574 | |
| | 011-2812573 | | |


Back

**<u>කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු.</u>**

**2. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**2.1 <u>මතය</u>**

**2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

**2.2.1 <u>මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම</u>**

**(අ)** 1973 වර්ෂයේ ආරම්භ කරන ලද කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය කෘෂිකාර්මික රක්ෂණ කටයුතු වල යෙදෙන එකම රාජ්‍ය ආයතනය වේ. දේශීය කෘෂිකර්මාන්තයේ අග්‍රගන්‍ය රැකවලා වීම අපගේ අරමුණ වේ. පසුගිය වර්ෂ 6 සැලකිල්ලට ගතහොත් 2010 වර්ෂය හා 2012 වර්ෂය හැර ඉතිරි වර්ෂ සියල්ලෙහිම මෙහෙයුම් ලාභයක් ලබාගැනීමට සමත් වී ඇත.

පසුගිය වර්ෂ 6 දත්තයන් පහත පරිදි වේ.

| **වර්ෂය** | **වාරික ආදායම** | **රක්ෂණ වන්දි ගෙවීම්** | **ප්‍රතිශතයක් ලෙස (%)** |
|---|---|---|---|
| 2007 | 37.5 | 21.3 | 56.8 |
| 2008 | 70.5 | 27 | 38.2 |
| 2009 | 83.4 | 31 | 37.1 |
| 2010 | 105.1 | 268.7 | (255.6) |
| 2011 | 157.4 | 57.3 | 36.4 |
| 2012 | 124.7 | 126.6 | (101.5) |

මෙම දත්තයන් පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ 2010 හා 2012 වර්ෂයේදී හැර අනෙකුත් වර්ෂයන් හිදී රක්ෂණ ආදායමින් වන්දි කළමණාකරණය කර ගැනීමට හැකිවූ බවයි. 2010 හා 2012 වර්ෂයන්හිදී ඇති වූ දැඩි අයහපත් කාළගුණ තත්වය නිසා මෙලෙස රක්ෂණය වූ ගොවිජනතාව නගා සිටු වීම වෙනුවෙන් වන්දි ගෙවීමට සිදු විය.

ඉදිරියේදී ඇති වන අනපේක්ෂිත තත්වයන්හිදී කෘෂි රක්ෂණ අරමුදල වන්දි ගෙවීම සඳහා ප්‍රමාණවත් නොවුව හොත් භාණ්ඩාගාරය සමග සාකච්ඡා කොට ඒ සඳහා විසඳුම් ලබා ගැනීමට අපේක්ෂිතය.

**(ආ)** පසුගිය වර්ෂ කිහිපය තුලදීම ඇති වූ දේශගුණික විපර්යාසයන් නිසා දේශීය ගොවිජනතාවගේ වගා විනාශයට පත්වීම නිසා මහත් අපහසුතාවයට පත් විය. මණ්ඩලයේ රක්ෂණ ආවරණ ලබාගත් ගොවිජනතාව වෙත කඩිනමින් වන්දි ගෙවීම තුලින් ඔවුන්ගේ ජීවනෝපාය නගා සිටුවීමට අප මණ්ඩලය සමත්විය.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

**(අ)** නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මුහුණත ඉදිරිපත් කිරීම් සිදු කරනු ලැබුව ද ප්‍රථම වරට ඉදිරිපත් කිරීමේදී සිදුකල යුතු □□□□□□□□□□□□□□□□□□□□ සහ □□□□□□□□□□□□□□□□ සිදු නොකරන ලදී. ඉදිරි ගිණුම් වර්ෂයේදී මණ්ඩලයේ වත්කම් හා වගකීම් නැවත වර්ගීකරණය (□□□□□□□□□□□□□□□□□□□□□) සහ නැවත ගණනය (□□□□□□□□□□□□□□□□□) කිරීමට අපේක්ෂිතය.

**(ආ)** කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය සතුව දිගු කාලීන ආයෝජන කිසිවක් නොපවතින අතර සියළු ආයෝජනයන් කෙටිකාලීන වේ. එබැවින් එම ආයෝජනයන් වෙලඳපොල වටිනාකම හා පොත් වටිනාකම අතර වෙනසක් නොමැත.

**(ඇ)** ඉදිරියේදී අවශ්‍ය හෙලිදරව්ව කිරීමට අපේක්ෂිතය.

**(ඈ)** පාරිතෝෂික වගකීම ගණනය කිරීමේදී ජීවගණන තක්සේරුවක් සිදුනොකලද සත්‍ය වැටුප පදනම් කොටගෙන එම වගකීම ගණනය කර ඇත.මෙම වගකීම සඳහා වෙනම ආයෝජන පවත්වා ගෙන නොගියද මණ්ඩලයේ අනෙකුත් ආයෝජන තුල මෙම ආයෝජනයන් අන්තර්ගතව ඇත.

**(ඉ)** අදාල නඩුව පිළිබඳව මූල්‍ය වාර්තාව තුල හෙලිදරව් කිරීමක් සිදු කර තිබූ අතර එම නඩු තීන්දුවට අනුව වන්දි ගෙවීමට සිදු වූ 2013 වර්ෂයට අදාලව ගිණුම් ගත කිරීමට අපේක්ෂිතය.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

**(අ)** වගා රක්ෂණ කටයුතු මෙහෙයුම් සඳහා භූතොරතුරු තාක්ෂණය යොදා ගැනීමේ ශක්‍යතා අධ්‍යයන නියමු ව්‍යාපෘතිය පර්යේෂණ පිරිවැයක් වන අතර මෙම රු.153,836/- මුදල නැවත මොරටුව විශ්වවිද්‍යාලය වෙත ගෙවීම සිදුකරන වර්ෂයේදී වියදමක් ලෙස ගිණුම් ගත කිරීමට අපේක්ෂිතය.

**(ආ)** හිටපු සභාපතිතුමාගේ මාසික දීමනාවෙන් අඩුකරන ලද උපයන විට ගෙවීම එම වියදම සිදු කරන ලද 2013 වර්ෂයේ ගිණුම්ගත කරන ලදී.

**(ඇ)** මණ්ඩලය මගින් පැවැත්වූ විනය පරීක්ෂණ වාර්තාවට අනුව අදාල හිඟ වැටුප ගෙවූ 2013 වර්ෂයට අදාලව මෙම ගෙවීම් ගිණුම්ගත කරන ලදී.

**(ඈ)** අවසන් ගිණුම් පෙබරවාරි මස 28 වන දින වන විට පිළියෙල කළ යුතු බැවින් ගිණුම් අවසන් කරන අවස්ථාවේ දී වාර්තා වූ සියළුම උපචිත වියදම් ගිණුම්ගත කරන ලදී. පසුව වාර්තා වන වියදම් 2013 වර්ෂය වෙනුවෙන් ගිණුම්ගත කිරීමට අපේක්ෂිතය.

**(ඉ)** දිස්ත්‍රික් කාර්යාල කිහිපයක ගෙවල් කුලී එකවර මාස කිහිපයක් සඳහා ගෙවීම් කර ඇති අතර එය ගෙවීම් කරන අවස්ථාවේදී වියදමක් ලෙස ගිණුම් ගත කර ඇත. ඉදිරියේදී ගෙවල් කුලී හා වරිපනම් ඉදිරි වර්ෂයේ මාස කිහිපයක් සඳහා ගෙවීම් කර ඇත්නම් එය ඉදිරියට කල ගෙවීමක් ලෙස පෙන්වීමට කටයුතු කරනු ලැබේ.

### 2.2.4 <u>පැහැදිලි නොකල වෙනස්කම්</u>

**(අ)** අවසාන ගිණුම් මගින් පෙන්වා ඇති ආදායම නිවැරදි වන අතර ගිණුම් පිළියෙල කිරීමේදී ගැලපුම් සිදු කරන බැවින් සහ බ්‍රවුන්ස් ආයතනය මගින් ඍජුවම ආදායම් ලැබෙන බැවින් මෙහෙයුම් අංශයේ හා අවසන් ගිණුම් මගින් දක්වා ඇති රක්ෂණ ආදායම සංසන්දනය කිරීම සිදු කළ නොහැක.

**(ආ)** අවසාන ගිණුම් පිළියෙල කිරීමේ දී රක්ෂණ වන්දි සඳහා වෙන් කිරීම් සිදු කරන බැවින් රක්ෂණ අංශයේ වන්දි සමඟ සංසන්දනය කළ නොහැක.

### 2.2.5 <u>ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්</u>

**(අ)** සේවක ණය අත්තිකාරම් ශේෂයන් වශයෙන් දැක්වෙන රු.2254178/-ක මුදලින් පහත සඳහන් අයිතම වලින් දැක්වෙන අය නොවන ණය හා අත්තිකාරම් සම්බන්ධයෙන් අදාළ ණයකරුවන් සඳහා එන්තරවාසි හා ලිපි මගින් දැනුම්දීම් කර ඇති නමුදු ණය හා අත්තිකාරම් ගෙවීමට මේ දක්වා පියවර ගෙන නැත. ඒ නිසා පහත සඳහන් ණය ශේෂ සඳහා ඇපකරුවන් සිටින ණය සඳහා ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමට අපේක්ෂිතය. අනෙත් ණයකරුවන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ පරිදි නඩු පැවරීමට කටයුතු කරනු ලැබේ.

| | | <u>මුදල (රු.)</u> |
|---|---|---|
| a. | ආපදා ණය | 12,38190.00 |
| b. | උත්සව අත්තිකාරම් | 55300.00 |
| c. | විශේෂ අත්තිකාරම් | 17050.00 |
| d. | යතුරුපැදි ණය | 34,1572.00 |
| e. | විශේෂ සේවක ණය | 4800.00 |

**(ආ)** මියගිය සේවකයින්ගෙන් මණ්ඩලයට අයවිය යුතු ණය හා අත්තිකාරම් පාරිතෝෂිකයෙන් අයකර ගෙන අදාළ පියවීම් සිදු කිරීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලයෙන් 2012.12.28 දිනැතිව අනුමැතිය ඉල්ලා ඇත. සවිස්තර තොරතුරු දන්වා මේ සම්බන්ධව නැවත 2013.07.01 දින පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලද පසු ගෙවීම් පියවීමට කටයුතු කරනු ලැබේ.

**(ඇ)** [illegible] ආයතනයෙන් අයවීමට ඇති රු.145,008/-ක මුදල අයකර ගැනීම පිණිස එම ආයතනයට දැන්වීම් කර ඊට අදාළ පියවර ගනිමින් පවතී.

(ඈ) මෙම ශේෂය අවුරුදු 20 කටත් වඩා පැරණි බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා කෘෂි රක්ෂණ අරමුදලෙන් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය වෙත ලබාදුන් මෙම ණය මුදල ඉදිරියේදී සිදු කිරීමට නියමිත ප්‍රතිව්‍යුහගතකරණ වැඩපිළිවෙල යටතේ සලකා බැලීමට නියමිතය.

(ඊ) බාහිර ආයතන වෙත නිදහස්කර වැටුප් ප්‍රතිපූර්ණය නොවූ සේවකයින් මේ වන විට එම ආයතන වල සේවය නොකරන අතර මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කර තීරණයක් ගැනීමට කටයුතු කරනු ලැබේ.

## 2.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

(අ) මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදල් ගණනය කිරීම සඳහා යොදාගනු ලබන්නේ මූලික වැටුප, ගොවි විශ්‍රාම වැටුප් දීමනාව සහ වැඩ බැලීමේ දීමනාව වේ. විවිධ අවස්ථාවන් හීදී අයවැය යෝජනා මඟින් ලබා දුන් ජීවන වියදම් දීමනාව හා 15% විශේෂ දීමනාව මෙම ගණනය කිරීම් සඳහා යොදා ගෙන නොමැත. කම්කරු කොමසාරිස් තුමාගෙන් ලබාගත් උපදෙස් අනුව 2013 මැයි මස සිට මෙම දීමනාවට ද ETF ගණනය කිරීමට කටයුතු කරන ලදී.

(ආ) සේවා නියුක්තීන්ගේ භාර අරමුදල සඳහා දායකත්වය සැපයීමේ දී සලකනු ලබන්නේ මූලික වැටුප, ගොවි විශ්‍රාම වැටුප් දීමනාව හා වැඩ බැලීමේ දීමනාව වේ. මේ සඳහා ද විවිධ අවස්ථාවන්හීදී අයවැය යෝජනා මඟින් ලබා දුන් ජීවන වියදම් දීමනාව හා 15% විශේෂ දීමනාව ගණනය කිරීම් සඳහා යොදා ගෙන නොමැත. කම්කරු කොමසාරිස් තුමාගෙන් ලබාගත් උපදෙස් අනුව 2013 මැයි මස සිට මෙම දීමනාවට ද ETF ගණනය කිරීමට කටයුතු කරන ලදී.

(ඇ) උපයනවිට බදු ගෙවීම ගණනය කිරීමේදී ධීවර විශ්රාම වැටුප් දීමනාව අදාල කර ගෙන නොමැති වූවද ආදායම් බදු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අදාල සේවකයාට ඉදිරිපත් කරනු ලබන 10 වාර්තාවේ එම දීමනාව හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත. ඉදිරි වර්ෂයේ දී එම දීමනාවද දළ වැටුපට එකතු කොට උපයන විට බදු ගෙවීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) හානි ලේඛනය යාවත්කාලීන කිරීමට උපදෙස් ලබා දෙන ලදී.

## 2.2.7 ආර්ථිකමය නොවන ගනුදෙනු

(අ) 2011 පෙබරවාරි මාසය සඳහා වූ ජල බිල්පත් ගාස්තුව මාර්තු මසට අදාළ බිල්පත පමණක් ගෙවීම මත ප්‍රමාද දෝෂයකින් මඟ හැරී ඇත. මේ නිසා යළි සම්බන්ධ කිරීමේ ගාස්තුව ලෙස රු.6720/-ක මුදලක් ගෙවීමට සිදු විය. මෙවැනි තත්ත්වයක් ඉදිරියේදී ඇති නොවීමට වග බලා ගනිමි.

(ආ) ප්‍රධාන කාර්යාලය ගංගොඩවිල පිහිටි ගොඩනැගිල්ලට රැගෙන ඒමත් සමඟ, දුම්රියෙන් සේවයට පැමිණි ගම්පහ සහ යාබද ප්‍රදේශවල සේවකයින්ට නියමිත වේලාවට සේවයට පැමිණීමේ අපහසුව සහ නිවෙස්බලා යාමේ අපහසුව සලකා අධ්‍යක්ෂ මණ්ඩලයට කරුණු සැලකර ප්‍රවාහන සේවා

සපයන ලදී. මෙම ප්‍රවාහන සේවාව මරදාන දුම්රිය ස්ථානයේ සිට ක්‍රියාත්මක වූ අතර, දුම්රිය ප්‍රමාදයන් නිසා සේවකයින්ට මෙම ප්‍රවාහන සේවාව සැපයුවද බොහෝවිට නියමිත වේලාවට සේවයට පැමිණීමේ අපහසුතා එසේම පැවතුනි.

කෙසේ වුවද අදාළ ප්‍රවාහන ගිවිසුම හය මසක කාලයක් සඳහා අත්සන් කර තිබූ බැවින්, 2012.12.31 දක්වා එසේම ක්‍රියාත්මක කිරීමට සිදු විය. අනතුරුව 2012.12.31 සිට ප්‍රවාහන සේවය නතර කරන ලදී. මේ වෙනුවට අදාළ සේවකයින් සඳහා පැමිණීම හා පිටවීම වෙනුවෙන් සහන කාලයක් ලබාදීමට පියවර ගන්නා ලදී.

ගම්පහ ප්‍රදේශයේ සිට පැමිණෙන සේවකයින්ට අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණය අනුව ප්‍රවාහන පහසුකම් සලසා නොදීම පිළිබඳව මීට පෙර මණ්ඩලීය සේවකයින්ගේ දුක් ගැනවිලි හා විවිධ විමසුම් වලින් පෙන්වා දී තිබූ කරුණු සලකා සේවකයින්ට ලබා දුන් සහනයක් මිස මෙය අනාර්ථික ගනුදෙනුවක් නොවන බැව් පෙන්වා දෙනු කැමැත්තෙමි.

**(ඇ)** ඔබ විසින් ඉදිරිපත් කර ඇති පරිදි මෙය නිශ්කාර්ය වියදමක් ලෙස සැලකුව ද එය නිශ්ඵල වියදම් ගණනයට නොගැනේ.

මේ සම්බන්ධයෙන් 2013/01/16 වන දින ඔබගේ අංක □□/□/□□□□/2012/□□/05 දරණ අංකයෙන් විමසන ලද විගණන විමසුමට 2013/01/28 වන දින ලබා දුන් දීර්ඝ හා සවිස්තරාත්මක පිළිතුරු අනුව මෙම ව්‍යාපෘතිය හා ඉන් ලබා ගැනීමට උත්සහ කළ දේ පිළිබඳව ද එහි වැදගත්කමද පෙන්වා දී ඇත.

රජයේ ප්‍රතිපත්ති අනුව කෘෂි රක්ෂණය ඉදිරියට පුළුල් ලෙස ක්‍රියාත්මක කිරීමට වෙනත් ආයතනයකට පැවරීම පිළිබඳව සාකච්ඡා පවත්වා ඇති බැවින් , අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කරමින් ඉදිරි කටයුතු සිදු කිරීමට මණ්ඩලය තවදුරටත් උත්සාහ නොකරනු ඇත.

කෙසේ වුවද පර්යේෂණාත්මක ව්‍යාපෘතියෙන් ලැබුණු ප්‍රතිඵල ඵලදායි ලෙස ඉදිරියේදී යොදා ගැනීමට නොහැකි වන්නේ නම්, ඉදිරියේදී කෘෂිකාර්මික රක්ෂණය ක්‍රියාත්මක කරනු ලබන ආයතනය වෙත ලබා දීම තුලින් හා එය රක්ෂණ මෙහෙයුම් ක්‍රියාවලියට උපයෝගී කර ගැනීම තුලින් මෙය නිෂ්ඵල වියදමක් නොවන බව පැහැදිලි වනු ඇත.

## 3. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

### 3.2 <u>මූල්‍ය තත්වය පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනය</u>

### 3.3 <u>මතභේදයට තුඩු දෙන කරුණු</u>

**(අ)** බැංකු මඟින් නිකුත් කරනු ලබන කෘෂිකාර්මික ණය ආවරණය කිරීමේදී ණය නිකුත් කරන අවස්ථාවේදීම රක්ෂණයට අදාල වාර මුදල් ණය මුදලින් අඩු කර ඒ සඳහා අදාල රිසිට්පත බැංකුවේදීම නිකුත් කෙරේ.

ණය දීමට සුදුසු හා වගා කරනු ලබන අය සඳහා වගා ණය නිකුත් කරන බැවින් රක්ෂණයට අදාල යෝජනා පත්‍රය ඒ අවස්ථාවේදීම හෝ ඊට ආසන්න දිනයකදී මණ්ඩලය මඟින් සම්පූර්ණ කර ගන්නා අවස්ථා තිබේ. මෙය පාර්ෂව 3ක් එකතුව සිදු කරන කාර්යයක් බැවින් මෙවැනි අඩුපාඩු සිදුවේ. මෙවැනි අඩුපාඩු සම්පූර්ණයෙන්ම නැතිකර රක්ෂණ කටයුතු සිදුකළ නොහැකි බැවින් අවම කර ගැනීමට උපරිම උත්සහ කරනු ලැබේ. මේ පිළිබඳව වරින් වර දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇත.

සිදුව ඇති හානිය සත්‍ය නම් හා හානි වූ ගොවීන් නිවැරදි ලෙස තහවුරු වූයේ නම් එය (දි.ස.අ) නිර්දේශ කර ඇත්නම් වන්දි නිදහස් කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමි.

කෘෂි රක්ෂණ කටයුතු සිදු කිරීම ඉතා සංකීර්ණ ක්‍රියාදාමයක් බැවින් මෙවැනි අඩුපාඩුකම් තුළ වුවද හානියේ සත්‍යතාවය තහවුරු කරගෙන ගොවීන් නිවැරදි ලෙස හඳුනා ගෙන වන්දි ගෙවීමට සිදුව ඇති බව ද කාරුණිකව සටහන් කරමි.

**(ආ)** මේ වන විට අය කර ගැනීමට ඉතිරිව ඇති මුදල රු.125,040.00 කි.මෙවර මහ කන්නයේ වන්දි මුදල් නිදහස් කිරීමේදී ද හිඟ මුදල් ආපසු අය කර ගැනීමට ඇති ගොවීන්ගෙන් එම මුදල් අඩු කර මණ්ඩලයට ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ජංගම වන්දි ගණනය කරන ලද ස්ථානයේදීම දිස්ත්‍රික් සහකාර දැනුවත් කරන ලදී.

## 4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 4.1 <u>කාර්යසාධනය</u>
### <u>රක්ෂණ යෝජනා ක්‍රම පරිපාලනය</u>

**(අ), (ආ), (ඇ)**

2012 වසරේ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අරමුදල ක්ෂවීම නිසා ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකයින් සඳහා විශ්‍රාම වැටුප් ලබමින් සිටි සහ අලුතින් විශ්‍රාම වැටුප් ලබා ගැනිමට සුදුසුකම් ලත් සියලුම දයකයින් වෙත ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම නතර වුනි. රජයේ අරමුදල් ලබා දෙන තුරු මෙම දායකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම නතර වී ඇත. ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සියලුම ගොවි ජනතාවගේ සිත්ගත් ආකර්ශනියම සහ ගොවි ජනතාව වෙත සෘජුවම ප්‍රතිලාභ අත්කර දුන් යෝජනා ක්‍රමයක් වු බැවින් මෙම යෝජනා ක්‍රමයෙන් ලබා දුන් ප්‍රතිලාභ නතර වීම නිසා ගොවි ජනතාව මණ්ඩලය කෙරෙහි තබා තිබූ විශ්වාසය පලුදුවිය. මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන සියලුම යෝජනා ක්‍රම ගොවි ජනතාව වෙනුවෙන් සැලසුම්කර ක්‍රියාවට නංවන යෝජනා ක්‍රම බැවින් ඉහත ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම නතර විම නිසා අනෙකුත් යෝජනා ක්‍රම ගොවිජනතාව වෙත ප්‍රචලිත කර දායක කරවා ගැනීමද අපහසුවිනි. ගොවි විශ්‍රාම වැටුප් ගොවින් වෙත ලබා දෙන තුරු අනිකුත් යෝජනා ක්‍රමයන්හි දායකත්වය ලබා ගැනීම ගොවින් විසින් ප්‍රතික්ෂේප කරන ලදී. ඒ අනුව මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන සියලුම යෝජනා ක්‍රමයන්හි මුල්‍ය හා භෞතික යන දෙඅංශයෙන්ම ප්‍රගතිය 2011 වසරට වඩා විශාල වශයෙන් අඩුවිය.

අප ආයතනයේ සීමිත නිලධාරීන් පිරිසක් සිටින ආයතනයක් බැවින් යෝජනා ක්‍රම ක්ෂේත්‍ර මට්ටමින් ක්‍රියාත්මක කිරීමේදී කෘෂිකාර්මාන්තය හා සම්බන්ධව කටයුතු කරන අනිකුත් සහෝදර ආයතනයන්හි සහයෝගය උපරිම වශයෙන් ලබා ගෙන ක්‍රියාත්මක වේ. ඒ අනුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් මහ ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව හා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව , සමෘද්ධි අධිකාරිය සහ මහවැලි අධිකාරිය වැනි රජයේ දෙපාර්තමේන්තු , මණ්ඩලය සහ අධිකාරිය වැනි ආයතන වල සහ ප්‍රාදේශීය කාර්යලවල සහයෝගය නොමදව ලබා ගනිමින් අදාල සැලසුම් ක්‍රියාත්මක කරමින් නියමිත ඉලක්ක කරා ළඟාවීම සිදු කරන ලදී. විශේෂයෙන් එම ආයතන වල අදාල ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල වල සහයෝගය උපරිම වශයෙන් ලබා ගන්නා ලදී.

විශේෂයෙන් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වරුන් , ග්‍රාම නිලධාරීන්, කෘෂිකර්ම උපදේශකවරුන්, එකක කළමණාකරුවන්, පශු වෛද්‍ය නිලධාරීන් සහ සත්ව සංවර්ධන උපදේශකවරුන් වැනි ක්ෂේත්‍ර කටයුතු සඳහා ගොවිජනතාව කිට්ටුවෙන්ම සේවා ලබා දෙන නිලධාරීන්ගේ සහාය මේ සඳහා නොඅඩුව ලැබුනි. ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රචලිත කිරීමේදි මොවුන්ගේ සහාය නොවඩුව ලැබුනු අතර , ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම නතර වීම නිසා ඇතිවූ අර්බුදයට මුහුණදීමට ඔවුන්ටද සිදුවිය. ඒ අනුව මණ්ඩලයට එතෙක් ඔවුන් ලබා දුන් සහාය නතර කළ අතර, ඒ අනුව ක්ෂේත්‍ර කටයුතු මෙහෙයවීම අප ආයතනයටද මහත් ගැටළුවක් විය. නිලධාරීන්ගේ මෙම අප්‍රසාදය ක්‍රමයෙන් දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව දක්වා ව්‍යාප්තව ගිය අතර, දිස්ත්‍රික් මට්ටමේ සහාය ලබා දීම පවා නතර කර දැමුනි. මේ පිළිබඳව කොළඹ දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදි සාකච්ඡා කර ලබාගත් තීරණ දැක්වෙන කොළඹ දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු වාර්ථාව සහ කොළඹ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ වරයාගේ ලිපිය ඇමුණුම් අංක 01 වශයෙන් ඉදිරිපත් කරමි. එහි ගොවි විශ්‍රාම වැටුප් ගැටළුව විසදනතුරු කිසිම යෝජනා ක්‍රමයක් ව්‍යාප්ත කිරීමට සහයෝගය නොදෙන බව ප්‍රකාශ කර ඇත. මෙම තත්වය මුලු දිවයින පුරාම බල පැවැත්වූ අතර, මණ්ඩලීය ආදායම් තත්වය 2011 වසරට වඩා සීග්‍ර වශයෙන් පසු බැමකට ලක්වුනි. මේ අනුව භෞතික හා මුල්‍ය යන අංශ දෙකේම පසුබැමක් දක්වා ඇති අතර , ඒ ඒ දිස්ත්‍රික්කවල භෞතික පරිසරය අනුව අඩු වැඩි වශයෙන් අදාල ප්‍රගතීන් ළඟා කරගෙන ඇත.

මීට අමතරව බැංකු මඟින් වගා ණය ලබා දීමේ ප්‍රමාණය අඩුවීමද වගා රක්ෂණ ප්‍රගතිය අඩුවීම කෙරේ සෘජුවම බලපාන ලදී. 2010/2011 මහ ගංවතුර සහ 2011/2012 මහ නියඟය වැනි හේතුමත ගොවීන්ගේ අස්වනු විනාශවී ගිය අතර, ගොවි මහතුන් ලබාගත් ණය ආපසු ගෙවීමේ ප්‍රතිශතය ඒ අනුව පහල මට්ටමක පැවතුනි. ඒ අනුව බැංකු මඟින් ලබාදුන් වගා ණය ප්‍රමාණයද අඩුවූ අතර, වගාණය පදනම්ව ක්‍රියාත්මක රක්ෂණ ප්‍රගතියද ඒ අනුව අඩුවිය. අනිකුත් වගාවන් වන මිරිස් වගා සඳහාද ණය දීම සීමාවීම නිසා අදාල ඉලක්ක ළඟාකර ගත නොහැකි විය.

අපනයන භෝග දෙපාර්තමේන්තුව විසින් සහනාධාර වැඩසටහන් යටතේ ක්‍රියාත්මක වගාවන් රක්ෂණය කිරීම අරමුණුකොට අපනයන බහුවාර්ෂික භෝග රක්ෂණ ක්‍රියාත්මකවූ අතර ,එම සහනාධාර යෝජනා ක්‍රම අඩුමට්ටමක පැවතීමද එම රක්ෂණ කටයුතු ව්‍යාප්තිය සඳහා බාධාවක්ව පැවතුනි.

තරඟකාරී රක්ෂණ ආයතනයක්ද මෙම රක්ෂණ කටයුතු සඳහා පිවිසුන අතර, විශේෂයෙන් සණස වැනි ආයතන පශු සම්පත් රක්ෂණය කෙරේ අප ආයතනයට වඩා සහනදායි ක්‍රමවේදයක් සහ වාරමුදල් මත පිවිසි සිටීම නිසා පශු රක්ෂණ ක්‍රමයේද අදාල ප්‍රගතිය ලබා ගැනිමට නොහැකි විය.

පශු රක්‍ෂණ යෝජනා ක්‍රමය යටතේ ගව රක්‍ෂණ යෝජනා ක්‍රමය සඳහා සණස මඟින් ක්‍රියාත්මක වාරමුදල් ප්‍රතිශත අප ආයතනය මඟින් ක්රියාත්මක කරන වාරමුදල් ප්‍රතිශතවලට වඩා අඩු ආකර්ශනිය ප්‍රතිශතයක් විය. මණ්ඩලය මුහුණපා ඇති ආර්ථික දුෂ්කරතා මත ආයතනය මඟින් ක්‍රියාත්මක කරන වාරමුදල් ප්‍රතිශතය අඩුකිරීමේ හැකියාවක් නොවුන අතර, සණස මඟින් ගව රක්‍ෂණය සඳහා අයකරන වාරමුදල් ප්‍රතිශතය රක්ෂිත වටිනාකමින් 3%ක් පමණි. එය සියලු බදු ඇතුලත්ව 3.56% සිට 4.6%ක අගයක් අය කරගෙන ඇත.

මෙම වාරික මුදල් ප්‍රතිශත මණ්ඩලය මඟින් අයකරන වාරික ප්‍රතිශතවලට වඩා අඩු අගයක් ගත් අතර , එතරම් අඩු වාරික මට්ටමක් පවත්වා ගැනිම මණ්ඩලයට මහත් අසීරු කරුණක් විය. ඒ අනුව රජය ආයතනවල රක්ෂිත සතුන්ගෙන් විශාල ප්‍රමාණයක් ස.ණ.ස ආයතනය වෙත කැඩී ගිය අතර, ප්‍රගතියේ විශාල පසුබෑමක්ද ඇති විය. ඒඅනුව මණ්ඩලයේ වාරික මුදල් සම්බන්ධවද යම් සංශෝධනයක් කිරීමට මෙම වසරේදී මණ්ඩලයට සිදුවිය. මෙම වාරමුදල් සංශෝධනයන් සණස ආයතනය මඟින් ඉදිරිපත් කර ඇති වාරමුදල් සමඟ තරඟකාරිව කටයුතු කිරීමට තරම් ප්‍රමාණවත් නොවන අතර, මණ්ඩලය වර්ථමානයේ මුහුණ දී ඇති මුල්‍ය අර්බුදය මත එම මට්ටම මීට වඩා අඩු මට්ටමකට ගෙන ඒමේ හැකියාවක්ද මණ්ඩලයට නොමැත.

ඒසේම එළුවන් රක්‍ෂණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනුයේ රාජ්‍ය ආධාර මත ලබාදෙන එළු ව්‍යාපෘතිවල එළුවන් රක්‍ෂණය කිරීමේ පදනම මත පමණි. ඒ අනුව රජය මඟින් එළුවන් බෙදා දී ක්‍රියාත්මක කරන ව්‍යාපෘතින්හි අඩුවැඩිවීම මත එහි ඉලක්ක ළඟාකර ගැනිමේ ප්‍රතිශතය අඩුවැඩි වේ. ඒ අනුව රජයේ එළු ව්‍යාපෘති විශාල වශයෙන් ක්‍රියාත්මක නොවිම නිසා මෙම රක්‍ෂණයේ ප්‍රගතියද සීමා වී ඇත. ඒසේම මෙම රක්‍ෂණ කටයුතු වලදී සහභාගිවන අනිකුත් නිලධාරින් වෙත ලබා දෙන කොමිස් දීමනාද අප ආයතනයට වඩා ආකර්ශනිය අන්දමින් පෞද්ගලික ආයතන පවත්වා ගෙන යාමද මෙම රක්‍ෂණ ඉලක්ක ළඟා කර ගැනීමේදි ගැටළුවක්ව පවති. කෙසේ වුවත් එළු සහ ගව රක්‍ෂණය සමස්ථයක් වශයෙන් ගත් කළ අදාල ඉලක්ක ඉක්මවායාමට අනුරාධපුර හා වව්නියාව යන දිස්ත්‍රික්ක දෙක සමත් වී ඇති අතර ගම්පහ, මන්නාරම, මඩකලපුව, කුරුණෑගල සහ මනම්පිටිය යන දිස්ත්‍රික්ක 90%ට වඩා වැඩි ප්‍රගතියක් ළගා කර ගෙන ඇත. යාපනය දිස්ත්‍රික්කය 80%ඉක්මවාද, මොණරාගල දිස්ත්‍රික්කයේ 65% ඉක්මවාව ද, බදුල්ල දිස්ත්‍රික්කයේ 57%ක් ඉක්මවාද ත්‍රිකුණාමලය 46% ඉක්මවාද කෑගල්ල 42%ක් ඉක්මවාද ප්‍රගතියක් ලබාගෙන ඇත. 30% ඉක්මවූ ප්‍රගතියක් නුවරඑළිය, රත්නපුර හා පුත්තලම යන දිස්ත්‍රික්ක සහ 20% ඉක්මවූ ප්‍රගතියක් මාතලේ, ගාල්ල, මහනුවර දිස්ත්‍රිකය ළඟාකරගෙන ඇත. 19% ඉක්මවූ ප්‍රගතියක් අම්පාර සහ කොළඹ දිස්ත්‍රික්වල ලබා ගෙන ඇත. ගම්බන්තොට දිස්ත්‍රික්කයේ එය 15.39%කි. 10% ඉක්මවූ ප්‍රගතියක් පොලොන්නරුව සහ උඩවලව ලබා ඇති අතර 10% අඩුවෙන් ප්‍රගතියක් දැක්වෙනුවේ කළුතර සහ මාතර දිස්ත්‍රික්ක පමණි.

කෘෂි උපකරණ රක්‍ෂණය, ජීවිත රක්‍ෂණය සහ සුවසෙත වැනි රක්‍ෂණ යෝජනා ක්‍රම ගොවිමහතුන් ස්වකැමැත්ත මත පොළඹවා ගත යුතු වන අතර, ගොවි විශ්‍රාම වැටුප් නොගෙවීම ඔවුන් එම රක්‍ෂණ ක්‍රම කෙරේ නැඹුරුකර ගැනීමේදී මහත් බාධාවක් විය. ගොවි විශ්‍රාම වැටුප් නැවත ගෙවන තුරු වෙනත් කිසිම යෝජනා ක්‍රමයට දායක වීම ගොවින් විසින් ප්රතික්ෂේප කිරීමට කටයුතු කරන ලදී.

වී වගා රක්‍ෂණය ආශ්‍රිත කරගෙන රජය වී මිලදී ගැනිම සිදුකර ඒවා ගබඩා කිරිම් සිදු කිරිමේදි රජ්‍ය ආයතනයක් වශයෙන් ඒවා රක්‍ෂණය කිරීම අරමුණු කරගෙන ගබඩා රක්‍ෂණය ක්‍රියාත්මක කළද ඒ වන විට රජයේ වී ගබඩා ශ්‍රිලංකා රක්‍ෂණ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය මඟින් රක්‍ෂණය කිරීමට වී අලෙවි මණ්ඩලය මඟින් කටයුතු කර තිබීම නිසා එම ඉලක්කයන් සපුරා ගැනීමට අදාල දිස්ත්‍රික්කයන්ට හැකියාවක් නොමැති විය. ඒ අනුව සුළු වශයෙන් වී වගාව සිදුකරන ගම්පහ වැනි

දිස්ත්‍රික්ක වලින් පමණක් නොව විශාල වශයෙන් වී වගාව සිදුකරන අම්පාර වැනි දිස්ත්‍රික්ක වලින්ද කිසිම ප්‍රගතියක් ලබා ගත නොහැකි විය.

**(ඈ)** ඉහතින් සඳහන් කරන ලද සියලු කරුණු මල්, පොල්,උක්වගා රක්ෂණය කෙරේද බලපාන ලදී. ඊට අමතරව මෙම වගාවන්හි කිසිම ප්‍රගතියක් ලබා ගැනිම ට නොහැකිවිම සඳහා පහත සඳහන් කරුණු බලපා ඇත. දිවයිනේ මහ පරිමාණයෙන් ක්‍රියාත්මක කරන මල්වගා ව්‍යාපෘති එතරම් ප්‍රමාණයක් නොමැතිවීම නිසා මල්වගා රක්ෂණය ක්‍රියාත්මක කිරීම බාධාවක් වී ඇත. ඒසේම ගෙවතු ආශ්‍රිතව කෙරේන සුලු වගාවන්හිදී මැරීයන පැල සංඛ්‍යාව එතරම් විශාල නොවන බැවින් මල්වගාකරුවන් රක්ෂණය කිරීමට නොපෙළඹේ. එවැනි සුලු වගාවන් සඳහා ණය ලබාදීමක්ද නොකෙරෙන බැවින් අදාල ඉලක්කයන් කිසිසේත් රක්ෂණය කිරීමට නොහැකි විය.

පොල් වගා රක්ෂණය යෝජනා ක්‍රමය පොල් සංවර්ධන ආමාත්‍යාංශය හා පොල් වගා කිරීමේ මණ්ඩලයේ ඉල්ලීම මත පොල් ත්‍රිකෝණයට අයත් කුරුණෑගල, පුත්තලම, ගම්පහ, කැගල්ල අයත් බල ප්‍රදේශයන්හි ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව පොල් වගා කිරීමේ මණ්ඩලයේ පොල් නැවත වගා කිරීමේ ආධාර ක්‍රමය යටතේ වගා කිරීම සඳහා තොරගනු ලැබූ ගොවින්හට රක්ෂණ ආවරණය ලබා දීම සිදු කළ අතර, පොල් පැල සිටුවීමේ සිට වර්ෂ 4ක්වූ කාලසීමාවට පමණක් රක්ෂණය කිරීම සිදුකරන ලදී. මෙවැනි විශේෂ ව්‍යාපෘතින් ක්‍රියාත්මක වීම සීමා වී ඇති බැවින් මෙම රක්ෂණ ඉලක්ක සපුරාගැනිමට කටයුතු කළ නොහැකිවිය. මේ යටතේ වෙනත් පොල් වගාවන් රක්ෂණයට භාජනය නොවේ. එම ආයතනය විසින් ලබා දෙන සහනාධාර අඩුවැඩිවිම මත මෙම රක්ෂණ යෝජනා ක්‍රමයේ ප්‍රගතිය රඳපවතී. එම සහනාධාර අඩුවීම මත මෙම රක්ෂණයේ ප්‍රගතිය ලබා ගැනීමට නොහැකි විය.

උක්වගාව රක්ෂණය කිරීම හිගුරාන සහ පැලවත්ත උක්ව්‍යාපාරය සම්බන්ධකර ගෙන සැසසුම් ක්‍රියාත්මක විය. හිගුරාන සමාගම සමඟ සාකච්ඡා කර වාරමුදල් සංශෝධනයක් සම්බන්ධව එම ආයතනයේ පාලක පක්ෂයෙන් ඉදිරිපත් කල යෝජනාව සලකා බැලීමේදි මණ්ඩලයේ වත්මන් තත්වය මත එවැනි සංශෝධනයක් කර වාරමුදල් අඩුකිරීමේ හැකියාවක් මණ්ඩලය සතු නොවිනි. මේ වනවිට උක්වගාව රක්ෂණය සම්බන්ධයෙන් තරඟකාරි ආයතනයක් ලෙස සණස සම්බන්ධවී ඔවුන් අප මණ්ඩලයට වඩා අඩු වාරමුදලක් යටතේ රක්ෂණය කිරීමට එකඟතාවය පල කර ඇත. හිගුරාණ උක් වගා රක්ෂණ කටයුතු සණස මඟින් සිදු කරන අතර , අප ආයතනයට එම අවස්ථාවද ගිලිහියන ලදී.

පැලවත්ත සමාගම සමඟ සාකච්ඡා කර රක්ෂණ කටයුතු සිදු කිරීමට තීරණය කර තිබුනද, එම ආයතනයේ තිබූ පරිපාලන ගැටළු මත එම සමාගම රජයට පවරාගන්නා ලදී. ඒ අනුව ඒ ආයතනයේ පැවති එම පරිපාලන ගැටළු හා වැටුප් ප්‍රශ්න පිළිබඳව මූලික අවධානය යොමු කරමින් කටයුතු කළ අතර, වගා රක්ෂණ කටයුතු පිළිබඳව අවධානය යොමුනොකරන ලදී. එඅනුව අප මණ්ඩලයට උක්වගා රක්ෂණය මඟින් බලාපොරොත්තු වු ඉලක්ක කරා යාමට නොහැකි විය.

## 4.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

හිටපු සහකාර අධ්‍යක්ෂ ආර්.පී.බන්දුමතී මිය විසින් කාර්මික අධිකරණයට ඉදිරිපත්කර තිබූ පැමිණිල්ල විභාග කර එහි බේරුම්කරු විසින් බේරුම්කරණ ප්‍රදානය වශයෙන් රු.225000/-ක මුදලක් ඇයට ගෙවන ලෙස රජයේ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශ කර තිබිණ. මීට විරුද්ධව මණ්ඩලය පළාත්බද සිවිල් අභියාචනාධිකරණයට රිට් අභියාචනා නඩුවක් ගොනුකර තිබූ අතර, ඊට අදාළ ලිපිගොනු නිසියාකාරව මණ්ඩලයේ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ(නීති) විසින් නඩුවට පෙනී සිටි නීතිඥ වෙත ලබාදී නොතිබීම යන හේතු මත නඩුව කැඳවා තිබූ 2012.05.02 දින නීතිඥවරයා නඩුවට පෙනී සිට නැත. නියෝජ්‍ය අධ්‍යක්ෂ(නිති) කේ.එම්.එල්.ඩියස් මහතා මෙම රාජකාරි භාරව

සිටි අතර, ඔහුගේ රාජකාරි අකාර්යක්ෂමතා සහ පත්වීමට අදාළ ලියකියවිලි ඉදිරිපත් නොකිරීම මත පත්වීම අවසන් කර තිබූ තත්ත්වය තුළ එම රාජකාරි නිසි අයුරු ක්‍රියාත්මක කිරීමට පවතින වාතාවරණය තුළ මණ්ඩලයට නොහැකි විය. මෙම තත්ත්වය තුළ අදාළ නඩු වාරයට නීතිඥවරයා හෝ මණ්ඩලීය නියෝජිතයෙකු පෙනී නොසිටීම මත නඩුව නිෂ්ප්‍රභාවී තිබිණ. මෙනිසා අදාළ බේරුම්කරණ ප්‍රදානය නොගෙවීමට එරෙහිව කම්කරු කොමසාරිස් විසින් නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා තිබීම මත බේරුම්කරණ ප්‍රදානය ලෙස රු.200,000/-ක මුදලක් මණ්ඩලය විසින් අදාළ සේවකයා වෙත ගෙවීම පිණිස අධිකරණයේ තැන්පත් කරන ලදී. පවතින වාතාවරණය තුළ මෙවැනි අතපසුවීමක් සිදුවීම නොවැළැක්විය හැකි කරුණක් විය. මේ නිසා මෙය හිතාමතා සිදුකළ ක්‍රියාවක් නොවන බව පෙන්වා දෙන අතර, දැනට අධිකරණ කටයුතු වලට අදාළ රාජකාරි නීතිපති දෙපාර්තමේන්තුවේ සහායෙන් පවත්වාගෙන යාමට කටයුතු කරන බැව් දන්වා සිටිමි.

## 4.3 භාවිතයට නොගන්නා වත්කම්

**(අ)** 31 - 4288, □□ 7355, □□ 7263, □□ 6983 අංක දරණ වාහන අලුත්වැඩියාව සඳහා මිල ගණන් කැඳවා ඇති අතර ඒ සම්බන්ධව දැනට ඉදිරි කටයුතු කරමින් පවතී. අලුත්වැඩියාවෙන් පසුව මෙම වාහන ධාවනය සඳහා යොදා ගැනීමට බලාපොරොත්තුවේ.

**(ආ)** මුද්‍රණ තොගය විනාශ කිරීම සඳහා ඉක්මනින් කටයුතු කරන අතර, ඉන් අනතුරුව අදාළ වත්කම් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

## 4.4 ප්‍රමාද ව්‍යාපෘති

මෙම ස්ථානය වගුරු සහිත ප්‍රදේශයක් බැවින් ඉදිකිරීම් ආරම්භ කිරීමට ප්‍රථම ජලය බස්සවා බිම සකස් කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් උපදෙස් ලැබුණු අතර, එම සංවර්ධන කටයුතු සඳහා රු.565800/-ක මුදලක් වැය කරන ලදී. නමුත් ඉදිරි වැඩ කරගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට නොහැකි වීම මත එම ව්‍යාපෘතිය අතරමග නතර කිරීමට සිදු විය. නමුත් ව්‍යාපෘතිය ආරම්භකර ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලෙස සෑම වර්ෂයකම අය-වැය ඇස්තමේන්තු වලට ඇතුළත් කරන ලෙස භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කර ඇත. පවතින වාතාවරණය තුළ මෙම ස්ථානයේ ගොඩනැගිල්ලක් ඉදි කිරීම සම්බන්ධව ප්‍රතිපාදන වෙන්කර ගැනීමේ ගැටළුවක් පවතින හෙයින් ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට ගෙවා ඇති මුදල සම්බන්ධව ඔවුන් සමඟ සාකච්ඡා කර ඉදිරි පියවර ගැනීමට කටයුතු කරමි.

(මෙම කරුණට අදාළ □□/□/□□□□/2011/03– 2011.08.01 විගණන විමසුම සඳහා අංක:3/6/2 හා 2011. 08.30 දාතමින් පිළිතුරු සපයා ඇත)

## 4.5 අයිතිය මණ්ඩලය සතු නොවන ඉඩම්වල ගොඩනැගිලි ඉදි කිරීම

**(අ) , (ආ)**

1986 වසරේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මඟින් ලබා ගත් ඉඩමක මණ්ඩලය විසින් ඇඹිලිපිටිය ප්‍රාදේශීය කාර්යාලය ඉදිකර ඇති අතර, එම වකවානුව තුළ අදාළ ඉඩම් සඳහා නීත්‍යානුකූල පැවරීම් කර නැත. මෙම ඉඩම් පසු කාලීනව රේඛීය අමාත්‍යාංශ වෙත පැවරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වී ඇත. එහෙත් මේ සඳහා මහවැලි අධිකාරිය මඟින් දැනුම් දීම් කර නොතිබිණි. දැනට

රාජ්‍ය ව්‍යාපාර (සංස්ථා, මණ්ඩල) සඳහා මහවැලි ඉඩම්වල අයිතිය සෘජුව පවරා දීමක් ක්‍රියාත්මක නොවේ.

තඹුත්තේගම කාර්යාල ගොඩනැගිල්ල හා ඉඩම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ එච් කලාපයට අයත් වන අතර, ඇඹිලිපිටිය කාර්යාලීය ඉඩම මෙන්ම මේ සඳහාද නීත්‍යානුකූල පැවරීම් කර නැත. මෙම ගොඩනැගිල්ල පසුකාලීනව මණ්ඩලය විසින් අලුත්වැඩියා කර ඇත. එවකට පැවති තත්ත්වය තුළ අනාගතයේදී මෙම ඉඩම් මණ්ඩලය වෙත පවරනු ඇතිය යන පදනම මත පිහිටා මණ්ඩලයේ ඉහළ කළමනාකාරීත්වය මෙම ඉඩම්වල ගොඩනැගිලි ඉදි කිරීමට කටයුතු කර ඇති බව පෙනේ.

2011 වර්ෂයේදී තඹුත්තේගම කාර්යාලය සඳහා හිඟ බදු මුදල් ගෙවන ලෙස නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් කරන ලද දැන්වීම අනුව අදාළ මුදල් ගෙවා ඇති අතර, 30 අවුරුදු බදු ගිවිසුම ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත.

ඇඹිලිපිටිය ඉඩම සඳහා 2012 වර්ෂය දක්වා බදු මුදල් ගෙවන ලෙස දැනුම් දීම් කර ඇත්තේ ප්‍රථම වතාවටය.

මෙය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් මෑතකදී ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණයකි.

අදාළ හිඟ මුදල් ගෙවීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කර අමාත්‍යාංශ ලේකම් වෙතද පිටපතක් යවා සහන ඉල්ලා ඇති නමුදු, එකී හිඟ මුදල් ගෙවන ලෙස දැනට දන්වා ඇත.

කෙසේ වුවද පවත්නා තත්ත්වය අනුව මෙම ඉඩම් මෙම ආයතනයට ස්ථිරව පවරා ගත නොහැකි අතර, දිගු කාලීන බදුකර යටතේ පවත්වා ගෙන යාමට සිදුවේ.

(මෙම කරුණට අදාළ □□/□/□□□□/2012/□□/10 – 2013.04.29 විගණන විමසුම සඳහා අංක:3/6/2 හා 2013.05.16 දාතමින් පිළිතුරු සපයා ඇත)

## 4.6 මානව සම්පත් කළමනාකරණය

2010.12.31 දින සිට 2012.12.31 දින දක්වා, පෙන්වාදී ඇති පුරප්පාඩු මණ්ඩලය දැනට මුහුණදී සිටින ප්‍රතිව්‍යුහගතකරණ වැඩපිළිවෙළ තුළ ස්ථිර පත්වීම් මඟින් පිරවීම තාවකාලිකව අත්හිටුවීමට අධ්‍යක්ෂ මණ්ඩලය උපදෙස් දී ඇති බැව් සඳහන් කරමි.

## 4.7 වාහන භාවිතය

| වාහනය | හේතුව |
|---|---|
| 31 - 4288 | කෘෂි සංවර්ධන අධිකාරියට අයත් බව සඳහන් වුවත් එම අධිකාරිය දැනට වසා දමා ඇති බැවින් පවරා ගැනීමේ කටයුතු සිදු කිරීමට නොහැක. |
| □□7355 | කෘෂිකර්ම අමාත්‍යාංශය මෙම වාහන වල මිල තක්සේරු කර එම මුදල් ගෙවා පවරා ගැනීම් සිදුකරන ලෙස දන්වා ඇත. ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදී නොමැති බැවින් පවරා ගැනීම් කටයුතු සිදුකිරීමට නොහැකි වී ඇත. |
| □□7263 | |
| □□6983 | |
| □□7563 | |
| □□6105 | |
| 32-5210 | එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂි කර්ම සංවිධානයට අයත් බැවින් පවරා ගැනීම් කටයුතු සිදුකර ගැනීමට නොහැකි වී ඇත. |
| 51-2423 | බහුවාර්ෂික භෝග ව්‍යාපෘතියට අයත් වන අතර මෙහි ලියාපදිංචි පොත අධිකරණ කටයුත්තක් සඳහා දීර්ඝ කාලයක් අධිකරණයේ රඳවාගෙන ඇති බැවින් පවරා ගැනීම් කටයුතු ඉටුකර ගැනීමට නොහැකි තත්වයේ ඇත. |
| □□7563, □□6105, 32-5210, 51-2423 වාහන වල ආදායම් බලපත්‍ර ලබා ගැනීම හා රක්‍ෂණ කටයුතු යාවත්කාලීනව සිදුකරගෙන යනු ලබයි. | |

## 5. වගවීම සහ යහ පාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2005-2010 වර්ෂ සඳහා සකසා තිබූ සංයුක්ත සැලැස්ම සමාලෝචනයට ලක් කොට මණ්ඩලයේ සියලුම විධායක නිලධාරීන්ගේ දායකත්වය ඇතිව 2008-2012 දක්වා නව සංයුක්ත සැලැස්මක් සකස් කල අතර එම සංයුක්ත සැලැස්මට අනුව මණ්ඩලයේ අයවැය ලේඛණය හා ක්‍රියාත්මක සැලැස්ම සෑම වර්ෂයකම සකස් කරනු ලැබේ. දැනට මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා මහා භාණ්ඩාගාරය සැලසුම් සකසමින් පවතින බැවින් ඉදිරියේදී එම යාවත්කාලීන කිරීමේ වැඩපිළිවෙළට අනුරූපීව සංයුක්ත සැලැස්ම ඉදිරි වර්ෂ සඳහා සැකසීමට අපේක්ෂා කෙරේ.

**5.2** මණ්ඩලයේ වාර්ෂික අය වැය ලේඛණයට අනුරූපීව ක්‍රියාත්මක සැලැස්ම සකස් කොට දිස්ත්‍රික් කාර්යාල සඳහා මෙහෙයුම් ඉලක්ක ලබා දීම සිදු කරන ලදී. අදාළ මෙහෙයුම් ඉලක්කයන් අධීක්ෂණයට ලක් කරමින් ක්‍රියාත්මක සැලැස්ම යහ පාලන උපකරණයක් ලෙස මණ්ඩලය භාවිතා කරන ලදී.

### 5.3 අයවැය ලේඛණමය පාලනය

අයවැය ලේඛණය මණ්ඩලයේ යහ පාලනය සඳහා යොදා ගැනීමට කටයුතු කර ඇත.

## 6. පද්ධති සහ පාලනය

රක්ෂණ යෝජනා ක්‍රම, වන්දි ගෙවීම, සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාත්මක සැලැස්ම, අය වැය ලේඛණය, සේවක ණය, නිතී රෙගුලාසි යන පද්ධතියන්හි මනා පාලනයක් ඇති කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට අපේක්ෂිතය.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

විදුලි පණිවිඩ / தந்தி / Telegrams } රක්ෂණ / ரக்ஷண / Rakshana

117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ
117, Subadrarama Rd., Gangodavila, Nugegoda

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No. } 2012/4/5/මු/ගො/2 ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No. } ........ දිනය / திகதி / Date } 2013.07.23

විගණන අධිකාරි,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

**2012 වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14 (2) (C) වාර්තාව සඳහා පිළිතුරු සැපයීම.**

2012 වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14 (2) (C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

..........................
අධ්‍යක්ෂ ජනරාල්
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

| | සභාපති / தலைவர் | අධ්‍යක්ෂ ජනරාල් | ප්‍රධාන කාර්යාලය / தலைமையகம் |
|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephones | 011-2812571 | 011-5732397 | 011-5384000 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 011-2812572 | 011-2812574 | |
| | 011-2812573 | | |

**<u>ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු.</u>**

**2. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**2.1 <u>මතය</u>**

**2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

**2.2.1 <u>යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම</u>**

අදාල විගණන නිරීක්ෂණය හා එකඟ වේ. ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ පස් ගුණයකින් වැඩිකර අයකරනු ලබන වාර මුදල එසේම පවත්වාගෙන යාම නිසා මෙම තත්වය උද්ගත වී ඇත. කෙසේ වුවද යෝජනා ක්‍රමයේ අරමුදල් 2010 අගෝස්තු මාසයේදී අවසන් වීමෙන් පසුව ද මණ්ඩලයේ ක්‍රියාත්මක අනිකුත් යෝජනා ක්‍රම වලින් අරමුදල් ලබා ගෙන ප්‍රතිලාභ ගෙවන ලදී. තවද දැනට ක්‍රියාත්මක වන යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට මහා භාණ්ඩාගාරය මඟින් සිදු කරමින් පවතී.

**2.2.2 <u>ගිණුම්කරණ ප්‍රමිති හා නොඑකඟතාවයන්</u>**

**(අ)** නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මුහුණත ඉදිරිපත් කිරීම් සිදු කරනු ලැබුව ද ප්‍රථම වරට ඉදිරිපත් කිරීමේදී සිදුකල යුතු □□□□□□□□□□□□□□□□□□ සහ □□□□□□□□□□□□□□ සිදු නොකරන ලදී. ඉදිරි ගිණුම් වර්ෂයේදී මණ්ඩලයේ වත්කම් හා වගකීම් නැවත වර්ගීකරණය (□□□□□□□□□□□□□□□□□□) සහ නැවත ගණනය (□□□□□□□□□□□□□□) කිරීමට අපේක්ෂිතය.

**(ආ)** ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සතුව දිගු කාලීන ආයෝජන කිසිවක් නොපවතින අතර සියළු ආයෝජනයන් කෙටිකාලීන වේ. එබැවින් එම ආයෝජනයන් වෙලඳපොල වටිනාකම හා පොත් වටිනාකම අතර වෙනසක් නොමැත.

**(ඇ)** ඉදිරියේදී අවශ්‍ය හෙලිදරව්ව කිරීමට අපේක්ෂිතය.

**(ඈ)** පාරිතෝෂික වගකීම ගණනය කිරීමේදී ජීවගණන තක්සේරුවක් සිදුනොකලද සත්‍ය වැටුප පදනම් කොටගෙන එම වගකීම ගණනය කර ඇත.මෙම වගකීම සඳහා වෙනම ආයෝජන පවත්වා ගෙන නොගියද මණ්ඩලයේ අනෙකුත් ආයෝජන තුල මෙම ආයෝජනයන් අන්තර්ගතව ඇත.

**(ඉ)** 2007 වර්ෂයේ ජීව ගණන වාර්තාව පදනම් කර ගනිමින් 2012 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් වගකීම ගණනය කර ඇත.

**2.2.3 <u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>**

**(අ)** අනුරාධපුර හා පොළොන්නරු දිස්ත්‍රික්ක සඳහා විශ්‍රාම වැටුප් දීමනාව ගෙවීමේදී භාණ්ඩාගාරයේ ඍජු මැදිහත්වීම මත ප්‍රතිපාදනයන් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබා දුන් බැවින් මණ්ඩලයේ වගකීමට ගැලපීම් සිදු නොකරන ලදී.

**(ආ)** විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වගකීම ගිණුම්ගත කිරීමේදී විශ්‍රාම වැටුප් ගෙවීම හා සම්බන්ද සෘජු වියදමක් වන විශ්‍රාම වැටුප් ගෙවීමේ කොමිස් වියදම ද සැලකිල්ලට ගන්නා ලදී.

### 2.2.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

**(අ)** ලැබිය යුතු ආදායම් ලෙස ශේෂ පත්‍රය තුල දක්වා ඇත්තේ 2012.12.31 දිනට මණ්ඩලය වෙත සමූපකාර සමිති හා ග්‍රාමීය බැංකු මගින් ලැබිය යුතු වටිනාකමයි. එම ආයතන 450 කට අධික සංඛ්‍යාවක් දිවයින පුරා පවතින අතර ආයතන 350 කට පමණ ශේෂ තහවුරු කිරීම් දන්වා එවන ලෙස මණ්ඩලය මගින් දැනුම් දී ඇති නමුත් එවැනි සමහර ආයතන වලින් ශේෂ තහවුරු කිරීම් ලිපි අප වෙත ලැබී නොමැත.

කෙසේ වුවද 45% කට වැඩි ප්‍රතිශතයක් ශේෂ තහවුරු කිරීම් එවා ඇති අතර එය පසුගිය වර්ෂයන් හා සැසඳීමේ දී ඉතා ඉහල අගයක් ගන්නා බව පෙන්වා දිය හැක.

**(ආ)** විගණන ගාස්තු සඳහා ඉදිරිපත් කරන ලද මුදල මණ්ඩලයේ වර්තමාන මූල්‍ය තත්වය සැලකිල්ලට ගෙන අඩු කරන ලෙස විගණකාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කර ඇත. ඉදිරියේදී විගණකාධිපතිවරයා ලබා දෙන තීරණයට අනුව විගණන ගාස්තු ගෙවීමට කටයුතු කරනු ලැබේ.

**(ඇ)** ගොවි විශ්‍රාම වැටුප් අර මුදල ශූන්‍ය වූ අවස්ථාවේදි එයට විසඳුම් සෙවීම සඳහා මහා භාණ්ඩාගාරයේ පැවති සාකච්ඡාවේදි මණ්ඩලයේ අනෙකුත් අරමුදල් මගින් ගොවි විශ්‍රාම වැටුප් ගෙවන ලෙස තිරණය කර ලබා දුන් උපදෙස් පරිදි ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් හා කෘෂි රක්ෂණ අරමුදලින් මෙම අරමුදල් ලබා ගෙන ඇත. මහා භාණ්ඩාගාරයේ මැදිහත්වීම මත ඉදිරියේදි සිදු කිරිමට අපේක්ෂිත ප්‍රතිව්‍යුහගතකරණ වැඩපිලිවෙල යටතේ මෙම අරමුදල් නැවත පියවීම පිළිබඳව සලකා බැලීමට අපේක්ෂිතය.

### 2.2.5 මතභේදයට තුඩු දෙන කරුණු

**(අ)** මාවිල් ආරු සිදුවීමෙන් හානි සිදු වූ ගොවීන්ට වන්දි ගෙවීමේදී සිදු වී ඇති මෙම ගැටලුකාරී සිදුවීම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී.

**(ආ)** මෙම වාර මුදල් වංචාවට සම්බන්ධ ක්ෂේත්‍ර නිළධාරි සුසිල් ප්‍රේමරත්න මහතා වැඩ තහනම්ව සිටි අතර ඔහුට විරුද්ධව □□/5/2009 අංක දරණ නඩුව අනුරාධපුර මහාධිකරණයේ විභාගයට ගැනේ.ඔහු රු.100,000/- ක මුදලක් පමණක් මණ්ඩලයට ගෙවා තිබියදි මියගොස් ඇත.මේ හේතුව නිසා ඔහුට විරුද්ධව තවදුරටත් නීතිමය වශයෙන් කටයුතු කල නොහැකි බැවින් අදාල නඩු වාර්ථා ලබාගෙන අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර තීරණයක් ගැනීමට කටයුතු කරන බව දන්වමි.

**2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පොළොන්නරුව දිස්ත්‍රික්කයට අදාල ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් ලේඛණය දිස්ත්‍රික් ලේකම්වරයා විසින් මේ වන විට මණ්ඩලයට ලබා දී ඇත.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

### 3.2 මූල්‍ය තත්වය පිළිබඳ විශ්‍රහාත්මක සමාලෝචනය

(අ) (i)විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රවර්ධනය නොකිරිම නිසා 2007 සිට 2012 දක්වා ආදායම අඩුවී ඇති අතර වයස අවුරුදු 60 සම්පූර්ණ වීම නිසා විශාල පිරිසක් විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලැබීම නිසාත් තවත් කොටසක් යෝජනා ක්‍රමයෙන් ඉවත් වීම නිසාත් වියදම ක්‍රමිකව වැඩිවී ඇත.

(ii)ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි හෙළිදරව් කිරීම් සිදු කරන ලද අතර ඒ අනුව විශ්‍රාම වැටුප් වගකීම මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා ඇත. වාර්ෂිකව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වගකීම වැඩි වීම නිසා ඌනතාවයද ක්‍රමිකව වැඩිවී ඇත.

(ආ) පවතින විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රවර්ධනය නොකිරීම නිසා වාර්ෂිකව ක්‍රමිකව වාරික ආදායම අඩු වී ඇති අතර යෝජනා ක්‍රමය වෙත බැදී ඇති දායකයින් විශ්‍රාම වැටුප් ලබා ගැනීමට සුදුසුකම් ලැබීම නිසා වාර්ෂික විශ්‍රාම වැටුප් ගෙවීමේ වියදම වැඩි වී ඇත.

(ඇ) ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා යෝජනා ක්‍රමය සතු වූ සංචිත අරමුදල් යොදා ගැනීමට සිදුවීම නිසා 2007 සිට යෝජනා ක්‍රමයේ ආයෝජන ක්‍රමිකව අඩු වී ඇත. 2010 දී සංචිත අරමුදල ශුන්‍ය බවට පත් වූ අතර එයින් පසුව වාරික ආදායම පමණක් කෙටි කාලීනව ආයෝජනය කරන ලදී. එයට සාපේක්ෂව ආයෝජන ආදායම ද පහල ගොස් ඇත.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ) 2010 අගෝස්තු මාසයේ සිට ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශුන්‍ය වීමෙන් පසු තව දුරටත් යෝජනා ක්‍රමයට දායක කිරිමෙන් යෝජනා ක්‍රමයේ වගකීම් ප්‍රමාණය වැඩිවීම තුල මූල්‍ය අර්බුදය තවදුරටත් වර්ධනය වන බැවින් 2010 අගෝස්තු මාසයේ සිට යෝජනා ක්‍රමයට ගොවීන් දායක කරවීම අත්හිටුවන ලදි.

ඒ අනුව මෙම යෝජනා ක්‍රමයේ ක්‍රියාත්මක භාවය සම්බන්ධයෙන් ස්ථිර විසඳුමකට එලඹෙන තෙක් 2012 වර්ෂයේදීද කිසිදු දායක කර ගැනීමක් නොකල අතර එබැවින් මේ සම්බන්ධයෙන් ක්‍රියාකාරි සැලැස්මක්ද සකස් නොකරන ලදි.

**(ආ)** විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ පැවැත්ම සම්බන්ධයෙන් මෙතෙක් කිසිදු ස්ථිර තීරණයකට එළඹී නොමැති බැවින් දායකවූවන් ගෙන් දෙවන හා පසු වාරික අය කිරිම සිදු කර ඇත.

**(ඇ)** නව බඳවා ගැනීම් තුලින් යෝජනා ක්‍රමයේ වගකීම තව දුරටත් වැඩි වන බැවින් ප්‍රවර්තන වර්ෂය තුල බඳවා ගැනීම් සිදු නොකරන ලදි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

වසර 20 කට වඩා පැරණි මෙම උපලබ්දි නොවූ චෙක්පත් ගිණුම් වලින් ලියා හැරීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.

## 4.4 ප්‍රමාද ව්‍යාපෘති

**(අ) , (ආ)**

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල 26 ක් ක්‍රියාත්මක වේ.වර්තමානය වන විට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායකයින් 950,000 /- ක් දායක වී ඇත.වසර 22 ක් පුරා පරිගණක ගත කිරීමේ කාර්යය සිදු කර ගෙන යාමේදී විවිධ අවස්ථා වල පැවති තාක්ෂණික පිරිවිතරයන්ට අනුව පරිගණක යන්ත්‍ර හා මෘදුකාංග මිලදී ගෙන අවශ්‍යතාවය අනුව යොදවා ගනු ලැබුවද ධාරිතාවය වැඩිවීම හේතුවෙන් හා අවශ්‍යතා මට්ටම වෙනස් වීම හේතුවෙන් නව තාක්ෂණයට ගැලපෙන අයුරින් තොරතුරු යාවත්කාලින කර ගැනීමේ අවශ්‍යතාවය ඇතිවූ නිසා මෙම වියදම දැරීමට සිදුවී ඇත. වර්තමානය වන විට කොළඹ විශ්ව විද්‍යාලය සමග එක්වී වැඩි ධාරිතාවයකින් යුතු පරිගණක පද්ධතියක් ස්ථාපනය කොට ධාරිතාවයට සරිලන මෘදුකාංග ද නිර්මාණය කර ඇත.එම පරිගණක මෘදුකාංග පද්ධතියෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා අවශ්‍ය දත්තයන් පද්ධතියට ඇතුලත් කරමින් පවතින අතර දායකත්වය පිළිබඳ සියලුම තොරතුරු ලබාගත හැකි තත්වයට අවසන් කර ඇත. වසර 22 ක් පුරා ක්‍රියාත්මක වූ යෝජනා ක්‍රමයේ 950,000 ට අධික දායකයින් බැඳී ඇති අවස්ථාවක වසරකට දෙවරක් බැගින් වාරික මුදල ගෙවනු ලැබ ඇති විට පසු වාරික මිලියන ගණනාවක් (□□ □□ □□□□□□□) පරිගණක ගත කිරීමේ ගැටලුව පමණක් පැන නැගී ඇත.

## 5. පද්ධති සහ පාලනය

පරිගණක පද්ධතිය,මූල්‍ය කළමනාකරණය,විශ්‍රාම වැටුප් ගෙවීම හා නොගෙවූ විශ්‍රාම වැටුප් යන පද්ධතියන්හි මනා පාලනයක් ඇති කිරිමට අවශ්‍ය කටයුතු කිරිමට අපේක්ෂිතය.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

විදුලි පණිවිඩ / தந்தி / Telegrams: රක්ෂණ / ரக்ஷன / Rakshana

117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ
117, Subadrarama Rd., Gangodavila, Nugegoda

cc

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No.: 2012/4/5/මු/ධී/2

ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No.:

දිනය / திகதி / Date: 2013.09.02

විගණන අධිකාරි,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

**2012 වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14 (2) (C) වාර්තාව සඳහා පිළිතුරු සැපයීම.**

2012 වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14 (2) (C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

..........................
අධ්‍යක්ෂ ජනරාල් /වැ.බ.
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

| | සභාපති / தலைவர் | අධ්‍යක්ෂ ජනරාල් | ප්‍රධාන කාර්යාලය / தலைமையகம் |
|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephones | 011-2812571 | 011-5732397 | 011-5384000 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 011-2812572 | 011-2812574 | |
| | 011-2812573 | | |



Back

**<u>ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්ථාව සඳහා පිළිතුරු</u>**

**2. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**2.1 <u>මතය</u>**

**2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

**2.2.1 <u>යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම</u>**

**2.2.2 <u>ගිණුම්කරණ ප්‍රමිති හා නොඑකඟතාවයන්</u>**

**(අ)** නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මුහුණත ඉදිරිපත් කිරීම් සිදු කරනු ලැබුව ද ප්‍රථම වරට ඉදිරිපත් කිරීමේදී සිදුකල යුතු. Reclassification සහ Remeasurement සිදු නොකරන ලදී. ඉදිරි ගිණුම් වර්ෂයේදී මණ්ඩලයේ වත්කම් හා වගකීම් නැවත වර්ගීකරණය (Reclassification) සහ නැවත ගණනය (Remeasurement) කිරීමට අපේක්ෂිතය.

**(ආ)** ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සතුව දිගු කාලීන ආයෝජන කිසිවක් නොපවතින අතර සියළු ආයෝජනයන් කෙටිකාලීන වේ. එබැවින් එම ආයෝජනයන් වෙලඳපොල වටිනාකම හා පොත් වටිනාකම අතර වෙනසක් නොමැත.

**(ඇ)** ඉදිරියේදී අවශ්‍ය හෙළිදරව්ව කිරීමට අපේක්ෂිතය.

**(ඈ)** පාරිතෝෂික වගකීම ගණනය කිරීමේදී ජීවගණන තක්සේරුවක් සිදුනොකලද සත්‍ය වැටුප පදනම් කොටගෙන එම වගකීම ගණනය කර ඇත.මෙම වගකීම සඳහා වෙනම ආයෝජන පවත්වා ගෙන නොගියද මණ්ඩලයේ අනෙකුත් ආයෝජන තුල මෙම ආයෝජනයන් අන්තර්ගතව ඇත.

**(ඉ)** 2007 වර්ෂයේ ජීව ගණන වාර්තාව පදනම් කර ගනිමින් 2012 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් වගකීම ගණනය කර ඇත.

**2.2.3 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

**(අ)** ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වාර්ෂිකව රු.මි.1,500,000 මුදලක් ධීවර අමාත්‍යාංශයෙන් ලබා දුන්න ද එම මුදල අනිවාර්යෙන්ම මණ්ඩලය වෙත ලබා දිය යුතු බවට කිසිදු ගිවිසුමක් මණ්ඩලය හා ධීවර අමාත්‍යාංශය අතර නොමැත.මේ වන විට විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මඟින් සිදුකරමින් පවතින බැවින් මෙම මුදල් මණ්ඩලය වෙත ලබා ගැනීමට නොහැකිවී ඇත.

**(ආ)** විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීමේදී එම ගෙවීම් කිරීම වෙනුවෙන් දැරීමට සිදුවන ඍජු වියදමක් වන කොමිස් මුදලද විශ්‍රාම වැටුප් ගෙවීමට අදාල වියදමක් සේ සලකා කටයුතු කර ඇත. විශ්‍රාම වැටුප් වගකීම වන රු. මිලියන 2,149 හා සැසඳීමේදී මෙම ඍජු වගකීම ගැලපීමෙන් මුළු වගකීමට ප්‍රමාණාත්මක බලපෑමක් සිදු නොවේ.

(ඇ) 1991 වර්ෂයේදී ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ වගකීම මණ්ඩලය වෙත පැවරීමෙන් අනතුරුව ඒ සඳහා විශේෂ කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන නොමැත.

නිළධාරීන් 6 දෙනෙකු මෙම අංශයේ රාජකාරී වෙනුවෙන් වෙන්කර ඇති අතර ඒකාකාරී පදනමක් යටතේ ඔවුන්ගේ වැටුප හා පාරිතෝෂිත එම අංශයට අන්තර්ග්‍රහනය කරනු ලැබේ.මණ්ඩලයේ සේවක හිඟය නිසා තාවකාලිකව වෙනත් රාජකාරි සඳහා එම සේවකයන් යොදා ගනු ලැබුව ද ඔවුන් ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අයත් සේවකයන් ලෙස සැලකීමට කටයුතු කර ඇත.

### 2.2.4 <u>පැහැදිලි නොකල වෙනස්කම්</u>

ගිණුම් ප්‍රකාශන මඟින් ඉදිරිපත් කරන ලද තොරතුරු නිවැරදි වේ.

### 2.2.5 <u>ලැබිය යුතු සහ ගෙවිය යුතු වියදම්</u>

(අ) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය තුල ඇති වූ මූල්‍ය අර්බුදය පිළිබඳව මහා භාණ්ඩාගාරයේ පැවති සාකච්ඡාවේදී තීරණය වූ පරිදි ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත මෙම මුදල් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය වෙත ලබා දී ඇත. ඉදිරියේ දී සිදු කිරීමට අපේක්ෂිත ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කිරීමට අපේක්ෂිත ය.

(ආ) විගණන ගාස්තු සඳහා ඉදිරිපත් කරන ලද මුදල මණ්ඩලයේ වර්තමාන මූල්‍ය තත්වය සැලකිල්ලට ගෙන අඩු කරන ලෙස විගණකාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කර ඇත. ඉදිරියේදී විගණකාධිපතිවරයා ලබා දෙන තීරණයට අනුව විගණන ගාස්තු ගෙවීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) ධීවර විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා තැපැල් කාර්යාල වලට යැවීමෙන් පසු ලබා නොගත් විශ්‍රාම වැටුප් ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කරනු නොබලන අතර විශේෂ හේතුවක් මත නැවත ගෙවීමට සිදුවුවහොත් ගෙවීම් සිදුකරන වර්ෂයේ වියදමක් ලෙස සලකනු ලැබේ.

### 2.2.6 <u>නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට අනුකූල නොවීම</u>

(අ) **(i)** ධීවර උපදේශක කාරක සභා සාමාජිකයින්ගේ නිළ කාලය අවසන් වීමෙන් පසු ඒ සඳහා නැවත සාමාජිකයින් පත්කිරීම සඳහා මුදල් අමාත්‍යංශයේ ලේකම් මගින් අදාල ආයතන වෙත දැනුම්දී ඇත.

සාමාජිකයින්ගේ නිළ කාලය අවසන්වීමෙන් පසු ඒ බව සාමාජිකයන්ට දැනුම්දී ඇති අතර, නැවත සාමාජිකයින් පත් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ගද ගෙන ඇත.

**(ii)** ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බඳවා ගැනීම හා පසු වාරික අයකිරීම සිදු කරනු ලබන්නේ ධීවර දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසිනි. දායකත්වය අවලංගු වූ දායකයින් පිළිබඳ වාර්තාවක් මේ වන විට ධීවර අමාත්‍යංශය වෙත ඉදිරිපත් කර ඇත.දායකත්වය අවලංගු වූ දායකයින්ගෙන් විශාල සංඛ්‍යාවක් සුනාමියෙන් අතුරුදහන් දායකයින් වන අතර මේ සම්බන්ධව ධීවර අමාත්‍යංශය ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත

(ආ) **(i)** කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල පනතට අනුව සේවය කරන මණ්ඩලීය නිළධාරීන් වෙත ධීවර අමාත්‍යංශයට අයත් ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අතිරේක වැඩ කොටසක් පැවරී ඇත. ඒ අනුව ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ මෙම මණ්ඩලීය කාර්යභාරය වෙනුවෙන් වෙනමම

කාර්යමණ්ඩලයක් අනුමත නොවීම හේතුවෙන් මෙම වැඩ ආවරණය කිරීම වෙනුවෙන් මෙම දීමනා ගෙවනු ලැබේ. එය 1991 වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප ආරම්භ කල දිනයේ සිට ගෙවා ඇත.

මෙම ගෙවීම් සඳහා පහත සඳහන් අනුමැතීන් ලැබී ඇත.

- ධීවර විශ්‍රාම වැටුප් උපදේශන කාරක සභා අනුමැතිය.
- අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය.
- විෂයභාර අමාත්‍ය රාජ්‍ය ලේකම්ගේ අනුමැතිය.

### 2.2.7 මතභේදයට තුඩු දෙන ගණුදෙනු

ධීවර විශ්‍රාම වැටුප් අරමුදල් ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා යෙදූ මුදල එම යෝජනා ක්‍රමයට ලබා දුන් ණය මුදලක් ලෙස සලකා කටයුතු කළ බැවින් එම පොළී ගැලපීම් සිදු කර ඇත. සියළුම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා මේ වනවිට කටයුතු කර ගෙන යන බැවින් ඉදිරියේ දී ලැබිය යුතු ණය හා පොළී මුදල් පිළිබඳව තීරණයක් ගැනීමට නියමිතය.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

### 3.2 මූල්‍ය තත්වය පිළිබඳ විශ්‍රහාත්මක සමාලෝචන

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

**(අ),(ආ),(ඇ),(ඈ),(ඉ)**

මෙම යෝජනා ක්‍රමය ධීවර අමාත්‍යාංශය හා ධීවර දෙපාර්තමේන්තුව ඒකාබද්ධව ක්‍රියාත්මක කරන අතර කෘෂිරක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය වන්නේ යෝජනාක්‍රමය පරිපාලනය හා ගිණුම් තබා ගැනීම වේ. කාර්යසාධනය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන්නේ ධීවර දෙපාරේතමේන්තුව විසිනි.

### 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

යෝජනා ක්‍රමයේ අවලංගුවූ දායකයින් පිළිබඳ තොරතුරු ධීවර අමාත්‍යාංශය වෙත යොමුකොට ඇති අතර ඔවුන්ගේ හිඟ වාරික අයකිරිම හා දායකත්වයේ රඳවා තැබීම සම්බන්ධයෙන්ද ධීවර අමාත්‍යාංශය සමග ඒකාබද්ධව ඉදිරියේදි කටයුතු කිරිමට අවශ්‍ය පියවර ගෙන ඇත.

## 5. පද්ධති සහ පාලනය

යෝජනා ක්‍රමයේ අරමුණු ඉටු කර ගැනිම,ධීවරයින් සඳහා ප්‍රතිලාභ ලබා දීම, ලැබිය යුතු මුදල්, පසු වාරික මුදල් අය කර ගැනීම, උපදේශක කාරක සභා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම යන කරුණු කෙරෙහි මේ වන විට දැඩි අවධානය යොමු කර ඇති අතර ඉදිරියේදී තව දුරටත් විශේෂ අවධානය යොමු කිරීමට අපේක්ෂිතය.